වාර්ෂික වාර්තාව
2022



The art of tea...
It's Ceylon tea...

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2022

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තැපැල් ලිපිනය : **ශ්‍රී ලංකා තේ මණ්ඩලය**, 574, **ගාලු පාර**, **කොළඹ** 03, **ශ්‍රී ලංකාව**.
දුරකථන අංකය : +94-11-2587814/ 2582121/ 2583687
ෆැක්ස් : +94 112587341/ 2589132
විද්‍යුත් තැපෑල : teaboard@pureceylontea.com
වෙබ් අඩවිය : www.srilankateaboard.lk
www.pureceylontea.com

පටුන

දැක්ම හා මෙහෙවර - 03
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයන් - 04
විගණන කමිටුවේ සාමාජිකයන් හා නිරීක්ෂකයන් - 05
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලය - 05
ප්‍රවර්ධන හා අළෙවිකරණ කමිටුවේ සාමාජිකයන් - 06
සභාපතිතුමාගේ පණිවිඩය - 07
මූලික දත්ත - 09
සංස්ථාපිත පසුබිම - 10
ව්‍යුහය හා සිදුකළ ක්‍රියාකාරකම් - 11
තේ කොමසාරිස් අංශය - 12
තේ අපනයන ඒකකය - 20
තේ ප්‍රවර්ධන අංශය - 23
තේ රසබැලිමේ ඒකකය - 42
විශ්ලේෂණ විද්‍යාගාරය - 44
පරිපාලන අංශය - 45
අභ්‍යන්තර විගණන අංශය - 46
තොරතුරු තාක්ෂණ අංශය - 46
කර්මාන්ත පැතිකඩ - 47
නිරසාර සංවර්ධන ඉලක්ක වෙත යොමු වීම - 60
මූල්‍ය සමාලෝචනය - 62
විගණකාධිපතිතුමාගේ වාර්තාව - 94
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල - 105

දැක්ම

ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය තේ
"වඩාත් ආකර්ෂණීය පානය"
බවට පත් කිරීම

මෙහෙවර

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මඟින් රටට ලැබෙන
විදේශ විනිමය ඉපැයීම් වැඩිකර ගැනීම සහ එමඟින් වැවිලි
කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය
සුරක්ෂිත කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයන් -2022

සභාපති

සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය
ජයම්පති මොල්ලිගොඩ මයා, *මැයි දක්වා*
නිරාජ් ද මෙල් මයා, *ජූලි සිට දෙසැම්බර් දක්වා*

සාමාජිකයන්

අතිරේක ලේකම් (සංවර්ධන), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
හර්ෂ ඉලුක්පිටිය මයා, *ජූලි දක්වා*
ඩබ්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මයා, *ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා*

අධ්‍යක්ෂ (වැ.බ), රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
කේ.ඒ.ඩබ්ලිව්. ප්‍රනාන්දු මිය, *ජනවාරි සිට පෙබරවාරි දක්වා*
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරී ආවරණ), මුදල් අමාත්‍යාංශය
එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා, *මැයි සිට ජූලි දක්වා*
අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
ඒ.පී.පී. ලියනගේ, *අගෝස්තු සිට දෙසැම්බර් දක්වා*

අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය
ඩී.ජී. වනාදන් මයා, *ජනවාරි සිට දෙසැම්බර් දක්වා*

ලේකම් ජනරාල්, ලංකා වැවිලි කරුවන්ගේ සංගමය
ලලින් ඔබේසේකර මයා, *සැප්තැම්බර් දක්වා*
සභාපති, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය
සේනක අලවත්තේගම, *ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා*

සභාපති, කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය
හිශාන්ත ද මෙල් මයා, *මාර්තු දක්වා*
යෙශාන් ප්‍රනාන්දු මයා, *ජූලි සිට දෙසැම්බර් දක්වා*

සභාපති, කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය
ජයන්ත කරුණාරත්න මයා, *සැප්තැම්බර් දක්වා*
සංජය හේරත් මයා, *සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා*

සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය
සංජය හේරත් මයා, *සැප්තැම්බර් දක්වා*
ගනේෂ් දෙවනායගම් මයා, *සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා*

සභාපති, ශ්‍රී ලංකා තේ කම්හල් හිමියන්ගේ සංගමය
ලයනල් හේරත් මයා, *ජනවාරි සිට දෙසැම්බර් දක්වා*

සභාපති, ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය
කේ.එල්. ගුණාරත්න, *ජනවාරි සිට දෙසැම්බර් දක්වා*

අමාත්‍යතුමාගේ නියෝජිත
ඩබ්ලිව්.එච්.එස්. සමරසේන, *ජනවාරි සිට දෙසැම්බර් දක්වා*

සභාපති, ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වෛද්‍ය තුෂාර ප්‍රියදර්ශන, *ජනවාරි සිට දෙසැම්බර් දක්වා*

නිරීක්ෂක

අනිල් අල්විස් මයා, *ජනවාරි සිට දෙසැම්බර් දක්වා*

ලේකම්

අධ්‍යක්ෂ ජනරාල්
එස්.ඒ. සිරිවර්ධන මයා

විගණන කමිටුවේ සාමාජිකයින් සහ නිරීක්ෂකයින් - 2022

සභාපති

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ), මුදල් අමාත්‍යාංශය
කේ.ඒ.ඩබ්ලිව්. ප්‍රනාන්දු මිය
ජනවාරි සිට මාර්තු දක්වා
අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය
ජේ.පී.පී. ලියනගේ මිය
අගෝස්තු සිට

සාමාජිකයන්

අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
හර්ෂ ඉලුක්පිටිය මයා
ජනවාරි සිට අගෝස්තු දක්වා
ඩබ්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මිය
ඔක්තෝබර් සිට
අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය
ඩී.පීවනාදන් මයා
සභාපති, කොළඹ තේ වෙළඳ සංගමය
ජයන්ත කරුණාරත්න මයා
ජූලි සිට සැප්තැම්බර් දක්වා
සංජය හේරත් මයා
සැප්තැම්බර් සිට
සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය
ගනේෂ් දෙවනායගම් මයා
සැප්තැම්බර් සිට

නිරීක්ෂකයන්

ප්‍රධාන අභ්‍යන්තර විගණක, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
කේ.ඒ.සී. ශ්‍රාමන්ත මයා
විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය
එච්.ඒ.ඩී. චාන්දනී මිය
ජනවාරි සිට ඔක්තෝබර්
විගණකාධිපති
වී.ඩී. සීතා මිය
නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා

කැඳවුම්කරු

අධ්‍යක්ෂ ජනරාල්
එස්.ඒ. සිරිවර්ධන මයා

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය - 2022

අධ්‍යක්ෂ ජනරාල් — එස්.ඒ. සිරිවර්ධන මයා

තේ කොමසාරිස් — ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මයා

අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) — එච්.එල්. පවිත්‍රී පීරිස් මෙනවිය

අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) — ආචාර්ය කේ.ආර්.ඩබ්. අබේවික්‍රම මයා

අධ්‍යක්ෂ (මුදල්) — පී.ඒ. හිරොෂ් ජයංග මයා

ප්‍රවර්ධන හා අලෙවි කමිටු සාමාජිකයන් 2022

සභාපති

සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය
ජයම්පති මොල්ලිගොඩ මයා, *(ජනවාරි - අප්‍රේල්)*
නිරාජ් ද මෙල් මයා, *(මැයි - දෙසැම්බර්)*

සාමාජිකයන්

අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය
එස්.ජ. සිරිවර්ධන මයා, *(ජනවාරි - දෙසැම්බර්)*

අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
හර්ෂ ඉලුක්පිටිය මයා, *(ජනවාරි -අගෝස්තු)*
ඩබ්ලිව්.එම්.ඩී.ටී. තරංගනි වික්‍රමසිංහ මිය, *(නොවැම්බර් - දෙසැම්බර්)*

නියෝජිත, තේ අපනයනකරුවන්ගේ සංගමය
මුෆද්දල් ජැෆර්ජි මයා, *(ජනවාරි - දෙසැම්බර්)*
අධ්‍යක්ෂ, අක්බාර් බ්‍රදර්ස්
ටියාබ් අක්බරලි මයා, *(ජනවාරි - දෙසැම්බර්)*

හිටපු සභාපති, කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය
සංජය හේරත් මයා, *(ජනවාරි - දෙසැම්බර්)*

අධ්‍යක්ෂ, එම්.ජේ.එෆ්. සමූහය
දිල්හාන් සී ප්‍රනාන්දු මයා, *(ජනවාරි - දෙසැම්බර්)*

ප්‍රධාන විධායක නිලධාරී, ඇමර්සන් වෙඩින් පුද්ගලික සමාගම
සුරංග හේරත් මයා, *(ජනවාරි -ජූලි)*
කළමනාකාර අධ්‍යක්ෂ, සන්ෂයින් හෝල්ඩින් පුද්ගලික සමාගම
විශ් ගෝවින්දසාමි මයා, *(ජනවාරි - දෙසැම්බර්)*

කළමනාකාර අධ්‍යක්ෂ, ලුම්බිණී තේ කම්හල
චමින්ද ජයවර්ධන මයා, *(ජනවාරි - දෙසැම්බර්)*

උපදේශක, යුනිලීවර් සිලෝන් ලිමිටඩ්
අවි.ද සිල්වා මයා *(නොවැම්බර් -දෙසැම්බර්)*

සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය
ගනේෂ් දෙවනායගම් මයා, *(නොවැම්බර් -දෙසැම්බර්)*

උපදේශක, ෆින්ලේයිස් පුද්ගලික සමාගම
රොමේෂ් මොරායස් මයා, *(නොවැම්බර් -දෙසැම්බර්)*

අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)
එච්.එල්. පවිත්‍රි පීරිස් මෙනවිය, *(ජනවාරි - දෙසැම්බර්)*

සභාපතිතුමාගේ පණිවිඩය



2021 වර්ෂයේ පැවති මිල ගණන්වල වර්තාගත වර්ධනයක් සහිතව තේ මිල ගණන් පිළිබඳ සුභවාදී අපේක්ෂාවන් රැසක් සහිතව 2022 වර්ෂය ආරම්භ විය. මාර්තු මැද දී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැළකිය යුතු ප්‍රමාණයකින් අව ප්‍රමාණය වීමත් සමග මිල ගණන් ඉහල යාම තව දුරටත් වර්ධනය වීමක් සිදුවිය. ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වූ ප්‍රමාණයටත් වඩා තේ මිල ගණන් ඉහල යාම සිදු විය. මිල ගණන් මාසයෙන් මාසය අබණ්ඩව ඉහළ ගිය අතර සැප්තැම්බර් මාසයේ දී තේ මිලෙහි ඉහළම අගය වාර්තා වුණි. එතැන් සිට ඉහළ මිල මට්ටම් වසර අවසානය දක්වාම පැවතුණි. මෙම සංවර්ධනයේ සෘජු ප්‍රතිඵලයක් වශයෙන් කුඩා තේ වතු හිමියන් විසින් විශේෂයෙන් වසරේ දෙවන භාගයේ වාර්තාගත ඉපැයීම් අත් කර ගන්නා ලදී. 2021 වර්ෂයේ දී තේ දළු කිලෝවකට ලබා ගත් රු.80 සිට රු.90 දක්වා වූ මුදලට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ සිට තේ වගාකරුවන් තේ දළු කිලෝවක් සඳහා රු. 250ක ආදායමක් ලබමින් සිටි. 2022 වර්ෂය ශ්‍රී ලංකාවේ තේ කර්මාන්ත ඉතිහාසයේ පෙර නොවූ විරූ මිල ගණන් සියලුම උස් මට්ටම් වල වාර්තා කළ වසරක් ලෙස සටහන් වන අතර, එය තේ නිෂ්පාදනය හා අපනයනය සම්බන්ධයෙන් පසුබෑමකට ලක් වූ වසරක් ද විය.

තේ නිෂ්පාදනය

සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික නිෂ්පාදනය 2021 ට සාපේක්ෂව 16% ක අඩුවීමක් වාර්තා කළේය. 2022 දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 251.5ක ජාතික නිෂ්පාදනය පෙර වසරට වඩා කිලෝග්‍රෑම් මිලියන 48 කින් පහත වැටුණා පමණක් නොව, එය 1995 වසරේ දී නිෂ්පාදනය කරන ලද කිලෝග්‍රෑම් මිලියන 246 ක් වූ අගයට සාපේක්ෂව වසර 26 කින් වාර්තා වූ අඩුම අගය විය. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික තේ නිෂ්පාදනය සමස්ථ නිෂ්පාදන පරිමාවෙන් 90% ක් වූ අතර CTC තේ නිෂ්පාදනය 9% ක් විය.

තේ අපනයනය

2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ තේ අපනයන ආදායම රුපියල් බිලියන 411 කි. ඇමරිකානු ඩොලර් වලින් ගත් කල, 2021 දී ඩොලර් බිලියන 1.26 ක ආදායමක් රටට ලැබී ඇති අතර එය 2021 දී වාර්තා වූ ඩොලර් බිලියන 1.32ට සාපේක්ෂව ඩොලර් මිලියන 65.7ක පහත වැටීමකි. මුළු අපනයන ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 250.2 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 12.5%ක අඩුවීමකි. 2021 වර්ෂයේ පටන් විශාල තොග ප්‍රමාණයක් පවත්වා ගෙන යාම හේතුවෙන් නිෂ්පාදනයේ පහත වැටීමේ ප්‍රමාණයටම අපනයන පහත වැටීමක් සිදු නොවුණි.

වසර තුළ පවතින අඩු සැපයුම් තත්ත්වය සැලකිල්ලට ගනිමින්, වාර්ෂික FOB ඒකක මිල 2021 වසරේ පැවති ඇමරිකානු ඩොලර් 4.63 ට සාපේක්ෂව කිලෝග්‍රෑමයකට ඇමරිකානු ඩොලර් 5.03 ක ඉහළ අගයක් වාර්තා කළේය. ඉහළ මිලක් ගෙවීම මගින් ශ්‍රී ලංකා තේ සඳහා ආනයනය කරන රටවල ඉහළ ඉල්ලුමක් පවතින බව සනාථ වේ. 2022 වසර තුළ සිදු කළ අපනයන ප්‍රමාණය වසර 25කට පසු වාර්තා වූ අඩුම අගය විය. ශ්‍රී ලංකාව මෙතෙක් අපනයනය කළ ඉහළම ප්‍රමාණය වන්නේ 2014 වසරේ දී සිදු කළ කිලෝග්‍රෑම් මිලියන 327ක ප්‍රමාණයයි.

පොහොර අර්බුදය, ඇතැම් කෘෂිකාර්මික යෙදවුම් නොමැතිකම සහ ජුනි සිට අගෝස්තු මාසය දක්වා ඇති වූ ප්‍රවාහන බාධාවන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ පසුබැම් ගණනාවක් අත්විඳීමට සිදු විය. තේ කර්මාන්තයේ සුමට ක්‍රියාකාරිත්වය; විශේෂයෙන්ම නිෂ්පාදකයින්ගේ ක්‍රියාකාරිත්වය, බලපෑමට ලක් වූ අතර එය තේ නිෂ්පාදනය සහ අපනයනය පහත වැටීමට දැඩි ලෙස හේතු විය. කෙසේ වෙතත්, තේ අපනයන ආදායම පෙර වසරට වඩා පහත වැටී ඇත්තේ සුළු අගයකින් වීම සතුටට කරුණකි.

ගෝලීය සන්දර්භය තුළ සිලෝන් තේ හි කාර්ය සාධනය

ලෝකයේ සමස්ත තේ නිෂ්පාදනයෙන් ශ්‍රී ලංකාවේ කොටස 5%කට වඩා අඩුය. කෙසේ වෙතත්, ලෝකයේ ප්‍රමුඛතම නිෂ්පාදන රටවල් දෙක වන චීනය සහ ඉන්දියාව අධික අභ්‍යන්තර පරිභෝජනය හේතුවෙන් ඔවුන්ගේ නිෂ්පාදනයෙන් ආසන්න වශයෙන් 75%-80%ක ප්‍රමාණයක් රඳවා තබා ගනී. සැපයුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකාව ගෝලීය අපනයනවලින් 15% ක කොටසක් පවත්වාගෙන යයි. අප්‍රිකානු රටවල සැමදා වර්ධනය වන තේ නිෂ්පාදනය ශ්‍රී ලංකාවට බරපතළ තර්ජනයකි.

වසර ගණනාවක් පුරාවට සිලෝන් තේ අත්කර ගන්නා ලද කීර්ති නාමය හේතුවෙන්, ඉතා තරගකාරී ජාත්‍යන්තර තේ වෙළඳපොල තුළ ශ්‍රී ලංකාව වැදගත් ස්ථානයක් හිමිකරගනී.

සංවර්ධන කටයුතු

කර්මාන්තයේ දුර්වල කාර්ය සාධනය සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන මට්ටම් පහත වැටීම වැළැක්වීම සඳහා පියවර ගන්නා ලදී. කුඩා තේ වතු හිමියන්ගේ සංවර්ධන අධිකාරියේ "සහකම්පනය" වැඩසටහනට සමගාමීව "B60" වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීම තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීමට පමණක් නොව, දැනට මසකට වාර දෙකේ සිට හතර දක්වා නෙලීමේ වාර ගණන වැඩි කිරීම සඳහා වූ එක් උපාය මාර්ගයකි. ඉහත සඳහන් කරන ලද ගැටළු හේතුවෙන් මූලික ප්‍රතිචාරය විවිධාකාර එකක් වුවද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය මධ්‍ය කාලීනව තේ වල ගුණය හා ප්‍රමාණය යන දෙඅංශයෙන්ම වර්ධනයක් අපේක්ෂා කරයි. මෙම මූලපිරීමට අමතරව 2021 දී ආරම්භ කරන ලද තේ තවාන් වැඩසටහන අබණ්ඩව ක්‍රියාත්මක කිරීම මඟින් ක්‍රමානුකූලව නැවත වගා කිරීමේ සහ පාළු සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් තේ පැල පවතින බවට සහතික කරනු ලබයි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සැලසුම් සහ ක්‍රමෝපායන් මෙන්ම කොළඹ තේ වෙළඳ සංගමයේ 2030 ලංකා තේ මාර්ග සිතියම (CTRM 2030) යන දෙකම මඟින් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවධානය යොමු කර ඇති අතර, එසේ නොමැතිව ගෝලීය තේ වෙළෙඳපොළ තුළ වැඩි වශයෙන් ඉල්ලුමක් පවතින සිලෝන් තේ සන්නාමයක් ලෙස පවත්වා ගැනීමට නොහැකි වනු ඇත.

ප්‍රවර්ධන සහ අලෙවිකරණ උපාය මාර්ගය

රට මුහුණ පා ඇති විදේශ විනිමය අර්බුදය හමුවේ ප්‍රවර්ධන වැඩසටහන් මඟින් උපරිම අපේක්ෂාවෙන් ඉටු කර ගැනීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය රුසියාව හැර අනෙකුත් රටවල වෙළෙඳ ප්‍රදර්ශනවලට සහභාගි වීම අත්හිටුවා ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සපයනු ලබන 50% දිරි දීමනා සමඟ තෝරාගත් වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා තේ සමාගම්වලට සහභාගි වීමට පහසුකම් සලසමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ අපනයනකරුවන්ට අබණ්ඩව සහය ලබා දෙන ලදී. මෙයට අමතරව, වෙළෙඳපොළෙහි වර්ධනයක් පෙන්නුම් කර ඇති තේ අපනයන සමාගම් දිරිමත් කිරීමද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදු කරන ලදී. 2023 වර්ෂයේ දී තෝරාගත් ගෝලීය වෙළඳපල තුළ සිලෝන් තේ භාවිතය වර්ධනය කිරීම හෝ තිරසාර කිරීමේ අරමුණින් ප්‍රවර්ධන වැඩසටහන් නැවත ආරම්භ කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලාංකේය පුද්ගලික සන්නාම සඳහා මූල්‍යාධාර ලබා දෙමින් සන්නාම ප්‍රවර්ධන වැඩසටහනේ 3 වන අදියර ක්‍රියාත්මක කරන ලද අතර 2022 වසර සඳහා රුපියල් බිලියන 1ක අයවැයක් වෙන් කරන ලදී. ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ (NIPO) ලියාපදිංචි වී ඇති, ශ්‍රී ලංකා සමාගම් සතු සිංහ ලාංඡනය සහිත තේ සන්නාමය ප්‍රවර්ධනය සඳහා වැය වූ පිරිවැයෙන් 50%ක ගැලපුම් දීමනාවක් මෙම වැඩසටහන මඟින් ලබා දේ. මෙම වැඩසටහන යටතේ 2022 වසර තුළ ව්‍යාපෘති 80ක් ප්‍රතිලාභ ලබා ඇති අතර රටවල් 45ක් ආවරණය කර ඇත.

තුති පිදුම

සිලෝන් තේ නාමය ඉහලින් ඔසවා තැබීම උදෙසා අසිරු වාතාවරණයන් තුළ සාමුහිකව තම සහය ලබා දුන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන්ට ප්‍රශංසා පුද කොට අගය කරමි. තවද, වසර පුරාවට වෙහෙසී කටයුතු කළ ප්‍රාදේශීය කාර්යාල සම්බන්ධ නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සියලුම දෙපාර්තමේන්තු වල නිලධාරීන්ට සහ සහායක කාර්ය මණ්ඩලයට මාගේ සතුතිය පුදකර සිටිමි.

නිරාජ් ද මෙල්
සභාපති
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

මූලික දත්ත

වර්ගය	ඒකකය	2020	2021	2022	වෙනස (%) 2021සහ 2022
තේ නිෂ්පාදනය					
සමස්ථ තේ නිෂ්පාදනය	කි.ග්‍රෑම් මිලියන	278.85	299.49	251.50	(16.02)
උන්නතාංශය අනුව වර්ගීකරණය					
උඩරට	කි.ග්‍රෑම් මිලියන	62.24	65.33	56.30	(13.82)
මැදරට	කි.ග්‍රෑම් මිලියන	46.73	50.99	40.20	(21.16)
පහතරට	කි.ග්‍රෑම් මිලියන	169.88	183.18	155.00	(15.38)
සැකසුම් ක්‍රමය අනුව වර්ගීකරණය					
සාම්ප්‍රදායික (ඉපෙව, ඇතුළුව)	කි.ග්‍රෑම් මිලියන	252.72	270.72	227.10	(16.11)
සී.ටී.සී. තේ	කි.ග්‍රෑම් මිලියන	24.10	26.19	22.60	(13.71)
හරිත තේ	කි.ග්‍රෑම් මිලියන	2.03	2.57	1.80	(29.96)
ඉහත නිෂ්පාදන දත්ත ක්ෂණික තේ හැර දක්වා තිබේ					
ක්ෂණික තේ නිෂ්පාදනය	කි.ග්‍රෑම් මිලියන	3.06	3.64	4.47	22.95
තේ අලෙවිය (රාජ්‍ය, සෘජු, පෞද්ගලික අංශ ඇතුළුව)					
සමස්ථ තේ අලෙවිය	කි.ග්‍රෑම් මිලියන	268.24	295.79	248.64	(15.94)
උඩරට	කි.ග්‍රෑම් මිලියන	56.46	63.52	53.72	(15.43)
මැදරට	කි.ග්‍රෑම් මිලියන	48.05	52.34	42.08	(19.60)
පහතරට	කි.ග්‍රෑම් මිලියන	163.72	179.94	152.84	(15.06)
සමස්ථ තේ අලෙවි මිල	රු/කි.ග්‍රෑම්	628.21	615.44	1,234.24	100.55
උඩරට	රු/කි.ග්‍රෑම්	580.90	587.13	1,093.10	86.18
මැදරට	රු/කි.ග්‍රෑම්	553.94	550.80	1,030.82	87.15
පහතරට	රු/කි.ග්‍රෑම්	666.32	644.23	1,339.86	107.98
තේ අපනයන					
තේ අපනයන ප්‍රමාණය (ප්‍රති අපනයන හැර)	කි.ග්‍රෑම් මිලියන	256.58	276.00	241.65	(12.45)
වර්ගය අනුව					
කළු තේ	කි.ග්‍රෑම් මිලියන	251.78	270.76	236.77	(12.55)
හරිත තේ	කි.ග්‍රෑම් මිලියන	1.99	2.27	1.85	(18.41)
ක්ෂණික තේ	කි.ග්‍රෑම් මිලියන	2.81	2.97	3.02	1.81
තේ අපනයනය - වටිනාකම (ප්‍රති අපනයන හැර)	රු. බිලියන	218.80	249.10	389.50	56.36
වර්ගය අනුව අපනයන අදායම					
කළු තේ	රු. බිලියන	210.62	238.86	374.22	56.67
හරිත තේ	රු. බිලියන	4.11	5.07	7.25	42.97
ක්ෂණික තේ	රු. බිලියන	4.07	5.16	8.04	55.76
සමස්ත තේ අපනයන ප්‍රමාණය	කි.ග්‍රෑම් මිලියන	265.57	285.87	250.17	(12.49)
සමස්ත තේ අපනයන වටිනාකම	රු. බිලියන	230.17	263.35	411.05	56.09

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ශ්‍රී ලංකා රේගුව

1. ආයතනයේ පසුබිම

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29, 2006 අංක 44 සහ 2018 අංක 13 දරණ පනත් මගින් සංශෝධිත 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ තේ පාලන දෙපාර්තමේන්තුව - 1957 අංක 51 දරණ තේ පාලන පනත, තේ අපනයන කොමසාරිස් දෙපාර්තමේන්තුව 1959 අංක 16 දරණ තේ (බදු සහ අපනයන පාලන) පනත, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය- 1925 තේ පර්යේෂණ ආඥාපනත සහ ශ්‍රී ලංකා තේ ප්‍රචාරණ මණ්ඩලය ඒකාබද්ධ කරමින් 1976 ජනවාරි පළමු වන දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවන ලදී. 1993 දී ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, 1993 අංක 52 දරණ තේ පර්යේෂණ පනතේ කළමනාකරණය යටතට පත්විය. ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා වර්තමාන නීති හා රෙගුලාසි හැඩගස්වා ගැනීමේ අවශ්‍යතාවයන් මත පදනම්ව ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි හා තේ පාලන පනතෙහි සංශෝධනයන් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවීමට පෙර, ගෝලීය සන්දර්භය තුළ පුද්ගලික අංශය විසින් සිදු කරන ලද ශ්‍රී ලංකා තේ (සිලෝන් තේ) ප්‍රවර්ධනය කිරීමේ කාර්යය තේ ප්‍රචාරක මණ්ඩලය විසින් මෙහෙයවන ලදී. 1976 දී, තේ ප්‍රචාරක මණ්ඩලය පාර්ලිමේන්තුව මගින් අහෝසි කරන ලද අතර තේ ප්‍රචාරක මණ්ඩලය තේ කර්මාන්තයට ඇති බලතල සහිතව ශ්‍රී ලංකා තේ මණ්ඩලය බවට පරිවර්තනය කරන ලදී.

නියාමන ආයතනය ලෙස තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වේ. එනම්, නිෂ්පාදනය, වගා කිරීම වැඩි දියුණු කිරීම, නැවත සිටුවීම, පැරණී වතු පුනරුත්ථාපනය කිරීම, කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම ආදියයි. එයට අමතරව, තේ වතු කළමනාකරණයෙහි සහ දේශීය හා විදේශීය තේ නිෂ්පාදනයෙහි හා අලෙවිකරණයෙහි නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන පාලනය කිරීම මෙන්ම මෙහෙයවීම මෙමගින් සිදු කෙරේ. සිලෝන් තේවල ගුණාත්මකභාවය, පවත්වා ගැනීම සඳහා කර්මාන්තශාලාවේ සිට බෙදා හැරීමේ අවස්ථාව දක්වා වූ සමස්ත ක්‍රියාවලියම අධීක්ෂණය කර ඇගයීමට ලක් කර ඇති අතර විකුණුම්, පුර්ව බෙදාහැරීම, තැරැව්කරුවන්ගේ ගබඩාවන්, මිශ්‍ර කරන්නන්, අපනයනකරුවන් සහ මිශ්‍රණය සහ ගබඩා කිරීම සනිපාරක්ෂකව කිරීම පිළිබඳ උපදේශන සේවා සැපයීම යන අවස්ථාවන්හි තේවල ගුණාත්මක ප්‍රමිතීන් අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියා මාර්ග රාශියක් ආරම්භ කර තිබේ.

සංවර්ධන කාර්යයන් යටතේ, වගාකරුවාගේ සිට අපනයනකරුවන් දක්වා අගය දාමයේ සියලුම ස්ථාන ආවරණය වන පරිදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහනාධාර , දැනුවත් කිරීමේ වැඩසටහන් සහ උපදේශන වැඩසටහන් සඳහා පහසුකම් සපයයි. සහනාධාර, තේ වගාකරුවන්, කර්මාන්තශාලා සහ පෙව පොහොර නිෂ්පාදකයින් සඳහා දැනුවත් කිරීම් වලට අමතරව තේ ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීමට, අමු තේ සහ තේවල ගුණාත්මක බව ඉහළ නැංවීමට සහ අවසානයේ තේ කෝප්පයකට / කිලෝවකට වඩා හොඳ මිලක් ලබාගැනීම සඳහා සංවර්ධන වැඩසටහන් රැසක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2021 සිට ක්‍රියාත්මක කෙරේ.

සංවේදී හා රසායනික නියැදි විශ්ලේෂණ මගින් වෙන්දේසිට පෙර සහ පසු තේ සාම්පල ඇගයීමට ලක් කිරීම තේ රස බැලීමේ ඒකකය මගින් සිදු කෙරේ. නියාමන සහ සංවර්ධන කාර්යයන් හරහා ලැබෙන තේ සාම්පල සඳහා තත්ව සහතික නිකුත් කිරීම සහ කර්මාන්ත පාර්ශවකරුවන් ආවරණය කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරනු ලබයි.

ගෝලීය වශයෙන් උපාය මාර්ගික ප්‍රවේශයන් ඔස්සේ සිලෝන් තේ සම්බන්ධ අලෙවිකරණ හා ප්‍රවර්ධනය කටයුතු ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මගින් සිදු කරනු ලබයි. ලොව පුරා පවතින අස්ථාවර ආර්ථික තත්වය සහ පාරිභෝගිකයින්ගේ පරිභෝජන රටාවන් සහ මිලදී ගැනීමේ හැකියාවන් වෙනස් කරමින්, තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ විදේශ විනිමය ඉපැයීම් සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සිලෝන් තේවල ස්ථාවරබව ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රයත්න දරනු ලබයි.

කර්මාන්තයේ ප්‍රමුඛතම ආයතනය ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ නිෂ්පාදනය, අලෙවිකරණය, අපනයන, තේ සම්බන්ධ ගෝලීය තත්වයන් සහ ඉදිරි වසර සඳහා ඉලක්ක සම්බන්ධ සංඛ්‍යාලේඛන සපයයි.

තේ කර්මාන්තයට අදාළ තීරණ සහ ක්‍රියාත්මක කිරීම් අවසාන වශයෙන් අනුමත කරනු ලබන්නේ පාර්ශවකරුවන් සහ රේඛීය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය ඇතුලු බලධාරීන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම හා ඒ සඳහා උපදෙස් ලබා දීම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සිදු කරනු ලැබේ. මූලික කටයුතු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මගින් සමීපව අධීක්ෂණය කරනු ලබන අතර විශේෂයෙන් එමගින් භාණ්ඩාගාර ප්‍රදාන සඳහා නිර්දේශ සහ අනුමැතින් ලබා දේ.

2. ව්‍යුහය සහ සිදු කළ ක්‍රියාකාරකම්



2.1 තේ කොමසාරිස් අංශය

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පත් කර ඇති තේ කොමසාරිස් වරයා ගේ මුලිකත්වයෙන් ක්‍රියාත්මක වන තේ කොමසාරිස් අංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංශ අතුරින් එකකි. තේ කොමසාරිස් අංශය විසින් 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සහ 1957 අංක 51 දරණ තේ පාලන පනත අනුව තේ කර්මාන්තයේ සංවර්ධනය, නිෂ්පාදනය, අපහරණය හා අදාළ නියාමන සහ අධීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් වන සියලු කටයුතු පාලනය කරයි.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරීමේ වගකීම තේ කොමසාරිස් සතු වේ. නියාමන, සංවර්ධන හා අපනයන යන ප්‍රධාන අංශ තුනකට තේ කොමසාරිස් අංශයේ කටයුතු තව දුරටත් බෙදනු ලැබේ.

ගම්පොල, බණ්ඩාරවෙල, රත්නපුර, මාතර, බදුරලිය, ගාල්ල සහ නුවර එළිය යන ප්‍රදේශවල පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 07ක් වෙතට තේ කොමසාරිස් අංශයේ කාර්යයන් විමධ්‍යගත කර ඇත.

තේ කොමසාරිස් අංශය තේ කර්මාන්තයේ අබණ්ඩ පැවැත්ම උදෙසා පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

- තේ නිෂ්පාදකයින් සහ කර්මාන්ත ශාලා ලියාපදිංචිය / බලපත ලබාදීම සහ අලුත් කිරීම.
- හරිත තේ දළු වෙළෙන්දන් ලියාපදිංචිය සහ ලියාපදිංචිය අලුත් කිරීම.
- කසළ තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය සහ ලියාපදිංචිය අලුත් කිරීම.
- කර්මාන්ත ශාලා සහ වෙළෙන්දන් මට්ටමෙන් දළු සැපයුම්කරුවන් සඳහා සිදු කෙරෙන සාධාරණ මිල ගණන් ගෙවීම අධීක්ෂණය.
- තේ කර්මාන්තශාලාවල හා ගබඩාවල යහපත් නිෂ්පාදන ක්‍රම පිළිබඳව අධීක්ෂණය.
- තේ නිෂ්පාදනයට අදාළ සංඛ්‍යා දත්ත රැස් කිරීම.
- තේ ක්ෂේත්‍රයේ අවභාවිතාවන් පාලනය කිරීම සඳහා තේ කර්මාන්ත ශාලාවල, වෙළෙඳුන්ගේ මධ්‍යස්ථානවල සහ කසළ තේ සැකසුම් මධ්‍යස්ථානවල විශේෂ විමර්ශන පැවැත්වීම.
- තේ නිෂ්පාදනය, තේ දළු එකතු කිරීම, කසල තේ සැකසීම පිළිබඳ නියාමනය හා උපදේශන සේවා ලබා දීම.
- "ආදර්ශ තේ වගා බිම්" සංවර්ධනය කිරීම හා එමඟින් තේ ක්ෂේත්‍රය යාන්ත්‍රිකරණය කිරීම පිළිබඳ නව තාක්ෂණික දැනුම බෙදා හැරීමේ මධ්‍යස්ථාන ලෙස භාවිත කිරීම.
- B 60 වැඩසටහන දිගටම කරගෙන යාමෙන් හරිත තේ දළුවල තත්වය ඉහළ දැමීම සඳහා සහ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්තශාලා නවීකරණය සඳහා සහනාධාර ලබාදීම.
- තේ නැවත වගාව, අලුතෙන් වගා කිරීම, පාළු සිටවීම ආදිය සඳහා ආකර්ෂණීය සහනාධාර ලබා දීමෙන් තේ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා උපකාර හදුන්වාදීම හා පවත්වා ගැනීම.
- තේ ක්ෂේත්‍රය යාන්ත්‍රිකරණය කිරීම සඳහා තේ බිම් අලුතෙන් වගා කිරීම හා නැවත වගා කිරීමේ වැඩසටහන් හඳුන්වා දීම.
- ගෝලීය උෂ්ණත්වය හේතුවෙන් පවතින දීර්ඝ කාලීන නියගයෙන් ඇතිවන ගැටලු ජය ගැනීම සඳහා ජල සැපයුම් පද්ධති ස්ථාපිත කිරීම සඳහා තේ වගා කරුවන් දිරිමත් කිරීම හා සමාන ව්‍යාප්තියක් සහිත බෝග වගා කිරීම.
- "ආදර්ශ තේ වගා බිම්" සහනාධාර වැඩසටහන කරගෙන යාම.
- තේ තවාන් ව්‍යාපෘතිය සඳහා සහනාධාර ක්‍රියාත්මක කිරීම.
- පෙව් පොහොර සහනාධාර ව්‍යාපෘතිය අබණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- සුර්ය බලශක්ති සහනාධාර ව්‍යාපෘතිය අබණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- තෙතමනය මීටර් සඳහා සහනාධාර ව්‍යාපෘතිය අබණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- ආහාර සුරක්ෂිතතා සහනික කිරීම සඳහා සහනාධාර ව්‍යාපෘතිය අබණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- 8%ක වාර්ෂික පොලී පදනම යටතේ තේ දළු සැපයුම්කරුවන් සඳහා පොහොර මිලදී ගැනීමට තේ තැරැව්කරුවන් මඟින් තේ කර්මාන්තශාලා වෙත මෘදු ණය යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආරම්භ කිරීම.
- වෙන්දේසියට හා අපනයනයට පෙර තේ නියැදි සැකසීම, තේ රස බලන්නන් හා රසායනාගාර වෙත තේ යැවීම හා සිලෝන් තේවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා අදාළ පියවර ගැනීම.
- නියාමන කටයුතුවල නියැලී සිටින ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා පොලිසිය හා ආරක්ෂක අංශ වෙත සහයෝගය ලබා දීම.
- තේ ඉඩම් ලියාපදිංචිය ක්‍රියාත්මක කිරීම හා තොරතුරු යාවත්කාලීන කිරීම.

ප්‍රධාන ජයග්‍රහණ

- කර්මාන්තශාලා 33ක් සඳහා රු.මිලියන 19.76ක කර්මාන්තශාලා නවීකරණ සහනාධාරයක් ලබා දුනි.
- හෙක්ටයාර් 413.32 ක් සඳහා රු. මිලියන 62.1 ක තේ නැවත වගා කිරීමේ සහනාධාරය ලබා දුනි.
- තේ ඉඩම් ලියාපදිංචියට අදාළ කටයුතු අබණ්ඩව සිදු කිරීම (තොරතුරු යාවත්කාලීන කිරීම).
- තේ ඉඩම් වල විසිරි ජල පද්ධති ස්ථාපනය කිරීම සඳහා වූ සහනාධාර යෝජනා ක්‍රමයේ 2022 වසර සඳහා සහනාධාර වශයෙන් මිලියන 24.05ක් ලබා දී ඇත.
- සුර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය මඟින් 2022 වසර සඳහා සහනාධාර ලෙස මිලියන 20.99ක් ලබා දී ඇත.
- යහපත් නිෂ්පාදන පිළිවෙත් වැඩසටහන යටතේ තේ කර්මාන්තශාලා සඳහා තෙතමන මීටර මිලදී ගැනීමට සහ තත්ත්ව සහතික ලබා ගැනීමට සහනාධාර වශයෙන් රුපියල් මිලියන 16.55ක් ලබා දෙන ලදී.
- රුහුණු සේවය සහ කදුරට සේවය යන විකාශන නාලිකා ඔස්සේ හරිත තේ දළු හා නිම් තේවල ගුණාත්මය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හරහා වැඩසටහනක් ආරම්භ කරන ලදී. 2022 වර්ෂය තුළ මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 4.6 ක් ද වැය කළ අතර B 60 වැඩසටහන සඳහා මුළු වියදම ලෙස රුපියල් මිලියන 12.728ක් වැය කර ඇත.
- 2022 වසර තුළ අමු තේ දළු සැපයුම්කරුවන් අතර බෙදා හැරීම සඳහා කර්මාන්තශාලා 259 කට පොහොර මිලදී ගැනීම වෙනුවෙන් මෘදු ණය යෝජනා ක්‍රමය මඟින් රුපියල් බිලියන 2.44 ක ණය පහසුකම් ලබා දී ඇත.

නිෂ්පාදකයින් සහ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

වගුව 2.1.1: මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා වර්ගීකරණය

තත්වය	කර්මාන්තශාලා සංඛ්‍යාව			
	උඩරට	මධ්‍යම	පහතරට	එකතුව
තම තේ දළු වලට සීමාවූ	56	17	5	78
තම තේ දළු සහ මිලදිගත් තේ දළු:				
අ) මුළු නිෂ්පාදනයෙන් 50%කට වඩා අඩු තම තේ දළු	11	26	84	121
ආ) මුළු නිෂ්පාදනයෙන් 50%කට වඩා වැඩි තම තේ දළු	64	29	13	106
මිලදිගත් තේ දළු පමණක්	11	40	262	313
තේ නිෂ්පාදනය සිදු නොකරන ලද කර්මාන්තශාලා	32	63	105	201
ක්‍රියාත්මක වන ලියාපදිංචි තේ කර්මාන්තශාල	174	175	470	819
ක්‍රියාත්මක නොවන ලියාපදිංචි තේ කර්මාන්තශාලා	28	28	71	127
ලියාපදිංචි මුළු තේ කර්මාන්තශාලා සංඛ්‍යාව	202	203	542	946

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව තේ කොමසාරිස් අංශය විසින් තේ නිෂ්පාදකයන් සහ තේ කර්මාන්ත ශාලා සම්බන්ධ කරුණු වලින් සමන්විත ලේඛනයක් නඩත්තු කළ යුතුය. නිෂ්පාදකයන් තේ නිෂ්පාදනය සඳහා මෙන්ම කොළඹ වෙන්දේසිය ඔස්සේ තේ විකණීම සඳහා තේ කොමසාරිස් අංශයෙහි ලියාපදිංචි විය යුතුයි.

නිමි තේ නිෂ්පාදනය කරන ලියාපදිංචි සියලුම කර්මාන්තශාලා විසින් ගොඩනැගිලි, උපකරණ සහ කර්මාන්තශාලා අවම තත්ත්ව ප්‍රමිතීන් අනුව පවත්වා ගත යුතු අතර කර්මාන්තශාලාවල මෙහෙයුම් සිදු කරන ආකාරය යහපත් නිෂ්පාදන ක්‍රමවේදයට අනුව විය යුතුය.

මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවිය හැකි සාධාරණ මිල ගණන

තේ පාලන පනතේ විධිවිධාන වලට අනුව මිලදී ගන්නා තේ දළුවලින් තම නිෂ්පාදනයන් කරනු ලබන කර්මාන්තශාලා තේ කොමසාරිස් විසින් නියම කරනු ලබන මිල ගණන් මත පදනම්ව එම කර්මාන්ත ශාලා විසින් නිපදවන තේවල නියමිත මිල පිළිබඳව අවධානය යොමුකරමින් මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවීම් කළ යුතුය. තේ කර්මාන්තශාලාවල ගෙවීම් තහවුරු කිරීම සඳහා එම ප්‍රදේශවල තේ පරීක්ෂකවරුන් විසින් මාසික පදනමින් පරීක්ෂා කිරීම් සිදු කරන අතර ප්‍රදේශයේ සහකාර තේ කොමසාරිස්වරු විසින් එම ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලබයි. පැහැර හරින ලද සහ ප්‍රමාද වූ ගෙවීම් පිළිබඳ ඕනෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් විසින් කටයුතු කරනු ලබන අතර එම මුදල් වෙන්දේසියෙන් අයකරගෙන විමර්ශනවලින් පසු තේ දළු සැපයුම්කරුවන්ට ගෙවනු ලැබේ.

ප්‍රමාද වූ ගෙවීම්

සමාලෝචිත වර්ෂය තුළ 2022 ජනවාරි 1 දිනට හරිත තේ දළු සපයන්නන් සඳහා ගෙවීමට තිබූ මුළු අගය වුයේ රුපියල් මිලියන 871.468 කි. රුපියල් මිලියන 59.62ක් අයකර ගෙන දළු සැපයුම්කරුවන් සඳහා ගෙවීම් සිදු කර ඇත.

වගුව 2.1.2 : ගෙවීමට ඇති ගාස්තු පිළිබඳ විස්තරය (රුපියල්)

ප්‍රදේශය	2022.01.01 දිනට මුදල	2022 වර්ෂයේදී එකතු වූ මුදල	පියවාගත් සහ ගෙවන ලද මුදල	2022.12.31 දිනට කුඩා තේ වතු හිමියන්ට ගෙවිය යුතු ශේෂය (රු)	ක්‍රියාත්මක කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු මුදල (රු)	වසා දමන ලද කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු මුදල (රු)
බදුරලිය	47,868,679.49	-	-	47,868,679.49	30,990,709.60	16,877,970.89
බණ්ඩාරවෙල	6,131,070.08	17,723,256.60	4,275,341.28	19,578,985.40	19,495,393.85	83,591.55
ගාල්ල	184,245,153.83	24,583,447.45	-	208,828,601.28	154,619,130.36	54,209,470.92
ගම්පොල	187,289,653.36	25,781,625.70	46,267,168.39	168,027,586.23	149,314,266.72	18,713,319.51
මාතර	74,219,027.97	3,993,544.06	8,732,536.48	75,548,096.51	68,352,653.39	7,195,443.12
නුවර එළිය	18,833,080.55	25,067,444.36	349,622.35	43,550,902.56	34,860,597.80	8,690,304.76
රත්නපුර	352,881,733.51	1,880,497.00	-	354,762,230.51	181,274,386.61	173,487,843.90
එකතුව	871,468,398.79	99,029,815.17	59,624,668.50	918,165,081.98	638,907,138.33	279,257,944.65

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

b) තේ දළුවල තත්ත්වය ආරක්ෂා කිරීම

අ) තේ දළු වෙළෙඳුන් හට බලපත්‍ර ලබා දීම

තේ පාලන පනතට අනුව, තේ දළු වෙළඳාමේ යෙදීම සඳහා තේ කොමසාරිස් අංශයෙන් වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමට සිදු වේ. ලියාපදිංචියට හා ලියාපදිංචිය අලුත් කිරීමට පෙර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එකතු කිරීමේ මධ්‍යස්ථානවල හා තේ දළු ප්‍රවාහනය සඳහා භාවිත කරනු ලබන වාහනවල ප්‍රමිතිය සම්පව නියාමනය කරනු ලැබේ.

වගුව 2.1.3: 2022 වසර තුළදී තේ දළු වෙළඳාම සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව

ප්‍රදේශය	2022.01.01 දිනට බලපත්‍ර ලබා දුන් වෙළෙඳුන්	බලපත්‍ර අලුත් කිරීම	නිකුත් කරන ලද නව බලපත්‍ර	2022.12.31 දිනට තේ දළු වෙළඳාම සඳහා ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව
බදුරලිය	250	220	12	232
බණ්ඩාරවෙල	179	175	10	185
ගාල්ල	242	224	15	239
ගම්පොල	191	174	5	179
මාතර	265	251	7	258
නුවර එළිය	107	106	0	106
රත්නපුර	598	464	40	504
එකතුව	1832	1614	89	1703

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ආ) තේ දළුවල තත්ත්වය ඉහල නැංවීම සඳහා "හොඳම දළු - B60 වැඩසටහන" ක්‍රියාත්මක කිරීම

නිමි තේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය වන්නේ තේ දළුය. හොඳ තත්ත්වයේ නිමි නිෂ්පාදනය සඳහා අමු තේ දළුවල ගුණාත්මකබව ඉතා වැදගත් වේ. අමු තේ දළුවල තත්ත්වය සම්බන්ධයෙන් අදාළ ගැසට් නිවේදනයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් 2010 දෙසැම්බර් 14 වැනි දින පළකර තිබේ. ගැසට් නිවේදනය අනුව අවම වශයෙන් 60%ක හොඳ තේ දළු සැකසීමේ ප්‍රතිශතයක් අවශ්‍ය වේ. ඒ අනුව,2022 වර්ෂයේ දී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ පර්යේෂණ ආයතනය සමග එක්ව B60 වැඩසටහන නැවත ආරම්භ කරන ලදී. මේ යටතේ රුපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන්, සාකච්ඡා, පුවත්පත් ලිපි පල කිරීම, සමාජ මාධ්‍ය ඔස්සේ තොරතුරු හා දැන්වීම් පල කිරීම, තේ කම්හල් හිමියන්, දළු එකතු කරන්නන් හා තේ වගාකරුවන් සඳහා රැස්වීම් පැවැත්වීම ආදී විවිධ වැඩසටහන් දියත් කර ඇත. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හා තේ පර්යේෂණ ආයතනයේ සහයෝගයෙන් කර්මාන්තශාලා හා වෙළඳුන්ගේ මට්ටමෙන් තේ දළුවල තත්වය ඇගයීම සඳහා ප්‍රාදේශීය විගණන කණ්ඩායම් සංවිධානය කරන ලදී. කර්මාන්තශාලා මට්ටමෙන් ගුණාත්මක තත්වයේ තේ දළු සොයාගැනීම පිළිබඳ ලියාපදිංචි තේ නිෂ්පාදකයන්ට දැන්වීම් නිකුත් කිරීම ද ආරම්භ කරන ලදී.

වගුව 2.1.4: ප්‍රාදේශීය වශයෙන් පවතින තේ දළු ප්‍රමිතීන්

ප්‍රදේශය	වඩාත්ම හොඳ	වඩාත්ම හොඳ මට්ටමට වඩා පහල	බාල තත්වයේ
බදුරලිය	37	17	46
බණ්ඩාරවෙල	20	32	48
ගාල්ල	37	14	49
ගම්පොල	32	20	48
මාතර	43	17	40
නුවර එළිය	33	25	42
රත්නපුර	29	22	49

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඇ) උත්සව සමයේදී බොග කළමනාකරණය කිරීමේ වැඩසටහන

උත්සව සමයේ දි දීර්ඝ කාලයක් තේ කර්මාන්තශාලා වසා තැබීම හේතුවෙන් සිදුවන අස්වනු හානිය අවම කරගැනීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙය 2005 වසරේ දී ආරම්භ කළ අතර ඒ යටතේ විවිධ ක්‍රියාකාරකම් හදුන්වා දෙමින් අස්වනු හානිය පාලනය කිරීමට තේ කොමසාරිස් අංශයට හැකි වී ඇත.

ඈ) "ආදර්ශ තේ වගාබිම්" ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ අර්ධ යාන්ත්‍රික තිරසාර තේ වගාව ප්‍රවර්ධනය කිරීම උදෙසා මෙම වැඩසටහන හදුන්වා දෙන ලදී. මෙම වසරේ දී මෙම වැඩසටහන නව දුරටත් සාර්ථකව සිදු කරමින් ඉඩම් 24ක් සංවර්ධනය කරන ලද අතර පසුගිය වසරේ වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතයෙන් රුපියල් මිලියන 7.49ක් ගෙවන ලදී.

පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම වැඩසටහන සකස්කර තිබේ.

- තේ ක්ෂේත්‍රය තුළ තේ ඉඩම් හා ශ්‍රම ඵලදායිතාවය ඉහල නැංවීම
- වසර පුරාවට නිරන්තර හා ස්ථාවර අස්වැන්නක් ලබා ගැනීම
- තේ වගාවේ ප්‍රශස්ත ආර්ථිකමය ආයු කාලය වැඩි කිරීම
- නිෂ්පාදන පිරිවැය අඩු කිරීම (දළු නෙලීමේ පිරිවැය 60% කින් අඩු කිරීමට බලාපොරොත්තු වේ)
- තේ දළුවල ප්‍රමිතිය ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගැනීම
- යහපත් කෘෂිකාර්මික භාවිතාවන් තේ වගාවන් තුළට හදුන්වා දීම මගින් ජාත්‍යන්තර සහතික ලබාගැනීමට ඇති හැකියාව වැඩි කිරීම.(උදා: වැසි වනාන්තර සහයෝගිතා සහතිකය)

වගුව 2.1.5: ආදර්ශ තේ වගා බිම් සඳහා සහනාධාර ගෙවීම්

ප්‍රදේශය	ලද අයදුම්පත් සංඛ්‍යාව	ගෙවීම් සිදු කළ ඉඩම් ප්‍රමාණය	ගෙවූ මුදල (රු.)
බදුරලිය	2	2	550,000
බණ්ඩාරවෙල	4	4	1,050,000
ගාල්ල	2	2	1,050,000
ගම්පොල	4	4	1,440,000
මාතර	9	9	2,597,570
නුවර එළිය	3	3	800,000
රත්නපුර	-	-	-
එකතුව	24	24	7,487,570

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඉ) තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය

තේ නැවත වගා කිරීම, අලුතින් වගා කිරීම හා වගා බිම්වල අඩු පාඩු සිටුවීම සඳහා සහනාධාර සැපයීම මගින් තේ ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වගුව 2.1.6 සහනාධාර යෝජනා ක්‍රමය

ප්‍රදේශය	ලද අයදුම්පත් සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.)	ගෙවීම් සිදු කළ ඉඩම් ප්‍රමාණය (හෙක්)	කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව
බදුරලිය	27	5,371,200.00	28.67	89
බණ්ඩාරවෙල	7	1,447,500.00	18.23	33
ගාල්ල	16	2,518,100.00	16.36	46
ගම්පොල	80	15,586,000.00	77.25	106
මාතර	13	11,250,000.00	44.55	138
නුවර එළිය	69	18,510,800.00	197.56	118
රත්නපුර	39	7,419,000.00	30.7	104
එකතුව	251	62,102,600.00	413.32	634

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

විසින් රුපියල් මිලියන 122ක් වෙන් කර තිබේ.
ඒ අනුව, රාජ්‍ය හා පුද්ගලික ක්ෂේත්‍රයේ අක්කර 10ට වැඩි වතු සඳහා සහනාධාර ලබා දෙමින් පවතී. තේ නැවත වගා කිරීම, අලුතින් වගා කිරීම හා වගා බිම්වල අඩු පාඩු සිටුවීම සඳහා සහනාධාර සැපයීම මගින්

(i) තේ නිෂ්පාදනය ඉහළ නැංවීම
(ii) තේ බිම්වල ඵලදායිතාවය වැඩි කිරීම
(iii) තේ නැවත වගා කිරීමේ ජාතික අනුපාතය 3%ක ප්‍රමාණයක පවත්වා ගැනීම

මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ඊ) තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ දිවයිනේ සියලුම තේ ඉඩම් තේ කොමසාරිස් අංශයේ ලියාපදිංචි කිරීම අවශ්‍ය වේ. තේ ඉඩම් 485000කට ආසන්න ප්‍රමාණයක් මේ වන විට ලියාපදිංචි කර තිබේ. තේ ඉඩම් සම්බන්ධ සියලු තොරතුරු ක්‍රමවත් පිළිවෙලකට පරිගණක ගත කරමින් මෘදුකාංග වැඩසටහනකට ඇතුළත් කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංශෝධන දැන්වීම් වසරක් හැර වසරක් නිකුත් කරනු ලැබේ.

එ) තේ තවාන් සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

වාණිජ්‍ය ක්ෂේත්‍රය හා ප්‍රමිතිගත ආකාරයට තේ තවාන් පවත්වාගෙන යනු ලබන අක්කර 10කට වැඩි තේ වතු හිමියන් සඳහා සහනාධාර ගෙවීමට ප්‍රවර්ධන හා අළෙවි බදු අරමුදල් භාවිත කරන ලදී. එකවර අවම වශයෙන් තේ පැල 100,000ක්, ඉහළ සෙවණක් සහ විසුරුම් ජල බින්දු වාර තාක්ෂණ පද්ධතියක් මෙන්ම ස්ථිර ව්‍යුහයක් සහිත තවාන් පමණක් මෙම සහනාධාර ක්‍රමය මගින් ආවරණය කරයි. සහනාධාර ප්‍රමාණය රුපියල් මිලියන 1.5කි. සියලුම තවාන් කටයුතු ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය.

වගුව 2.1.7: තේ පැළ තවාන් ව්‍යාපෘතිය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

ප්‍රදේශය	ගෙවීම් කළ තවාන් සංඛ්‍යාව	ගෙවන ලද මුදල (රු)
බදුරලිය	7	2,750,000.00
ගාල්ල	13	6,250,000.00
ගම්පොල	10	5,850,000.00
මාතර	6	4,400,000.00
නුවර එළිය	8	2,250,000.00
රත්නපුර	5	3,000,000.00
එකතුව	49	24,500,000.00

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඒ) කාබනික පොහොර සඳහා සහනාධාර යෝජනාක්‍රමය

රජයේ ප්‍රතිපත්ති තීරණයට අනුව, තේ වගා කරනු ලබන ප්‍රදේශවල සිටින කාබනික පොහොර නිපදවන්නන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වැඩසටහනක් ආරම්භ කරන ලද අතර පසේ සාරවත්බව හා පසෙහි කාබනික පදාර්ථ අන්තර්ගතය වැඩි දියුණු කිරීම සඳහා වූ උපකාරක වැඩසටහනක් වශයෙන් එය ක්‍රියාත්මක වේ. කාබනික පදාර්ථ පසට එකතු කිරීමෙන් පමණක් රසායනික පොහොර නැවත අවශෝෂණය වීම වර්ධනය වීමෙන් තේ ඉඩම්වල ඵලදායිතාවය වර්ධනය කරන ලදී. මේ වසරේ ගෙවීම් සිදු කරන ලද්දේ පසුගිය වසරේ ප්‍රතිපාදන භාවිතයෙනි.

වගුව 2.1.8 කාබනික පොහොර සඳහා සහනාධාර යෝජනාක්‍රමය

ප්‍රදේශය	ලද අයදුම්පත් සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.)	එකක ගණන
බදුරලිය	32	4.6	17
බණ්ඩාරවෙල	41	2.10	7
ගාල්ල	25	0.9	3
ගම්පොල	19	3.50	12
මාතර	36	1.8	6
නුවර එළිය	33	1.1	3
රත්නපුර	30	0.90	3
එකතුව	216	14.9	51

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඔ) වෙනත් ව්‍යාපෘති

තේ කර්මාන්තශාලාවල හා අපනයනකරුවන්ගේ ගබඩාවල 2022 වසරේ දී ආරම්භ කළ සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා මෙම වසරේ දී ගෙවීම් කටයුතු දිගටම සිදු කරන ලදී. මෙම සහනාධාර යෝජනා ක්‍රමය යටතේ (කර්මාන්තශාලා 31ක්, ගබඩා 3ක් සඳහා) රුපියල් මිලියන 20.99 ක සහනාධාර මුදලක් ලබා දුනි. කර්මාන්තශාලා 145ක් සඳහා තෙතමන මීටර බෙදා දීම වෙනුවෙන් සහනාධාර ලබා දෙන ලදී. HACCP/ISO ආහාර සුරක්ෂිතතා සහතිකය සහ අපනයනකරුවන්ගේ ගබඩාවල නව යන්ත්‍ර ස්ථාපිත කිරීම ද සිදු කරන ලදී.

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවස්ථා කිහිපයක්



කර්මාන්තශාලාවල තේ දළු ප්‍රවාහන නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන - මාතර



තේ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන - කලවාන



කර්මාන්තශාලා හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන - ගාල්ල



තේ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන - ගාල්ල



තේ දළු ප්‍රවාහන නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන - කළවාන



තේ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන - ගම්පොළ



තත්ව පරීක්ෂක නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන - මාතර



ආදර්ශ තේ වගා බිම් නිරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන්ගේ සහභාගිත්වය - ගාල්ල



ආදර්ශ තේ වගා බිම් ව්‍යාපෘතිය - ගම්පොළ



ආදර්ශ තේ වගා බිම් නිරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන්ගේ සහභාගිත්වය - ගාල්ල



පැළ තවාන් ව්‍යාපෘතිය - ගම්පොළ



පැළ තවාන් ව්‍යාපෘතිය - ගාල්ල

තේ කර්මාන්තශාලාවල තත්වය ඉහල නැංවීමේ ක්‍රියාකාරකම්

තේ කොමසාරිස් විසින් නිර්ණය කරන ලද ඉහත සඳහන් තත්වයන් අනුව කටයුතු කිරීමට යම් කර්මාන්ත ශාලාවක් අපොහොසත් වන්නේ නම්, එවැනි කර්මාන්තශාලා ලියාපදිංචිය අත්හිටුවීමට මෙන්ම අවලංගු කිරීමට තේ කොමසාරිස් වරයාට බලය ඇත.

ප්‍රාදේශීය සහකාර තේ කොමසාරිස්වරුන් විසින් ඉහත අවශ්‍යතා නියාමනය කිරීම සඳහා පරීක්ෂණ පවත්වනු ලබන අතර ඔවුන්ගේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මත පදනම්ව තේ කොමසාරිස් වෙතට නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. තවද, ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් විසින් උක්ත අවශ්‍යතා පවත්වා ගැනීම සඳහා උපදේශන සේවා සපයනු ලබයි. ඒ අනුව, තේ කර්මාන්තශාලාවල හා එහි නිෂ්පාදනවල තත්වය ඉහල නැංවීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

අ) කර්මාන්තශාලා නවීකරණය කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය

වගුව 2.1.9: කර්මාන්තශාලා නවීකරණය කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය

ප්‍රදේශය	ලද අයදුම්පත් සංඛ්‍යාව	ගෙවන ලද කර්මාන්තශාලා ගණන	ගෙවූ මුදල (රු)
බදුරලිය	15	4	3,308,333.33
බණ්ඩාරවෙල	2	2	1,396,666.67
ගාල්ල	12	9	7,001,198.00
ගම්පොල	17	5	2,051,437.07
මාතර	12	4	1,332,949.17
නුවර එළිය	53	4	2,190,500.00
රත්නපුර	22	5	2,481,354.00
එකතුව	133	33	19,762,438.24

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

භාණ්ඩාගාරය විසින් දේශීය අරමුදල් යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මුදල් වෙන්කර ඇත. නිම් තේවල ගුනාත්මක තත්වය ඉහල නැංවීමල තේ කර්මාන්තයට නව තාක්ෂණය හඳුන්වා දීම සහ තේ කර්මාන්තශාලා නවීකරණය කිරීම මෙම යෝජනා ක්‍රමයේ අරමුණු වේ.

ආ) තේ කර්මාන්තශාලාවල යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) ස්ථාපිත කිරීම

තේ කර්මාන්තශාලාවල ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සඳහා උපදෙස් සැපයීමට මෙම වැඩසටහන නිර්මාණය කර ඇත. මෙම වැඩසටහන යටතේ ඇගයීම් 536ක් සිදු කරන ලදී. එමෙන්ම, තේ නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමිතීන් ඉහල නැංවීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

වගුව 2.1.10 : ප්‍රාදේශීය වශයෙන් තේ කර්මාන්තශාලාවල මනා නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව

ප්‍රදේශය	මනා නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව	කර්මාන්තශාලා ශ්‍රේණීගත කිරීම			
		විශිෂ්ටයි	හොඳයි	සාමාන්‍යයි	දුර්වලයි
බදුරලිය	49	25	21	3	0
බණ්ඩාරවෙල	112	34	71	7	0
ගාල්ල	88	55	32	1	0
ගම්පොල	77	37	30	10	0
මාතර	44	22	22	0	0
නුවර එළිය	78	40	34	4	0
රත්නපුර	88	37	43	8	0
එකතුව	536	250	253	33	0

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඇ) හදිසි අධීක්ෂණ ක්‍රමය (කාර්ය කණ්ඩායම් මෙහෙයුම)

තේ කර්මාන්තයේ අවභාවිතාවන් පාලනය කිරීම සඳහා "කාර්ය කණ්ඩායම් මෙහෙයුම්" ක්‍රියාත්මක කරමින් පවතී. සහකාර තේ කොමසාරිස්ගේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් විසින් මෙහෙයුම් සිදු කරනු ලබයි. 2022 වසරේදී තේ කොමසාරිස් අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා හදිසි පරීක්සීම් 168ක් සිදුකර ඇත.

වගුව 2.1.11: කාර්ය කණ්ඩායම් මෙහෙයුම්

ප්‍රදේශය	සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව
බදුරලිය	17
බණ්ඩාරවෙල	36
ගාල්ල	13
ගම්පොල	37
මාතර	10
නුවර එළිය	60
රත්නපුර	14
එකතුව	187

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඈ) පහළ ශුද්ධ විකුණුම් සාමාන්‍ය උපාය මාර්ගය

පහළ ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් සහිත කර්මාන්ත ශාලා සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේ තේ දළුවල ප්‍රමිතිය සහ තේ නිෂ්පාදනයේ ප්‍රමිතිය වැඩිකිරීම මගින් එවැනි කර්මාන්තශාලා වල ශුද්ධ විකුණුම් සාමාන්‍ය මට්ටම ඉහළට ගැනීමයි.

ඉ) කසල තේ සකසන්නන් සඳහා වෙන්දේසි අයිතිය

කසල තේ සැකසුම්කරුවන් හට වෙන්දේසි අයිතිවාසිකම් ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රමවේදයක් සැලසුම් කර ඇත. වෙන්දේසි අයිතිවාසිකම් අයදුම් කිරීම සඳහා, කසල තේ සැකසුම් මධ්‍යස්ථානය තුළ යහපත් නිෂ්පාදන භාවිතාවන් (GMP) පිළිබඳ ප්‍රමිතියෙන් 80% ක් නිබිය යුතුය. ප්‍රතික්ෂේප කරන ලද තේ සැකසුම් මධ්‍යස්ථාන 06ක් සඳහා 2022 දී අලුතින් වෙන්දේසි අයිතිය ලබා දෙන ලදී.

ඊ) කසල තේ පිරිසැකසුම් වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන වල යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) ස්ථාපිත කිරීම

කසල තේ පිරිසැකසීම යනු කසල තේ වලින් භාවිත කළ හැකි තේ වෙන් කර ගැනීමේ ක්‍රියාවලියයි. කසල තේ අලෙවි කරන සෑම වෙළෙන්දෙකුම කසළ තේ සැකසුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය. කසළ තේ මධ්‍යස්ථානවල ප්‍රමිතීන් ඉහල නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් සැපයීමේ අරමුණෙන් මනා නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. කසල තේ ප්‍රවාහනය සඳහා ප්‍රවාහන බලපත්‍ර ලබා ගත යුතු අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එම ප්‍රවාහන බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

වගුව 2.1.12: කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ගණන සහ 2022 වර්ෂය සඳහා නිකුත් කළ බලපත්‍ර ගණන

ප්‍රදේශය	2022.01.01 දිනට ලියාපදිංචි සැකසුම්කරුවන්	වර්ෂය තුළ අලුත් කිරීම්	වර්ෂය තුළ අලුතින් නිකුත් කිරීම්	2022.12.31 දිනට පිරිසැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව	2022.12.31 දිනට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	බලපත්‍ර මගින් වෙළෙඳුන් විසින් මිලදී ගන්නා ලද තේ ප්‍රමාණය (කි.ග්‍රෑම්)
බදුරලිය	9	9	0	9	1,423	5,905,935
බණ්ඩාරවෙල	1	1	0	1	977	3,796,804
හාල්ල	3	2	0	2	608	1,852,372
හම්පොල	120	113	3	116	2,030	8,627,025
මාතර	4	3	1	4	269	868,524
නුවර එළිය	2	2	0	2	1,824	11,005,444
රත්නපුර	4	2	2	4	1,294	5,045,703
එකතුව	143	132	6	138	8,425	37,101,807

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

එ) කර්මාන්තශාලා සඳහා ආහාර සුරක්ෂිතතා සහතිකය (HACCP & ISO 2200)

ක්‍රියාත්මක මට්ටමේ පවතින සියලු තේ කර්මාන්තශාලා සඳහා ආහාර සුරක්ෂිතතා සහතිකය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. ලියාපදිංචිය අලුත් කරන අවස්ථාවේදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහතික අවශ්‍යතා නියාමනය කරනු ලබන අතර සහතිකය ලබා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දේ.

වගුව 2.1.13: තේ කර්මාන්තශාලා සඳහා ජාත්‍යන්තර සහතික

ප්‍රදේශය	HACCP (කර්මාන්තශාලා ගණන)	ISO 22000 (කර්මාන්තශාලා ගණන)	වෙනත් ජාත්‍යන්තර සහතික (RA/CQC) (කර්මාන්තශාලා ගණන)
බදුරලිය	10	18	6
බණ්ඩාරවෙල	51	16	9
හාල්ල	49	49	16
හම්පොල	29	29	0
මාතර	33	50	14
නුවර එළිය	51	16	9
රත්නපුර	46	47	7
එකතුව	269	225	61

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.2 තේ අපනයන අංශය

1959 අංක 16 දරණ (බදු සහ අපනයන පාලනය) පනතේ බලතල හා කාර්යන් සහ 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ පවතින රෙගුලාසි පරිපාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශය විසිනි. තේ අපනයන අංශය මගින් තේ අපනයනකරුවන්, තේ ඇසුරුම්කරුවන්, ගබඩාවන්, ආනයනකරුවන් හා තේ ඇසුරුම් වර්ග ලියාපදිංචි කිරීම, තේ ලබා ගැනීම, තේ සඳහා අවම ප්‍රමිතිය පිළිබඳ අධීක්ෂණය කිරීම, තේ අපනයනය සඳහා අනුමැතිය ලබා දීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යාම සහ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ අපනයනය අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. ඊට අමතරව, 2022 වර්ෂය පුරාවට පහත සඳහන් ප්‍රධාන කර්තව්‍යයන් අඛණ්ඩව සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ තේ අපනයනයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් විශේෂ ව්‍යාපෘති 2022 වර්ෂය තුළ ද ක්‍රියාත්මක කරන ලදී.

1. තේ අපනයන සඳහා යහපත් නිෂ්පාදන ක්‍රියාවලිය (GMP) පිළිබඳ සහතිකය ලබා දීම.
2. ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ශ්‍රී ලංකා රේගුව විසින් ඒකාබද්ධ විමර්ශන පැවැත්වීම.

අපනයනයේ විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු අපනයන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේ දී තේ තොග සම්බන්ධයෙන් ඒකාබද්ධව විමර්ශන පවත්වනු ලැබේ.

ඊට අමතරව, සියලුම අපනයනකරුවන්ගේ ගබඩාවල තේ සැකසීමේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා, HACCP නත්ත්ව සහතිකය ලබා ගැනීම තම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් බව ප්‍රකාශයට පත් කරන ලද අතර සියලු අපනයන ගබඩාවන් හි දී යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) පිළිබඳ ඇගයීම් සිදු කරනු ලැබේ.

ගෝලීය තේ වෙළඳපොළ තුළ පාරිභෝගික අවශ්‍යතා සහ උවමනාවන් සපුරාලීම සඳහා නිෂ්පාදන විවිධාංගීකරණය, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, ඉහළ අගයක් එකතු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට හැකි නවීන තාක්ෂණයන්හි ආයෝජනය කිරීමට අපනයන ඇසුරුම් කර්මාන්තශාලා දිරිමත් කිරීම සඳහා 2021 දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහන පොලී ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

ලියාපදිංචි කිරීම්

තේ අපනයන අංශයේ ප්‍රධාන කාර්යන්ගෙන් එකක් වන්නේ අපනයනකරුවන්, අසුරුම්කරුවන්, ගබඩාවන් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීමය.
තේ අපනයනකරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමට අපේක්ෂා කරන යම් පුද්ගලයෙකු හා සමාගමක් විසින් ඒ සඳහා සුදුසුකම් ලැබීමට අවම නිර්ණායක සමුදායක් සපුරාලිය යුතු වේ. එනම්, වලංගු ව්‍යාපාර ලියාපදිංචියක්, ලියාපදිංචි ගබඩා (තේ ගබඩා කිරීම, මිශ්‍ර කිරීම හා ඇසුරුම් කිරීම සඳහා), තේ රස බැලීමේ පහසුකම් සහිත සුදුසුකම් ලත් තේ රස බලන්නෙකු සහ රුපියල් මිලියන එකක අවම ප්‍රාග්ධනය (ආයෝජනය කළ/ගෙවන ලද) යන නිර්ණායකයන් ය.

1986 ජනවාරි 28 දින අංක 386/13 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල නියාමනය (තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම) ප්‍රකාරව, ගෘහස්ත පරිභෝජනය සඳහා හෝ අන් ආකාරයක තේ ඇසුරුම්කිරීමේ ව්‍යාපාරයක නියැලී සිටින ඕනෑම අයෙකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වේ. සෑම ලියාපදිංචියක්ම වසරක කාලයක් වලංගුවන අතර වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කළ යුතුය.

1959 අංක 16 දරණ (බදු සහ අපනයන පාලනය) පනත යටතේ අපනයනකරුවෙකු වශයෙන් ලියාපදිංචි ඕනෑම ආයතනයක් තේ ආනයනකරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමට ද සුදුසුකම් ලබයි.

1986 සැප්තැම්බර් 10 දින අංක 410/11 දරණ ගැසට් පත්‍රයෙන් සහ 2003 මාර්තු 20 දින අංක 1280/8 දරණ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද 1984 දෙසැම්බර් 05 දින අංක 326/17 දරණ රජයේ ඇති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද 1984 ශ්‍රී ලංකා තේ මණ්ඩල නියාමනය (තේ ගබඩා කිරීම) අනුව ඕනෑම එක් වහාවකදී කිලෝ ග්‍රෑම් 1000ට වඩා වැඩි තේ ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා භාවිතා කරන ගබඩාවන් සහ තේ ගබඩා කිරීම සඳහා සතුටුදායක බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සලකනු ලබන ගබඩාවන් උක්ත නියාමනවල විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි කළ යුතුය.

ශ්‍රී ලංකා තේ සමග මිශ්‍රිත වෙනත් සම්භවයක් සහිත විශේෂිත තේ අඩංගු සිල්ලර බහාලුම් 1981 ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (ආනයන හා අපනයන) යටතේ අපනයනය කරනු ලැබේ. එවැනි බහාලුම් /ඇසුරුම් මත "ශ්‍රී ලංකාවේ දී ඇසුරුම් කරන ලද ශ්‍රී ලාංකීය හා වෙනත් සම්භවයක් සහිත තෙ" හෝ" ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලද වෙනත් සම්භවයක් සහිත තේ" යන්න පමණක් සඳහන් කළ යුතු අතර සියලුම බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතුය.
සියලුම ලියාපදිංචි තේ අපනයනකරුවන් අපනයනයට අවසර ලබා ගැනීම සඳහා ස්වයංක්‍රිය රේගු දත්ත පද්ධතිය (ASYCUDA) හරහා තේ අපනයන අංශයට වෙනත් අවශ්‍ය ලියකියවිලි සමග රේගු භාණ්ඩ ලියවිලි (CUSDECs) බාර දිය යුතුය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අපනයනය කිරීමට සුදුසුකම් තේ තොගය අපනයනය සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව පවතින්නේ ද යන්න සොයා බලනු ලැබේ.

වගුව 2.2.1: අපනයනකරුවන්, අසුරුම්කරුවන්, ගබඩාවන්, නිෂ්පාදන තැරැව්කරුවන් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන - 2022

ලියාපදිංචි කිරීම්	01.01.2022 දිනට	2022 වර්ෂය තුළ නව ලියාපදිංචි කිරීම්	31.12.2022 දිනට මුළු එකතුව
අපනයනකරුවන්	369	නව ලියාපදිංචි කිරීම් : 40	401
ඇසුරුම්කරුවන්	691	අපනයනකරුවන්/දේශීය අසුරුම්කරුවන්ගේ නව ලියාපදිංචි කිරීම් : 108	703
ගබඩාවන්	194	නව ගබඩා ලියාපදිංචි කිරීම් : 20	283
ආනයනකරුවන්	102	නව ආනයනකරුවන් ලියාපදිංචි කිරීම් : 02	103
නිෂ්පාදන තැරැව්කරුවන්	8		08

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තේ ආනයනය

තේ කිලෝ ග්‍රෑම් 5,886,131.70ක් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආනයන බලපත්‍ර 441ක් නිකුත් කර ඇත. කෙසේවෙතත්, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ සැබෑ ආනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 5,931,242කි.

වගුව 2.2.2: තථ්‍ය ආනයන - 2021 ජනවාරි - දෙසැම්බර් 2022

රට	වර්ගය	ආනයන	පිරිවැය, රක්ෂණ හා ප්‍රවාහන	අගය
		ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	අගය (රු.)	(රු.)
චීනය	හරිත තේ	2,025,066	779.89	1,579,328,412
	විශේෂ තේ	118,940	1,465.35	174,289,034
	සුදු තේ	49,986	1,614.20	80,687,490
	කැඟෙන් ඉවත් කළ තේ	431	8,720.61	3,758,583
	අනු එකතුව	**2,194,423**	**837.61**	**1,838,063,518**
ඉන්දියාව	CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ)	1,833,931	524.51	961,917,328
	විශේෂ (කළු තේ)	700,582	1,245.02	872,241,606
	හරිත තේ	37,799	579.16	21,891,522
	අනු එකතුව	**2,572,312**	**721.55**	**1,856,050,456**
ජර්මනිය	හරිත තේ	421	2,267.75	954,723
	විශේෂ තේ	85	7,550.34	641,779
	අනු එකතුව	**506**	**3,155.14**	**1,596,502**
ජපානය	හරිත තේ	200	5,912.50	1,182,500
	විශේෂ තේ	151,120	1,754.89	265,198,526
	අනු එකතුව	**151,320**	**1,760.38**	**266,381,026**
කෙන්යාව	CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ)	976,564	735.16	717,931,015
	අනු එකතුව	**976,564**	**735.16**	**717,931,015**
නායිවානය	විශේෂ තේ	155	11,720.05	1,816,608
	අනු එකතුව	**155**	**11,720.05**	**1,816,608**
එක්සත් රාජධානිය	හරිත තේ	285	630.00	179,550
	විශේෂ තේ	3,027	375.00	1,135,125
	අනු එකතුව	**3,312**	**396.94**	**1,314,675**
මියන්මාරය	හරිත තේ	1,400	64,482.60	90,275,640
	CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ)	600	29,619.58	17,771,748
	අනු එකතුව	**2,000**	**54,023.69**	**108,047,388**
ඉන්දුනීසියාව	CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ)	24,200	714.04	17,279,768
	අනු එකතුව	**24,200**	**714.04**	**17,279,768**
වියට්නාමය	හරිත තේ	6,450	595.70	3,842,265
	අනු එකතුව	**6,450**	**595.70**	**3,842,265**
මුළු එකතුව		5,931,242	811.35	4,812,323,221

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

සාදන ලද තේ සඳහා ISO 3720 අවම තත්ව ප්‍රමිතිය පවත්වා ගැනීම

දෙන ලද සියලුම තේ නියැදි සහ තේ කර්මාන්තශාලාවලින් ලබා ගන්නා ලද සියලුම තේ නියැදි, ආනයනයෙන් පසු ලබා ගන්නා ලද තොග හා අපනයනය සඳහා සුදානම් කරන ලද තොග ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත් කරන ලද තේ රස බලන්නන්ගේ කමිටුව විසින් පරීක්ෂාවට ලක් කරනු ලබයි. එනම්, අදාළ තේ වර්ගය අවසර ලත් වර්ගයට අයත් වේ ද, ISO 3720 ප්‍රමිතියට අනුකූල වේ ද, කිසිදු අපවිත්‍රතාවයකින් තොර වේ ද යන්න පිළිබඳ සොයා බැලීම එකී පරීක්ෂාව සිදු කරන අතර එහිදී අපනයනයට සුදුසු තේ සඳහා පමණක් අවසර දෙනු ලබයි.

වගුව 2.2.3: එක් එක් නියැදිවලදී ගුණාත්මකබව සම්බන්ධ දෝෂ - 2022

නියැදි වර්ගය	නියැදි ගණන	ISO ප්‍රමිතියට පහලින් පවතින සහ අපවිත්‍රතා සහිත බවට හඳුනාගත් ප්‍රමාණය
වෙන්දේසියට පෙර අපනයන අංශය මගින් ලබාගත් නියැදි	2081	331
වෙන්දේසියට පෙර ඉවත් කරන ලද නියැදි (කම්ටුව විසින්)	2907	
වෙන්දේසියට පසු	10103	3

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

පරිභෝජනයට නුසුදුසු වීමෙන් තේවල ස්වභාවික ගුණය වෙනස් කිරීම

පූර්ව වෙන්දේසි, පූර්ව බෙදා හැරීම් සහ විශේෂ පරීක්ෂණ මට්ටම්වලදී මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට හඳුනා ගන්නා ලද තේවල ස්වභාවික ගුණය වෙනස් කිරීම අපනයන අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. මෙම බණ්ඩය යටතේ තේ කිලෝ ග්‍රෑම් 160,844.34ක් ස්වභාවික ගුණය වෙනස් කිරීමට භාජනය කරන ලදී.

නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන කාර්ය සාධනය

ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (TRQ) ශ්‍රී ලංකාව තුළ පවතී. කෙසේ වෙතත්, මනාප ගාස්තු අනුපාතයෙහි සැලකිය යුතු උපයෝජනයක් 2022 වර්ෂය තුළ දී වාර්තා වී නොමැත.

වගුව: 2.2.4 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතය භාවිත කිරීම (2022)

නිදහස් වෙළඳ ගිවිසුම	වසරකට වෙන් කරන ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	මුළු අපනයන (කිලෝ ග්‍රෑම්)
ඉන්දු- ශ්‍රී ලංකා	15,000,000.00	50,410.68
පාකිස්තාන- ශ්‍රී ලංකා	10,000,000.00	0

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තේ අපනයන ඇසුරුම් කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම හෝ නවීකරණය කිරීම සඳහා සහන පොලී යෝජනා ක්‍රමය

ගෝලීය තේ වෙළෙඳපොළ තුළ පාරිභෝගික අවශ්‍යතා සහ උවමනාවන් සපුරාලීම සඳහා නිෂ්පාදන විවිධාංගිකරණය, තත්ත්වය ඉහල නැංවීම, ඉහළ අගය එකතු කිරීම උසස් මට්ටමකට ගෙන ඒමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහන පොලී ක්‍රමයක් දියත් කර ඇත. එහිදී වසර 5ක කාලයක් සඳහා රුපියල් මිලියන පහක් දක්වා වාර්ෂිකව ගෙවිය යුතු පොලියෙන් උපරිම 50%ක පොලී සහනාධාරයක් සහ 10%ක හමාර කිරීමේ උපරිම පොලී සහනාධාරයක් අපනයනකරුට හිමිවේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂය තුළදී අපනයනකරුවන් 08 දෙනෙකු වෙනුවෙන් රුපියල් මිලියන 33.88 ක සහනාධාර මුදලක් ගෙවා ඇත..

තේ තොග ඉවත් කිරීම

ඉහළ අමු තන්තු මට්ටමක් (16,5% ට වඩා වැඩි) පමණක් පවතින තේ තොග වැඩි දියුණු කිරීම සඳහා සංයුක්ත ගාස්තු ප්‍රතිලාභය මත පදනම්ව තේ වත්ත සඳහා නිකුත් කරනු ලබන අතර වැඩි දියුණු කිරීමෙන් පසු නිෂ්පාදකයාට එම ඉන්වොයිස් අංකයෙන් නැවත නාමාවලියක් සකස් කළ හැකි අතර ක්ෂුද්‍රජීවීන්ගෙන් අපවිත්‍ර වූ තේ ලියාපදිංචි නිෂ්පාදකයාගේ අනුමැතිය ඇතිව ක්ෂණික තේ නිෂ්පාදනයට යොමු කළ හැකිය.

2.3. සිලෝන් තේ ප්‍රවර්ධනය

පහත දැක්වෙන පුළුල් කාණ්ඩ යටතේ වර්ගීකරණය කරන ලද දේශීය හා විදේශීය වෙළඳපොළවල ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තේ ප්‍රවර්ධන අංශයේ වගකීම වේ.

සමාජ මාධ්‍යය, මහජන සම්බන්ධතා සහ අලෙවිකරණය ඔස්සේ ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රචාරණය.

- තේ වර්ගීය ප්‍රවර්ධනය
- ශ්‍රී ලංකාව සතු සිංහ ලාංඡනය සඳහා සන්නාම ප්‍රවර්ධනය
- ජාත්‍යන්තර ආහාර හා පාන වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම
- තේ පරිභෝජනය කරන සියලුම ප්‍රධාන පෙළේ රටවල උපායමාර්ගික වෙළඳපල පිළිබඳ විස්තර සම්පාදනය කිරීම හා බෙදා හැරීම
- තේ කේෂත්‍රය සඳහා ප්‍රතිපත්ති සැකසීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහයෝගය දැක්වීම
- තරගකරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණය
- සිංහ ලාංඡන වෙළඳ ලකුණු ලියාපදිංචිය, අධීක්ෂණය සහ පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට බලය පැවරීම
- භූගෝලීය දර්ශක ලෙස ශ්‍රී ලංකා තේ සහ අනෙකුත් තේ සම්බන්ධ ප්‍රාදේශීය නාමයන් / ලාංඡන ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියග
- ඕසෝන් හිතකාමී හා පිරිසිදු ශ්‍රී ලංකා තේ ලාංඡනය ලියාපදිංචි කිරීම සහ පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට බලය පැවරීම
- සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක- AFD, CIRAD සහ SLTB සමග ත්‍රෛපාර්ශ්වීය ව්‍යාපෘතිය.
- අගය එකතු කළ තේ අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා 05% දිරි දීමනා යෝජනා ක්‍රමය.
- දේශීය තේ ප්‍රවර්ධනය

ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය

ඒක ජාතිය ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය යනු වෙනත් සම්භවයන් ඇති තේ සමග තරගකාරිව ශ්‍රී ලංකා තේ සඳහා ප්‍රචාරණය හා ප්‍රසිද්ධිය ලබා දීමයි. විදේශයන්හි පිහිටුවා තිබෙන තේ ප්‍රචාරණ ඒකක සහ නානාපති සේවාවන්හි ක්‍රියාත්මක වාණිජ්‍ය අංශ මගින් ශ්‍රී ලංකා තෙ මණ්ඩලය විදේශීය වෙළඳපොළවල් තුළ ශ්‍රී ලංකා තේ සඳහා ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන්, එළිමහන් ප්‍රචාරණයන්, තේ පැන් සංග්‍රහ, තේ සම්බන්ධ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මෙන්ම වෙනත් පොදු මහජන ක්‍රියාකාරකම් ආදිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදුකරන ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් අතුරින් ප්‍රධාන වේ.

සමාජ මාධ්‍ය ව්‍යාපාරය - ජාත්‍යන්තර තේ දිනය

තේ වල අඩංගු ආර්ථික, ජීව විද්‍යාත්මක සහ භෞතික ප්‍රතිලාභ පිළිබඳ ප්‍රකාශ කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වාර්ෂිකව මැයි 21 වන දින ජාත්‍යන්තර තේ දිනය සමරනු ලබයි.

'තේ සහ සාධාරණ වෙළඳාම' යන තේමාව යටතේ 2 වන ජාත්‍යන්තර තේ දිනය මෙම වසරේදී ගෝලීය තේ සහෝදරත්වය (The global tea fraternity) විසින් සමරන ලදී. මෙම තේමාවේ මූලික අරමුණ වන්නේ තේ සම්බන්ධයෙන් පවතින ආර්ථිකමය කරුණු ඉහළ නැංවීමයි. විශේෂයෙන්ම, තේ වවන ප්‍රදේශවල දිළිඳු කම ඉහළින්ම පවතින අතර සාධාරණ වෙළඳාමක් පැවතීම ඔවුන්ගේ සම්පත් සංවර්ධනය කිරීම හා ජාත්‍යන්තර වෙළඳපොළට ඇති ප්‍රවේශය වැඩි කිරීමට හේතුවනවා පමණක් නොව දිළිඳුකම පිටුදැකීමට ද උපකාරයක් වේ.

ජාත්‍යන්තර තේ දින සැමරුමට සමගාමීව, චීනය, සෞදි අරාබිය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරානය, ජර්මනිය, ජපානය, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව යන රටවල් 12 ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සමාජ හා ඩිජිටල් මාධ්‍ය ඇතුළු ප්‍රවර්ධන වැඩසටහන් රැසක් දියත් කරන ලදී.

විලි සහ ශ්‍රී ලංකාව විසින් සිලෝන් තේ පිළිබඳ වීඩියෝවක් සහ පල කිරීම් (posts) නිකුත් කරන ලදී. කොවිඩ් 19 වසංගතය හමුවේ වුවද ගෝලීය වශයෙන් තේ පානය කරන්නන් තෘප්තිමත් වන ආකාරයෙන් (golden brew) රන්වන් පානය නිෂ්පාදනය අඛණ්ඩව සිදු කරන තේ කර්මාන්තයේ ධෛර්ය සම්පන්න ශ්‍රම බලකායටශ්‍රී ලංකා තේ සහෝදරත්වය (Sri Lanka tea fraternity) විසින් ආචාරය පුද කරනු ලැබය.



සමාජ මාධ්‍ය ප්‍රචාරක වැඩසටහන්, වෙළඳ දැන්වීම් සහ වීඩියෝ මගින් සැලකිය යුතු ඉලක්ක කණ්ඩායමකට ළඟා වූ අතර ඒ මගින් ඉහළ පිළිගැනීමක් ලබා ඇත.



මහජන සම්බන්ධතා වැඩසටහන්

රටවල් 21 ක තරගකාරී ටෙන්ඩර් ක්‍රියාදාමයන් හරහා Phoenix O & M (Pvt) Ltd විසින් මහජන සම්බන්ධතා කටයුතු සිදු කරන ලදී.

ගෝලීය මහජන සම්බන්ධතා ව්‍යාපාරය 2023 වසරේ දී ක්‍රියාත්මක කෙරෙන අතර එමගින් රුසියාව, ජපානය, චීනය, ඕස්ට්‍රේලියාව, තුර්කිය, ඉරානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සෞදි අරාබිය, ජර්මනිය, චිලි, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, පෝලන්තය සහ ශ්‍රී ලංකාව යන රටවල් ආවරණය කරයි. මෙම ව්‍යාපාරය මාස තුනක කාලයක් සඳහා ඩිජිටල් සහ සමාජ මාධ්‍ය වේදිකාවල ක්‍රියාත්මක කෙරේ. එය තේ කර්මාන්තයේ තිරසාර සාධක මෙන්ම අනෙකුත් තරගකාරී වෙළඳපලවල සිලෝන් තේ අලෙවිය සඳහා ඇති සෘණාත්මක සාධක කෙරෙහි අවධානය යොමු කර ඒවා සාර්ථකව අවම කරනු ඇත.

ගෝලීය ව්‍යාපාරය

රුසියාව තුළ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

වෙළඳපොලෙන් යුක්‍රේනය ඉවත් ඉවත් කිරීම හේතුවෙන් සංශෝධිත ගිවිසුම ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාගේ අනුමැතිය සඳහා යොමු කර ඇත. ඒ අනුව 2023 වසරේ පළමු කාර්තුවේදී මෙම ප්‍රචාරණය ආරම්භ කෙරෙන අතර KOL සක්‍රීය කිරීම්, අත්දැකීම් සහිත නියැදි ගත කිරීමේ ව්‍යාපාර මෙන්ම සෙවුම් යන්ත්‍ර වැඩි දියුණු කිරීම මේ යටතේ රුසියාවේ පැවැත්වීමට සැලසුම් කර ඇත.

මාධ්‍ය සැලසුම් සකස් කිරීම

ගෝලීය ප්‍රචාරණ ව්‍යාපාරයේ උපදේශන ආයතනය වන Dentsu Grant මගින් රුසියාව, යුක්‍රේනය, චීනය, ජපානය, ඕස්ට්‍රේලියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජර්මනිය, තුර්කිය සහ සෞදි අරාබිය සඳහා මාධ්‍ය සැලසුම් සකස් කර ඇත. ඇමරිකා එක්සත් ජනපදය සඳහා ඉතිරිව ඇති අනෙකුත් මාධ්‍ය සැලැස්ම ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉරානය අත්හිටුවා ඇත.

වෙළඳ සල්පිල් සඳහා සහභාගී වීම

ජාතික වෙළඳ නාමයක් සහ සහභාගිවන සමාගම්හි තනි සන්නාමයන් ලෙස ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගත් වෙළඳපලවල ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිවන ශ්‍රී ලංකා තේ අපනයන සමාගම්වලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් පහසුකම් සලසා දුනි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහනාධාරය මගින් බිම් කුලිය සහ කුටිය ඉදිකිරීම සඳහා වන වියදමෙන් 50%ක් ආවරණය කරයි. ඉතිරි පිරිවැය සහ අනෙකුත් වියදම් ප්‍රදර්ශනය සඳහා සහභාගිවන තෝරාගත් සමාගම් විසින් දැරිය යුතුය.

2022 වසරේ පළමු මාස 09 තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පහත සඳහන් වෙළඳ ප්‍රදර්ශන සඳහා පහසුකම් සැලසීම හා සහභාගිවීම සිදු කරන ලදී.

• Gulfood 2022 වෙළඳ ප්‍රදර්ශනය, ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2022 වසරේ පෙබරවාරි මස තේ අපනයන පුද්ගලික සමාගම් 11ක් සමග ඩුබායි හි පැවති Gulfood 2022 සඳහා සහභාගි විය. (Martine Bauer Hayles (Pvt) Limited, Finlays Colombo PLC, Ceyem Commodities (Pvt) Limited, Expo Teas (Pvt) Limited, Regency Teas (Pvt) Limited, Stas- sen Exports (Pvt) Limited, Ceylon Tea Land (Pvt) Limited, Ceylon Tea Marketing (Pvt) Limited, Samley Teas (Pvt) Lim- ited, Orga Consumer Products (Pvt) Limited and Tea Packs (Pvt) Limited)

• Foodex Saudi 2022 වෙළඳ ප්‍රදර්ශනය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2022 වර්ෂයේ මාර්තු මාසයේ දී Basilur Tea Export (Pvt) Limited සමග සෞදි අරාබියේ පෙඩා හි Foodex Saudi 2022 ප්‍රදර්ශනයට සහභාගි විය.



• ප්‍රොඩක්ස්පෝ (PRODEXPO) 2022 - මොස්කව්, රුසියාව

සිලෝන් තේ ප්‍රවර්ධනය එහි 29 වන වාර්ෂික ජාත්‍යන්තර ආහාර නිෂ්පාදන, පාන වර්ග සහ නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය ප්‍රදර්ශනය හෙවත් "PRODEXPO-2022" ප්‍රදර්ශනය වර්ෂ 2022 පෙබරවාරි මස මොස්කව්හි පැවතුනි. "Prodexpo" යනු ප්‍රදර්ශන අවකාශය, වෘත්තීය රුචිකත්වය සහ වෙළඳපල ආවරණය අනුව රුසියාවේ විශාලතම වෙළඳ ප්‍රදර්ශනය වන අතර එය විවිධ සමාගම් සහ රටවල් සමග ජාලගතව ව්‍යාපාරික සම්බන්ධතා ඇති කර ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රවලින් එකක් වශයෙන් සැලකේ.

Ceylon Tea pavilion යටතේ ඇති ශ්‍රී ලංකා තේ සමාගම් වන්නේ Ceylon Fresh Teas (Pvt) Ltd, Jafferjee Brothers, Ceylon Tea Land (Pvt) Ltd, Ceylon Tenny Tea සහ Nature Ceylon Trading (Pvt) Ltd ය.



• IFE ලන්ඩන් 2022 - ExCeL ලන්ඩන්

මහ කොමසාරිස් සරෝජා සිරිසේන මහත්මිය විසින් 2022 වසරේ මාර්තු මාසයේදී ExCeL ලන්ඩන් හි ජාත්‍යන්තර ආහාර හා පාන ප්‍රදර්ශනය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මණ්ඩපය විවෘත කරන ලදී. Ceylon Tea Land Pvt Ltd iy Amber Estate Pvt Ltd මෙම අවස්ථාවට සහභාගි වූ අතර ශ්‍රී ලංකාව සමග සහභාගිවන්නන්ට ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී.



- **HORECA ලෙබනන් 2022 - බේරුට්, ලෙබනන්**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය Ceylon Tea Land (Pvt) Limited සමග 2022 මාර්තු මාසයේදී ලෙබනන් නගරයේ බේරුට් හි HORECA ලෙබනන් 2022 වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී විය. HORECA ලෙබනන් යනු ආගන්තුක සත්කාරක, ආහාර සේවා සහ බීම කර්මාන්ත සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය ව්‍යාපාරික රැස්වීම් සඳහා ප්‍රසිද්ධ ස්ථානයකි. එමෙන්ම, තේ, කෝපි, සිසිල් බීම, බියර් සහ වයින් ඇතුළු විවිධ ආහාර හා සත්කාරක නිෂ්පාදන මෙන්ම සේවාවන් සඳහා වැඩි ප්‍රසිද්ධියක් ලබා ගැනීමට අපේක්ෂා කරන විශ්වීය ප්‍රදර්ශකයින් 350 කට වැඩි සංඛ්‍යාවක් සඳහා ප්‍රසිද්ධ ස්ථානයකි.



- **වර්ල්ඩ් ටී එක්ස්පෝ 2022 - ලාස් වේගාස්, ඇ.එ.ජ**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2022 මාර්තු මාසයේදී ලාස් වේගාස් හි පැවති World Tea Expo - 2022 සඳහා Tea Talk Pvt Ltd, Green House Tea Exports Pvt Ltd සහ Master Tea and Spices Pvt Ltd සමග සහභාගී විය. World Tea Expo යනු තේ කර්මාන්තයට සම්බන්ධ උතුරු ඇමරිකාවේ විශාලතම වාර්ෂික සමුළුව සහ වෙළඳාමයි.



තවද, සිලෝන් තේ පහත සඳහන් වෙළඳ ප්‍රදර්ශණ සඳහා ද සහභාගී විය.

- මැලේසියාවේ MIFB 2022 හි සිලෝන් තේ තැබීම.
- Kursk - රුසියාවේ Korensckar ප්‍රාදේශීය ප්‍රදර්ශනය-2022
- ලෝක ආහාර ප්‍රදර්ශනය 2022, අසර්බයිජානය
- කෝපි, තේ, කොකෝවා පිළිබඳ රුසියානු එක්ස්පෝ 2022
- මොන්ට්‍රියල් හි SIAL Canada 2022
- Anufood බ්‍රසිල් 2022, Sao Paulo, බ්‍රසිල්
- පෝලන්තයේ වෝර්සෝ හි ලෝක ආහාර ප්‍රදර්ශනය
- Uzfo 2022, උස්බෙකිස්ථානය
- ලෝක ආහාර 2022, මොස්කව්
- "Saudi HORECA" ජෙඩාර්, සෞදි අරාබිය
- කොරියාවේ සියාවුල් හි කැෆේ ප්‍රදර්ශනය
- කසකස්ථානයේ Alma thy හි Food Expo කසකස්ථාන් ජාත්‍යන්තර ප්‍රදර්ශනය
- ප්‍රංශයේ SIAL Paris 2022
- ඕස්ට්‍රේලියාවේ Fine Food 2022

ජර්මනියේ ජනමාධ්‍යවේදී ඔලාෆ් තෝමස් මහතා ශ්‍රී ලංකාවට පැමිණීම

ඔලාෆ් මහතා ජර්මනියේ හම්බර්ග් හි සඳහාරකයෙකු වන අතර තේ පිළිබඳ ලේඛකයෙකු වේ. ඔහ GEO, Lufthansa Magazine හා Frankfurter Allgemeine වැනි ජර්මන් භාෂා භාෂාවෙන් මුද්‍රණය කරන සංචාරක මාධ්‍ය ආයතනයක සේවය කරයි. එමෙන්ම, තේ සංස්කෘතිය පිළිබඳ මුද්‍රිත සඟරාවක් වන "t- Das Magazin für Teekultur" (www.t-magazine.net) සම්බන්ධ කටයුතු ද සිදු කරයි. ඇහැමි සංචාරක ක්‍රියාකාරීන් හා තේ වෙළඳුන් හා සම්බන්ධ වෙමින් තම ශ්‍රී ලංකා සංචාරයේ දී ඔලාෆ් මහතා විසින් සංචාරය හා තේ පිළිබඳ ගැඹුරු පර්යේෂණ සිදු කරන ලදී.

2022 වසරේ මැයි මාසයෙදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඔහු සඳහා උඩරට ප්‍රදේශයට දෙදින සංචාරයක් සංවිධානය කළ අතර තේ වගාවන් හා කර්මාන්ත නැරඹීමට අනුග්‍රාහකත්වය ද සපයන ලදී.

තම "t-magazine" සඳහා ඔලාෆ් මහතා ශ්‍රී ලංකාවේ තේ වගා කරනු ලබන ප්‍රදේශවල සංචාරය කිරීම පිළිබඳ විස්තරයක් ඇතුලත් කරන ලද අතර ශ්‍රී ලංකාවේ තිරසාර තේ වගා කිරීමේ සහ සැකසීමේ නව ක්‍රම පිළිබඳ නව දැක්මක් ද ඇතුලත් කරන ලදී.



පවිත්‍රී පිරිස්: ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අධ්‍යක්ෂ, සමග තේ මොහොත.

Hospitality news-Middle east විසින් අධ්‍යක්ෂක (ප්‍රවර්ධන) පවිත්‍රී පිරිස් මහත්මිය සමග සිලෝන් තේ මොහොතේ දී ඵලදායී සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වූ අතර "සිලෝන් තේ ලොව පුරා ජනප්‍රිය වුයේ ඇයි" යන්න ඇය විසින් පැහැදිලි කරන ලදී.

https://www.hospitalitynewsmag.com/ceylon-tea/?fbclid=IwAR3G0w9J1ZN3wu-_JTVOC02Ea0SMoFhbv7FP-2dGtmD3gUIbxG0Bz3-bUyHI



කොළඹ වරායේ මගී නෞකාවල සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු

මගින් 700ක් සහ කාර්ය මණ්ඩලය 300ක් රැගත් "Silver Spirit" මගී යාත්‍රාව කොළඹ වරායේදී සිලෝන් තේ විසින් පිළිගන්නා ලදී.



සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සිංහ ලාංඡනය සහිත තේ අපනයනකරුවන්ට ඔවුන්ගේ සන්නාම ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍යාධාර සැපයීමයි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ස්ථාපිත ප්‍රවර්ධන සහ අලෙවිකරණ බද්දෙන් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුදල් ලබා දෙන ලදී. 2022 ඔක්තෝම්බර් මාසයේදී වැඩසටහන සඳහා ලැබුණු අමාත්‍ය මණ්ඩල තීරණය සහ ඒ අනුව ගෙවීම් පියවීම්/ ප්‍රතිපූරණය ඇමරිකානු ඩොලර් මගින් ගනුදෙනුව සිදු වූ දිනයේ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කෙරේ.

සමාගම් 22ක් රටවල් 45ක නම සන්නාම ප්‍රවර්ධන කටයුතු සිදුකිරීමට සුදුසුකම් ලබා ඇති අතර 2022 වසර සඳහා ව්‍යාපෘති 80ක් වනුවෙන් ගිවිසුම් අත්සන් කර අපනයන ප්‍රමාණය පදනම් කරගෙන ඉලක්ක සකස් කරන ලදී.

වත්මන් අර්බුදකාරී තත්ත්වය හමුවේ ඉදිරි ගමන් මග වෙනුවෙන් රුසියාවේ සහ යුක්රේනයේ ව්‍යාපෘති සඳහා අයදුම්කරුවන්ගෙන් යෝජනා / ප්‍රතිපෝෂණ ලබා ගත් අතර ඇගයීම් කමිටුවේ තීරණය ලබා ගැනීම සඳහා එම කමිටුව වෙත යොමු කිරීමට ඔවුන්ගේ යෝජනා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ලිඛිතව එවන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් යෝජනා පරීක්ෂා කර බලා රුසියානු සන්නාම ප්‍රවර්ධන ව්‍යාපෘති සඳහා ගිවිසුම් කාලය 2023 මාර්තු 31 දක්වා තවත් මාස 3 කින් දීර්ඝ කිරීමට තීරණය කරන ලදී. තවද, යුක්රේන වෙළඳපොළ සඳහා ද සන්නාම ප්‍රවර්ධන ව්‍යාපෘතිය පැවැත්වීමට මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

අගය එකතු කළ තේ සඳහා 5% දිරි දීමනා යෝජනාක්‍රමය (කි.ග්‍රෑම් 3ට අඩු)

අගය එකතු කළ තේ අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2022 දී අගය එකතු කළ තේ (කි.ග්‍රෑම් 3ට අඩු) සඳහා 5% දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. අගය එකතු කළ තේ අපනයනය කරන තේ අපනයනකරුවන් මෙම යෝජනා ක්‍රමය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබා ඇත. ඔවුන් විසින් පහත නිර්ණායක සම්පූර්ණ කළ යුතුය.

- ලින් වර්ෂය සඳහා තේවල අගය එකතු කළ කාණ්ඩයේ මුළු ආදායම පාදක වර්ෂයට වඩා වැඩි විය යුතුය. (ශුද්ධ ආදායම ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය අනුපාතය ලෙස)
- අගය එකතු කළ තේ කාණ්ඩයෙන් (සිරියාව සඳහා පමණක් තේ බෑග්, කි.ග්‍රෑම් 3ට අඩු තේ පැකට්, ක්ෂණික තේ සහ පානය සඳහා සුදානම් කළ තේ සහ කිලෝග්‍රෑම් 5 ට අඩු තේ ඇසුරුම්) උපයාගන්නා ලද අපනයනවල වර්ධක වටිනාකම මත 05% දිරි දීමනාවක් ගෙවනු ලැබේ.

දිරි දීමනා ක්‍රමය අදාළ වන්නේ අගය එකතු කළ තේ අපනයන ආදායම මත පදනම් ව පමණි.
2021 හා 2019 වසරවලදී අගය එකතු කළ තේ අපනයනය සැලකිල්ලට ගනිමින් අගය එකතු කළ තේ අපනයනකරුවන් 290 ක් සඳහා මෙම ඇගයීම සිදු කරන ලදී. ඉහත නිර්ණායක මත පදනම්ව, සුදුසුකම් ලත් අගය එකතු කළ තේ අපනයනකරුවන් 92 දෙනෙකුට යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමි විය. මෙම අගය එකතු කළ තේ අපනයනකරුවන් 92 දෙනෙකුට 5% දිරිදීමනා ලබා දීම සඳහා රුපියල් මිලියන 571.71ක් අවශ්‍ය වේ. භාණ්ඩාගාර අනුමැතිය ලැබුණු විගස දිරි දීමනා ලබා දීම සිදු කෙරේ.

තානාපති කාර්යාල සමඟ වැඩසටහන්

තුර්කියේ BTL ප්‍රවර්ධනය

2022 පෙබරවාරි 04 වන දිනට යෙදෙන 74වන නිදහස් දින සැමරුම වෙනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ සහයෝගයෙන් තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සිලෝන් තේ සහ ස්වභාවික සුන්දරත්වය විදහා දක්වන පුවරු ප්‍රදර්ශනය කරයි.



බ්‍රසීලයේ සිලෝන් තේ ප්‍රවර්ධනය

- **බ්‍රසීලියා හි වෙළඳ සහ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන**

බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් 2022 පෙබරවාරි මස බ්‍රසීලියා හි Patio Brazil සාප්පු සංකීර්ණයේදී ශ්‍රී ලංකා වෙළඳ සහ සංචාරක ප්‍රවර්ධන උත්සවයක් පවත්වන ලදී.

ශ්‍රී ලාංකේය ප්‍රදර්ශන කුටිය තුළ විවිධ වර්ගයේ සිලෝන් තේ, කුරුඳු සහ කුළුබඩු, පොල් නිෂ්පාදන, හස්ත කර්මාන්ත, මේස පැදුරු සහ අත්‍යවශ්‍ය තෙල් ආදී ශ්‍රී ලාංකීය නිෂ්පාදන රාශියක් ප්‍රදර්ශනයට තබන ලදී.

බ්‍රසීල ජාතිකයන් 800 කට අධික පිරිසක් අලංකාර ලෙස සරසා තිබූ

කුටිය නැරඹීමට පැමිණ අතර ඔවුන්ට සිලෝන් තේ සහ ශ්‍රී ලාංකීය ආහාරවල රස විඳීමට අවස්ථාව ලැබිණි. රට සමගාමීව, ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ විවිධත්වය පිළිබඳව නරඹන්නන් හට අවබෝධයක් ලබා දෙන ලදී.



- **බ්‍රසීලයේ Goiás හි ප්‍රවර්ධන අවස්ථාව**

බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2022 සැප්තැම්බර් මාසයේදී බ්‍රසීලයේ Goiás ප්‍රාන්තයේ ශ්‍රී ලංකා වෙළඳ සබඳතා පවත්වන ලදී. Goiás යනු බ්‍රසීලයේ වේගයෙන්ම වර්ධනය වන ප්‍රාන්තවලින් එකක් වන අතර දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් බිලියන 42 කට වඩා වැඩිය. එමෙන්ම, වාණිජ, කෘෂිකර්ම, පශු සම්පත්, පතල් කැණීම්, ආහාර සහ ඖෂධ නිෂ්පාදන ආදියෙහි ප්‍රමුඛ රටකි.



- **INNOVA සමූළුව - බ්‍රසීලියා**

බ්‍රසීලියා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2022 වසරේ INNOVA සමූළුවට සහභාගි විය. INNOVA සමූළුව ලතින් ඇමරිකාවේ විශාලතම වෙළඳ හා කාර්මික ප්‍රවර්ධන උත්සවයක් වන අතර එය ව්‍යවසායකයින්, කුඩා හා මධ්‍ය පරිමාණ සමාගම් සහ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින් ලතින් ඇමරිකානු කලාපය තුළ නව සොයාගැනීම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.



- **බ්‍රසීලියානු මාධ්‍ය තුළින් සිලෝන් තේ, සංචාරක කර්මාන්තය හා ශ්‍රී ලාංකීය අහාර ප්‍රවර්ධනය කිරීම.**

බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2022 දෙසැම්බර් 21 වැනි දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී තානාපති කාර්යාලයේ වෙළෙඳ හා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන්වල කොටසක් වශයෙන් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය, ආහාර සහ සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීම සඳහා බ්‍රසීලියාවේ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යවේදීන් සමග සැසියක් පැවැත්විය.



බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2022 දෙසැම්බර් 21 වැනි දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී තානාපති කාර්යාලයේ වෙළෙඳ හා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන්වල කොටසක් වශයෙන් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය, ආහාර සහ සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීම සඳහා බ්‍රසීලියාවේ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යවේදීන් සමග සැසියක් පැවැත්විය.

තේ වගාවේ ඉතිහාසය, තේ දළු කෝප්පයට ගෙන ඒමේ ක්‍රියාවලිය සහ සිලෝන් තේවල සුවිශේෂී ලක්ෂණ ඉස්මතු කරමින් තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක (වාණිජ) විසින් සිලෝන් තේ පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. අවසානයේදී, ආරාධිතයින්ට රාත්‍රී භෝජන සංග්‍රහයක් ලබා ගැනීමටත්, සිලෝන් තේවල විවිධ ප්‍රභේද සහ රසයන්හි රස විඳීමටත් අවස්ථාව සලසා දෙන ලදී.

සෞඛ්‍ය හා අධ්‍යාපන ප්‍රදර්ශනය 2022 - සිංගප්පූරුව

සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලාංකේය ආහාර නිෂ්පාදන, තේ සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ අදහසින් 2022 ජූලි 24 ඉරිදා සිංගප්පූරුවේ FAST Hub හි පැවති 07 වන සෞඛ්‍ය හා අධ්‍යාපන ප්‍රදර්ශනය 2022 සඳහා සහභාගි විය. සමාජ සහයෝගිතාවය හා පුහුණුව සඳහා අවශ්‍ය විදේශ ගෘහ සේවිකාවන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද සෞඛ්‍ය හා අධ්‍යාපන ප්‍රදර්ශනය වසර 10කට වැඩි ඉතිහාසයක් ඇති සිදුවීම්වලින් එකකි. මෙවර උත්සවයට සිංගප්පූරු පාර්ලිමේන්තුවේ කථානායක Tan-Chuan-Jin මහතා විසින් අනුග්‍රහය දැක්වූ අතර අමුත්තන් 700කට අධික පිරිසක් සහභාගි වූහ.

සිංගප්පූරු ජාතිකයින් මෙන්ම සිංගප්පූරුවේ වෙසෙන විදේශිකයන් අතර ශ්‍රී ලාංකික තේ ප්‍රචලිත කිරීමේ අරමුණින් තේ පාන සේවාවක් ප්‍රදර්ශන කුටිය තුළ ක්‍රියාත්මක කරන ලද බැවින් පිරිසිදු ලංකා තේ කෝප්පයක රස බැලීමට ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියට විශාල වශයෙන් නරඹන්නන් පැමිණෙන ලදී. ශ්‍රී ලංකාවට වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස නරඹන්නන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා, සිංගප්පූරුවේ ශ්‍රී ලංකන් ගුවන් සමාගම, ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමග මෙම අවස්ථාවට සහභාගි විය.



එක්සත් රාජධානියේ ලංකා තේ ප්‍රවර්ධනය

- **එක්සත් රාජධානියේ Bedford River Festival 2022**

සිලෝන් තේ රස බලමින් සහ විස්තර විමසමින් සිටින ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියට පැමිණි අමුත්තන්



- **එක්සත් රාජධානියේ නොවින්හැම් හි 2022 මාස්ටර්ස් හොකී ලෝක කුසලාන තරඟය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රවර්ධන කටයුතු**





කත්මණ්ඩු හි ආහාර පාන සහ ආගන්තුක සත්කාර ප්‍රදර්ශනය



නේපාලයේ කත්මන්ඩු හි 2022 සැප්තැම්බර් මාසයේ සිට පවත්වන ලද ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය එක්ව 8 වැනි ආහාර සහ පාන වර්ග හා ආගන්තුක සත්කාර ප්‍රදර්ශනය සමග සිලෝන් තේ සහ කුරුඳු ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

ජාත්‍යන්තර තේ දිනය 2022 සැමරීම සහ දකුණු අප්‍රිකාවේ සිලෝන් තේ ප්‍රවර්ධනය

දකුණු අප්‍රිකාවේ ප්‍රිටෝරියා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් 2022 වසරේ ජාත්‍යන්තර තේ දිනය සමරනු ලැබුවේ දකුණු අප්‍රිකාවේ පැවති ලෝක ආහාර උළෙලේ දී 2019 වසරේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2019 වසරේ දීර්ඝ ඉතිහාසය සහ ගැඹුරු සංස්කෘතික හා ආර්ථික වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සඳහාය.



යුනෙස්කෝ ජාත්‍යන්තර තේ දින සැමරුම්වල ලංකා තේ භාවිතයට තැබීම - ප්‍රංශය

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර තේ දිනය නිමිත්තෙන් පැරිසියේ යුනෙස්කෝ සංවිධානය විසින් ජාත්‍යන්තර තේ දිනය සමරනු ලැබිය. ප්‍රංශ-චීන සංස්කෘතික හා කලාත්මක හුවමාරු මධ්‍යස්ථානය සමග එක්ව පැරිසියේ යුනෙස්කෝ ප්‍රජා සංගමය විසින් සංවිධානය කරන ලද මෙම අවස්ථාවට ආරාධිතයින් 200 කට අධික සංඛ්‍යාවක් සහභාගි වූ අතර ප්‍රධාන වශයෙන් තානාපතිවරුන් සහ අනෙකුත් සම්භාවනීය ආරාධිතයින් ඇතුළු සාමාජික රටවල යුනෙස්කෝ නියෝජිතයින් සහභාගි විය. පැරිසියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මෙම උත්සව සැන්දෑවේ සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන සංවිධානය කරන ලදී.



ජපානය තුළ සිලෝන් තේ ප්‍රවර්ධනය

ජපානයේ තේ සංගමය විසින් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමග එක්ව සංවිධානය කරන ලද ශ්‍රී ලංකා තේ පිළිබඳ සම්මන්ත්‍රණයක් 2022 ජූනි මස තානාපති කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. ජපාන පාරිභෝගිකයන් අතර ශ්‍රී ලංකා තේ ව්‍යාප්ත කිරීමේ අරමුණින් සංවිධානය කරන ලද

මෙම අවස්ථාවට ජපානයේ තේ ලෝලීන් 35කට අධික පිරිසක් සහභාගි වූහ.



විදේශ මාධ්‍ය සඳහා සිලෝන් තේ ප්‍රවර්ධනය - ජපානය



"සිලෝන් තේ පිළිබඳ ඉගෙන ගනිමු" සම්මන්ත්‍රණය ජපානයේ විදේශ වාර්තාකරුවන්ගේ සංගමය විසින් පවත්වන ලදී. ඉහල මට්ටමේ සිලෝන් තේ, එහි රසයන් සහ ගමනාන්තයන් විදහා දක්වන ලද මෙම අවස්ථාවට මාධ්‍යවේදීන් 70 කට අධික පිරිසක් සහභාගි වූහ.

ලෝක ආහාර ප්‍රදර්ශනයේ සිලෝන් තේ ප්‍රදර්ශනාගාරය 2022 - පිලිපීනයේ මැනිලාහිදී

















WOFEX යනු පිලිපීනයේ ආහාර පාන කර්මාන්තයේ වඩාත්ම අපේක්ෂිත වාර්ෂික වෙළඳ කටයුතු අතර පවතින්නකි. ලෝක ප්‍රකට සන්නාමයක් සහිත සිලෝන් තේ, සැපයුම් දාමය ශක්තිමත් කිරීමට සහ ඒවායේ අපනයනය සහතික කිරීමට රජය සහ කර්මාන්ත පාර්ශවකරුවන් විසින් ආරම්භ කරන ලද ක්‍රියාකාර් ක්‍රියාමාර්ග හරහා පවතින අභියෝග හමුවේ රදා පැවතීමේ හැකියාව අඛණ්ඩව වර්ධනය කර ගනිමින් සිටි.

පිලිපීනයේ ජාත්‍යන්තර බසාර් හි සිලෝන් තේ අලෙවිය සඳහා තිබීම

මැනිලා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2022 නොවැම්බර් මස පිලිපීනයේ Pasay City හි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පැවති අන්තර් ජාතික බසාර් 2022 සඳහා සහභාගී විය. සුප්‍රසිද්ධ සිලෝන් තේ සන්නාමයන් වන Dilmah, Basilur සහ George Steuarts හි දේශීය බෙදාහරින්නන් සමග එක්ව, තානාපති කාර්යාලය විසින "Sri Lanka Pavilion" සංවිධානය කරන ලද්දේ රටේ හොඳම විශේෂාංග වන සිලෝන් තේ, කුළුබඩු, කෝපි සහ සංචාරක ව්‍යාපාරයක් ලෙස සිදු කරන ගණුදෙනු ප්‍රදර්ශනය කිරීම සඳහාය.





ශ්‍රී ලංකා දිනය - ලෙබනනය සහ සිරියාව





ශ්‍රී ලංකා දින ප්‍රදර්ශනය, වීදි ආහාර සැණකෙළිය සහ ජායාරූප ප්‍රදර්ශනය 2022 සැප්තැම්බර් 17 වන දින Achrafiyeh හි ශාන්ත ජෝන් ක්‍රිසොස්ටොම් ආසන දෙවිමැදුරේදී පැවැත්වුණු අතර ලෙබනනයේ මැති ඇමතිවරුන්, අධිකරණ, රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව, ඉහළ නිලධාරීන්, මාධ්‍යවේදීන් ඇතුළු ලෙබනන් සහ ජාත්‍යන්තර ප්‍රජාව රැසක් සහභාගි වූහ. එමෙන්ම, ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිලෝන් තේ සාම්පල ලබා දෙන ලදී.

වර්ගීය තේ ප්‍රවර්ධනය

වෙනත් පාන වර්ග සමග තරගකාරීව තේ ප්‍රවර්ධනය කිරීම මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය යටතට ගැනේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම, ඇඑජ. තේ සංගමය, එක්සත් රාජධානියේ ජාත්‍යන්තර තේ කම්ටුවල ජපාන තේ සංගමය සහ කැනඩාවේ තේ සහ ශාක සංගමය යනාදියෙහි සාමාජිකයෙකි. මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය කාර්යයන් මෙම ආයතන විසින් ඉටුකරනු ලබයි. පාරිභෝගික දැනුවම්දී කිරීම සහ මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් තුළින් ප්‍රවර්ධනය කරනු ලබන තේ සහ සෞඛ්‍ය යන සංකල්පය කෙරෙහි වර්ගීය තේ ප්‍රවර්ධනය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය කැනඩාවේ තේ සහ ඔසු සංගමයේ, ජපාන තේ සංගමයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ තේ කවුන්සිලයේ සාමාජිකයෙකු ලෙස පසුගිය වසර කිහිපය තුළ අඛණ්ඩව කටයුතු කළේය. 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ලැබුණු ප්‍රවර්ධන යෝජනා මත පදනම්ව සංගම්වල වාර්ෂික දායකත්වයක් ලබා දෙමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සිය සාමාජිකත්වය අලුත් කරන ලදී.

තේ පිළිබඳ FAO / IGG 24 වන සැසිවාරයට ශ්‍රී ලංකාව සහභාගිවීම.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය සහ තේ කර්මාන්තයේ අනෙකුත් පාර්ශ්වකරුවන් 2022 පෙබරවාරි 23 වැනි දින අතථ්‍ය ආකාරයෙන් පවත්වන ලද තේ පිළිබඳ FAO/IGG හි 24 වැනි සැසිවාරයට සහභාගි වූහ.

සැසිය තුළදී පහත කරුණු අවධානයට යොමු කරන ලදී.

1. වත්මන් ගෝලීය තේ වෙළෙඳපොළ තත්ත්වය සහ මතුවෙමින් පවතින ගැටළු.
2. තෝරාගත් තේ නිෂ්පාදනය කරන රටවල සහ පරිභෝජනය කරන රටවල වෙළඳපල සංවර්ධනය.
3. තේ වෙළඳපොළට කොවිඩ් 19 බලපෑම පිළිබඳ වට මේස සාකච්ඡාව.
4. පහත සඳහන් ක්‍රියාකාරී කණ්ඩායම්වල සභාපතිවරුන්ගේ වාර්තා.

අ. උපරිම අවශේෂ මට්ටමේ ක්‍රියාකාරී කණ්ඩායම
ආ. තේ වෙළඳාම සහ ගුණාත්මකභාවය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
ඇ. කාබනික තේ පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
ඈ. දේශගණික විපර්යාස පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
ඉ. ගෝලීය තේ වෙළෙඳපොළ විශ්ලේෂණය සහ ප්‍රවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
ඊ. කුඩා වතු හිමියන් පිළිබඳ වැඩ කරන කණ්ඩායම

ශ්‍රී ලංකාව තේ වෙළඳාම සහ ගුණාත්මකභාවය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සභාපතිවරයා වූ අතර ශ්‍රී ලංකා කම්ටුවේ සම සභාපතිවරුන් සහ අනෙකුත් සාමාජිකයින්ගේ අදහස් විමසා එහි වාර්තාව තේ සම්බන්ධ FAO/IGG හි ප්‍රධාන සැසියට ඉදිරිපත් කළේය. තවද, කොවිඩ් 19 වසංගතය තුළ තේ කර්මාන්තය මුහුණ පෑ අභියෝග සහ ලබා ඇති ජයග්‍රහණ පිළිබඳ ක්ෂේත්‍ර ආවරණය කරමින් වෙළඳපල සංවර්ධනය සහ ඉස්මතු වෙමින් පවතින ගැටළු පිළිබඳව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

ජපාන තේ සංගමය මගින් සිලෝන් තේ ප්‍රවර්ධනය

දිනය	සම්මන්ත්‍රණය හා තේමාව
අප්‍රේල් 9, අප්‍රේල් 13	තේ උපදේශක පන්තිය: දිඹුල
අප්‍රේල් 20,23	තේ උපදේශක පන්තිය: නුවරඑළිය
අප්‍රේල් 23,27	උපදේශක පන්තිය: ඌව සහ අනෙකුත් නිෂ්පාදන ප්‍රදේශය
අප්‍රේල් 23	ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සම්මන්ත්‍රණය: තේ සම්මන්ත්‍රණය
මැයි 13	තේ උපදේශක පන්තිය: ලංකා තේ නිෂ්පාදන ප්‍රදේශය: දිඹුල, නුවරඑළිය, ඌව
මැයි 14,25	තේ උපදේශක පන්තිය: සිලෝන් තේ නිෂ්පාදන ප්‍රදේශය: දිඹුල, නුවරඑළිය, ඌව
මැය 24	තේ පිළිබඳ විශේෂ පාඩම: ලෝක තේ නිෂ්පාදනය, දිඹුල, ශ්‍රී ලංකාව
ජුනි 5	තේ උපදේශක පන්තිය: සිලෝන් තේ නිෂ්පාදන ප්‍රදේශය: දිඹුල, නුවරඑළිය, ඌව
ජුනි 21	තේ පිළිබඳ විශේෂ පාඩම: ලෝක තේ නිෂ්පාදන ප්‍රදේශ , ඌව තේ රස බැලීම
ජුනි 25	ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සම්මන්ත්‍රණය: තේ සම්මන්ත්‍රණය, දිඹුල
ජුනි 19	තේ පිළිබඳ විශේෂ පාඩම: කළු තේ, සිලෝන් තේ සහ සැන්දෑ තේ වල ඉතිහාසය
ජුනි 27- 29	ටෝකියෝ හි Big Site JTA's වල ජපන් කැෆේ රෙස්ටුරන්ට් තුළ සාමාජිකයන් 13 දෙනෙකු Dilmah, Mabroc සහ තවත් බොහෝ වතුවලින් ලබා ගත් තේ වැනි සිලෝන් තේ සන්නාම ප්‍රදර්ශනයට තැබිය. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ප්‍රදර්ශනයට සහභාගි විය.
සැප් 5	තේ උපදේශක පන්තිය: ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන ප්‍රදේශ, දිඹුල, නුවර එළිය, ඌව තේ රස බැලීම
ඔක් 13	තේ පිළිබඳ පාඩම: ලෝකයේ තේ නිෂ්පාදන ප්‍රදේශ, ශ්‍රී ලංකාව, දිඹුල, නුවර එළිය, ඌව තේ රස බැලීම
නොවැ 13	JTA විසින් සම අනුග්‍රහය දැක්වූ සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සහාය ලබා දුන් Owariasahi නගරයේ තේ උත්සවය
නොවැ 28	ශ්‍රී ලංකා තනාපති කාර්යාලයේ සම්මන්ත්‍රණය: ඌව
පෙබ 26	ශ්‍රී ලංකා තනාපති කාර්යාලයේ සම්මන්ත්‍රණය: මැදරට තේ

කැනඩාවේ තේ සහ ඔසු සංගමය විසින් සිදු කරන ලද සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු

සැප්තැම්බර් මාසයේදී උතුරු ඇමරිකානු තේ සම්මේලනය (NATC)

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සියලුම නියෝජිතයන් සඳහා අත් පත්‍රිකා සහ තේ සාම්පල ලබා දෙන ලදී. මෙම සියලුම ද්‍රව්‍ය ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරනු ලබන මේසයේ ප්‍රදර්ශනය කර ඇති අතර සම්මන්ත්‍රණ සඳහා සහභාගිවන සියලුම නියෝජිතයින්ට රැගෙන යාම සඳහා තබනු ලැබේ.

ශ්‍රී ලංකාව ඇතුළු තේ නිෂ්පාදනය කරන රටවලින් මෙම අවස්ථාවට බොහෝ වශයෙන් සම්බන්ධ වීම පුදුම සහගත විය. ප්‍රදර්ශනයට තබා ඇති ද්‍රව්‍ය

හැරුණු විට, රන් පදක්කම් තරගය සඳහා සිලෝන් තේ සාම්පල 48ක් (විවිධ සමාගම් 11කින්) ඉදිරිපත් කර තිබිණි. සම්භවය අනුව හොඳම තේ කෝප්පය තෝරාගෙන තරගය විනිශ්චය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජයග්‍රාහකයන් පහත පරිදි වේ.

1. වන ස්ථානය: RTS හෝල්ඩිනස - අව්ස්සාවේල්ල තේ කර්මාන්ත ශාලාව, අව්ස්සාවේල්ල, සිතාවක, සබරගමුව (Orthodox Black FBOP)
2. වන ස්ථානය: Browns Plantations High For est, Maturata (Uva High), Orthodox Black, Mountain Whisper

NATC සම්මාන: තිරසාර සම්මාන උළෙලේ සම්මාන අතර ශ්‍රී ලංකාවේ තේ සමාගම් ඉදිරියෙන් මෙනම මධ්‍යයේ ද පසුවිය. සම්මාන උළෙලට සහභාගිවන නියෝජිතයින්ට කියවීම සඳහා සියලුම ව්‍යාපෘති විස්තර සහිත සංදර්ශකයක් සකසන ලදී.

- ජයග්‍රාහකයා : Kaley Natural Farms (Pvt) Ltd. (සොබාදහම, කෘෂිකර්මය, ප්‍රජාවන්, පාරිභෝගිකයින් සහ ආර්ථික විද්‍යාව එකට සම්බන්ධවී පවතින ව්‍යාපාර ආකෘතියක් ස්ථාපිත කිරීම)
- අනුශූරතාව: Horana Plantations PLC (HPL –Rooftop Solar PV Bundle Project)

- WEBINAR: කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය සිලෝන් තේ මාර්ග සිතියම 2030"

- SIP Magazine: Sip magazine යනු කාර්තුමය වශයෙන් THAC විසින් ඩිජිටල් ආකාරයෙන් පල කරනු ලබන සඟරාවකි. මෙහෙක් අවසානයට නිකුත් කළ සඟරාවේ ශ්‍රී ලංකාවෙන් තේ සම්භවය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුලත් විය.



- **සමාජ මාධ්‍යය**:

මාසික තේමා අලෙවි දින දර්ශන සඳහා ගැළපෙන ශ්‍රී ලංකා තේ පිළිබඳ විස්තර බෙදා ගැනීම Facebook/ Instagram/Twitter සහ tea.ca හරහා සිදු කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් THAC සමග නවත් ප්‍රවර්ධන වීඩියෝ තුනක් බෙදා ගන්නා ලදී.



- **අනාගත සත්කාරකයින් දැනුම්වත් කිරීම**

ජෝර්ජ් බ්‍රවුන් විද්‍යාලයේ (කැනඩාවේ ඉහළම සුපශාස්ත්‍ර ආයතනය) සත්කාරක වැඩසටහන සඳහා THAC වාර්ෂිකව ආරාධිත කථිකයෙක් ගෙන්වා ගනී. ආහාර පානාදියෙන් සේවා සපයනු ලබන විවිධ අවස්ථාවන්හි දී අමුත්තන් සඳහා තේ යනු කුමක්ද සහ එය නිසි ලෙස පිළියෙළ කරන්නේ කෙසේද යන්න පිළිබඳව අනාගත ආගන්තුක සත්කාර සේවකයින් දැනුවත් කිරීම පිළිබඳ දේශනයෙන් අවධානය යොමු කරන ලදී. කළු තේ ඇතුළු තෝරාගත් නිෂ්පාදන රටවලින් විවිධ තේ වර්ග සහ තේ රස බැලීම සිදු විය.

ඇමරිකා එක්සත් ජනපදයේ තේ කවුන්සිලය විසින් සිදු කරන ලද සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු

තේ සහ මානව සෞඛ්‍යය පිළිබඳ භයවන ජාත්‍යන්තර විද්‍යාත්මක සාකච්ඡා සභාව

ව්‍යාපාරයේ අරමුණු වූයේ එක්සත් ජනපදයේ ආහාර මාර්ගෝපදේශ කමිටුව සමඟ වඩා හොඳ සෞඛ්‍යයක් උදෙසා පානයක් ලෙස සැබෑ තේ (කළු, හරිත, සුදු, තද වර්ණ) පිළිගැනීමට ලක් කිරීම සඳහා තේ සහ මානව සෞඛ්‍යය පිළිබඳ නවතම පර්යේෂණ සමබන්ධයෙන් දැනුම්වත් කිරීම ය. සම්මන්ත්‍රණයේදී තේ වල සෞඛ්‍ය ප්‍රතිලාභ රැසක් පිළිබඳ සාකච්ඡා කරන ලදී.

ප්‍රතිඵලයක් ලෙස; පර්යේෂකයන්, විශ්ව විද්‍යාල සාමාජිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ලියාපදිංචි අහාරවේදීන් සහ මාධ්‍ය වලින් සමන්විත සක්‍රියව සහභාගි වූ 660ක පිරිසක් ඇතුළුව 1,260 ලියාපදිංචි කිරීම් සිදු කරන ලද අතර මේ දක්වා මාධ්‍ය ස්ථානගත කිරීම් 414ක් සිදු කර ඇත. බිලියන 5.2ක අදහස් ලබා ගෙන ආහාර මාර්ගෝපදේශවල තේ සඳහා හිමි ස්ථානය පිළිබඳ සාකච්ඡා කරන ලදී. අනාගත ප්‍රවෘත්ති සඳහා විශ්වාසය ලබා ගැනීමේ මාවත සකස් කර ඇත. සාර්ථකව සම්මන්ත්‍රණ සිදු කිරීමෙන් පසු තේ පිළිබඳ අබණ්ඩව විශ්වසය ගොඩනගන ලදී.



ජාතික උණුසුම් තේ දිනය හා ජාතික උණුසුම් තේ මාසය 2022

සමාජ මාධ්‍ය අදහස් මිලියන 12.2ක් එකතු කර ගන්නා ලදී (2021 වර්ෂයේ මිලියන 7.6ක ප්‍රමාණයට සාපේක්ෂව)

TikTok හි #IndividualiTEA hashtag අදහස් 287.2K ප්‍රමාණයක් සකස් කරන ලදී.



ජාත්‍යන්තර තේ දිනය 2022: **සංඛ්‍යාව අනුව පාරිභෝගිකයන් සම්බන්ධ වීම**

සමාජ මාධ්‍ය හරහා පාරිභෝගිකයින් ආමන්ත්‍රණය කරමින් ජාත්‍යන්තර තේ දිනය සහ #Plant To Cup hashta පිළිබඳ දැනුවත් කිරීම අරමුණ විය. මේ වසරේදී, ඇමරිකා එක්සත් ජනපදයේ තේ කවුන්සිලය විසින් විවිධ තේ වගා කරන කලාප ඇතුළත් කරමින් ලොව පුරා සිටින අනුගාමිකයන්ට "තේ රස බැලීමට" ආරාධනා කරන ලදී. මෙම පල කිරීම් මගින් තේ නිෂ්පාදනයේ යෙදී සිටින ලක්ෂ සංඛ්‍යාත පුද්ගලයින්ව සමරනු ලබයි. තේ සහ සෞඛ්‍ය පිළිබඳ මෑත කාලීනව පවත්වනු ලබු සාකච්ඡා මණ්ඩපයේ ප්‍රධාන කරුණු සහ තේ ආශ්‍රිත බොහෝ සෞඛ්‍ය හා පාරිසරික ප්‍රතිලාභ අන්තර්ගතය තුළ විය.



2022 වසරේ දී 72,703ක් කරා ළඟා විය.
2022 වසරේ දී වෙළඳ දැන්වීම් - 4,659
සමාජ මාධ්‍ය පල කිරීම් - 20

භූගෝලීය දර්ශක යටතේ ලංකා තේ, කලාපීය නම් සහ ලාංඡන ලියාපදිංචි කිරීම

සිලෝන් තේ නාමය සහ අනෙකුත් කෘෂි දේශගුණික කලාපීය තේ වර්ග හත (නුවර එළිය, උඩ පුස්සැල්ලාව, දිඹුල, ඌව, නුවර, සබරගමුව සහ රුහුණ) භූගෝලීය දර්ශකයන් ලෙස සුරැකීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ TRIPS ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවශ්‍ය නීති සහ රෙගුලාසි සම්පාදනය කරන ලදී. මෙමගින් විශේෂයෙන්ම කොන්ත්‍රාත් පදනමේ කටයුතු කරන විදේශීය ඇසුරුම් කරුවන් විසින් සිලෝන් තේ නාමය සහ කලාපීය වශයෙන් ඉස්මතු වෙමින් පවතින අනෙකුත් තේ නාම අවභාවිත කිරීම වැලැක්වීමට සහායවීම පමණක් නොව භූගෝලීය දර්ශකයන් යටතේ අලෙවි කෙරෙන ශ්‍රී ලංකා තේ සඳහා අගය සහ නියම මිල එකතු කිරීම ද සිදුකෙරේ.

සිලෝන් තේ ලියාපදිංචි කිරීම; සිලෝන් තේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා උපදෙස් ලබා දුන් අතර වර්තමානයේ දී තුර්කිය, ටියුනීසියා සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මේ සම්බන්ධ කටයුතු සිදු වෙමින් පවති.

සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම

GI ව්‍යාපෘතියේ ගෝලීය පරමාර්ථය වන්නේ "සිලෝන් තේ" සඳහා භූගෝලීය දර්ශකයක් සහ අද්විතීය නත්ත්ව සහ තිරසාරබව සහතික කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීමට සහාය වීමයි. එම ඉදිරි දර්ශනය තුළ, ජාතික සහ ජාත්‍යන්තර සහතික කිරීම් සමගින් බුද්ධිමය දේපළ ආරක්ෂාව, විශේෂයෙන්ම භූගෝලීය දර්ශක ඔස්සේ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ වැඩිදියුණු කළ අගය එකතු කිරීමත් සමග "සිලෝන් තේ" වටිනාකම් දාමය වඩාත් ඵලදායී, අන්තර්කරණ, සහ තිරසාර බවට පත් වේ. තිරසාර බව එහි ආර්ථික, පාරිසරික සහ සමාජීය අංශ ඔස්සේ සලකා බලනු ලැබේ.

භූගෝලීය තොරතුරු (GI) දර්ශකයක් යනු නිශ්චිත භූගෝලීය සම්භවයක් සහ එම සම්භවය හේතුවෙන් ක්‍රියාවලි ගුණාංග හෝ කීර්තිනාමයක් සහිත නිෂ්පාදන සඳහා භාවිත කරන සලකුණකි. භූගෝලීය තොරතුරු දර්ශකයක් ලෙස ක්‍රියා කිරීම සඳහා, යම් නිෂ්පාදනයක් යම් සුවිශේෂී ස්ථානයකින් සම්භවය ලබන බවට සලකුණ විසින් හඳුනාගත යුතුය.

- ආචාර්ය ඩෙල්පින් සහ ආචාර්ය ක්ලෙයාර් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් සමග ශ්‍රී ලංකාවේ තේ පාර්ශවකරුවන්ගේ ස්ථාන නැරඹූ අතර ඔවුන්ව මුණ ගැසුණි. ඇයගේ කණ්ඩායම නුවර එළිය, බණ්ඩාරවෙල, ආගරපතන, තලවකැලේ සහ දෙණියාය යන ප්‍රදේශවල සංචාරය කළේය.
- UNIDO ඉවත් වීම පිළිබඳ ගැටලු ඇති වූ අතර සියලු තාක්ෂණික කටයුතු CIRAD වෙතට මාරු කරන ලදී.
- 2022 අප්‍රේල් 21 සිට 27 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනට කළ තම දෙවෙනි සංචාරයේ දී GI තාක්ෂණික උපදේශකයින් වගා පාර්ශවකරුවන් මුණ ගැසෙන ලදී.
- 2022 මැයි 09 සිට ජුනි 13 දක්වා භූගෝලීය දර්ශක පිළිබඳ හැඳින්වීම සම්බන්ධයෙන් වූ e-Asia GI මාර්ගගත පුහුණුව සඳහා ශ්‍රී ලංකාවෙන් 14 දෙනෙකු සහභාගී විය.

සිලෝන් තේ වටිනාකම් දාමය සහ තිරසාර ප්‍රමිතීන් පිළිබඳ සහභාගිත්ව ඔඩියමිගත කිරීම

සිලෝන් තේ භූගෝලීය දර්ශකයක් වශයෙන් ලියාපදිංචි කිරීම ඉලක්ක කරගත් උපාය මාර්ගයක් සඳහා සිලෝන් තේ අගය දාමය ඔස්සේ සිතියම් අභ්‍යාස සිදු කිරීම හා ක්‍රමානුකූල සීමාවන්.

- වටිනාකම් දාමය සහ තිරසාරබව සහතික කිරීමේ විශේෂඥ, Dr.Aurélie Carimentrand, ජුනි 16 සිට 28 දක්වා ශ්‍රී ලංකාව තුළ තම කාර්ය භාරය සම්පූර්ණ කරන ලදී. සිලෝන් තේ සඳහා දැනට පවතින පිළිගැනීම් සහ භූගෝලීය දර්ශක පාලන සැලැස්ම සහ සිතියම් සමග ගොඩනගා ගත හැකි සහ සම්බන්ධතා සිතියම්ගත කිරීම සහ දැනටමත් පවතින සොයා ගැනීමේ හැකියාව සහ පාලන පද්ධති තක්සේරු කිරීම සිදු කරන ලදී.
- කෘෂි විද්‍යාඥ හා හෞමික සංවර්ධන විශේෂඥ Mr. Jimmy Balouzat සහ Dr. Clare විසින් තේවල තිරසාරබව සහතික කිරීම සහ අගය දාම සොයාගැනීම් පිළිබඳ විශ්ලේෂණය 2022 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සම්පූර්ණ කරන ලදී. පසුව, සිලෝන් තේ නිෂ්පාදන ක්‍රමවේද පිළිබඳ සිතියම්ගත කිරීම 2022 සැප්තැම්බර් 23 වැනි දින භූගෝලීය තාක්ෂණික ක්‍රියාකාරී කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලදී.





සහභාගිත්ව කලාපීය වැඩමුළු

2022 මාර්තු සිට ඔක්තෝම්බර් දක්වා කාලය ශ්‍රී ලංකාවේ තේ වවනාකම් දාමය සිතියම්ගත කිරීම සඳහා යොදා ගන්නා ලදී. සාමූහික ගතිකයක් (වවනාකම් දාම සිතියම්ගත කිරීම) සකස් කිරීම සඳහා මෙන්ම තේ වගාකරුවන් සහ තේ නිෂ්පාදකයින් යන දෙඅංශයෙන්ම සිලෝන් තේවල නිශ්චිත ගුණාත්මක භාවයට දායක වන ප්‍රධාන මුලද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා (නිෂ්පාදන පිළිවෙත් හා පද්ධති සිතියම්කරණය) දෙඅංශයටම වඩාත්ම ප්‍රයෝජනවත් අංග සැපයීමට ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදු කර ඇත.

මෙම සහභාගිත්ව ක්‍රියාවලියේ දෙවන පියවර වන්නේ තේ අගය දාමය භූගෝලීය දර්ශක ගොඩනැගීමේ ක්‍රියාවලියට සම්බන්ධ කිරීමයි (2022 නොවැම්බර් සිට 2023 ජූනි දක්වා). ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ප්‍රමාණාත්මක විශාලබව සැලකිල්ලට ගෙන, ව්‍යාපෘති කණ්ඩායම විසින් ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදන ප්‍රදේශයම ආවරණය වන පරිදි කලාපීය වැඩමුළු 3කින් සමන්විත දීර්ඝ උපදේශන ක්‍රියාවලියක් යෝජනා කරන ලදී. ඉදිරි මාස කිහිපය තුළ දියුණු ඉගෙනුම් ක්‍රියාවලියක් සැකසීම අරමුණයි.

මෙම සමස්ථ ක්‍රියාවලිය පිරිවිතර පොතට ඇතුළත් කළ යුතු තේරීම් සහ විකල්ප සම්බන්ධයෙන් සිදු කරනු ලබන සාකච්ඡාවලින් සමන්විත වේ. මෙය ක්‍රියාත්මක කිරීමේ අදියර සඳහා ප්‍රයෝජනවත් වනු ඇති අතර තේ ක්ෂේත්‍රයේ බොහෝ පාර්ශවකරුවන් සංඛ්‍යාවක් විසින් නව මෙවලමක (GI) ලබා ගැනීමට මෙමගින් පහසුකම් සැලසේ. පළමු වැඩමුළු මාලාව 2022 නොවැම්බර් 22 සිට 30 දක්වා තෝරාගත් ප්‍රදේශයන්හි පහත රට, මධ්‍යම සහ උඩ රට තේ වගා කරන ප්‍රදේශවල පාර්ශවකරුවන් (ඉලක්ක කණ්ඩායම - තේ කම්හල්/වතු හිමියන්, සහකාර තේ කොමසාරිස්වරුන්, තේ පරීක්ෂකවරුන්, තේ පර්යේෂණ ආයතන නිලධාරීන්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, කුඩා වතු දිස්ත්‍රික් සමිති) සමඟ පවත්වන ලදී. නොවැම්බර් වැඩමුළුවල ප්‍රධාන අරමුණු වූයේ:

1. අගය දාමය තුළ බොහෝ ප්‍රේක්ෂක පිරිසකට (ඉලක්කගත කණ්ඩායමට ඔබ්බෙන්) භූගෝලීය දර්ශක පිළිබඳ ප්‍රධාන සංකල්ප හඳුන්වා දීම සහ සිලෝන් තේ සඳහා එමගින් ඇතිවිය හැකි ප්‍රතිලාභ ඉදිරිපත් කිරීම.
2. සුවිශේෂී ලක්ෂණ සහිත සිලෝන් තේවල නිශ්චිත නිෂ්පාදන භාවිතයන් සාමූහිකව වලංගු භාවයට පත් කිරීම.
3. පිරිවිතර පොත තුළ සිලෝන් තේ තත්ත්වය නිශ්චිතව නිර්වචනය කිරීම සඳහා විවිධ විකල්ප යෝජනා කිරීම.
4. ඉලක්ක කණ්ඩායමේ විවිධ කොටස් සඳහා එක් එක් පිරිවිතරවලින් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ සාකච්ඡා කිරීම. සෑම වැඩමුළුවකදීම ප්‍රේක්ෂක ප්‍රතිපෝෂණ ලබා ගැනීමට අවශ්‍ය කාලය ලබා දෙනු ලැබේ.

CIRAD විසින් 2022 නොවැම්බර් මාසයේදී සියලුම සහකාර තේ කොමසාරිස් කලාපයන්හි ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කිරීම සහ සොයාගැනීමේ හැකියාව පිළිබඳ ක්ෂේත්‍ර මට්ටමේ තොරතුරු ලබා ගැනීම සඳහා කලාපීය වැඩමුළු පවත්වන ලදී.

සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක පද්ධතිය ක්‍රියාත්මක කිරීම - නොවැම්බර් රැස්වීම

බදුරලිය කලාපයේ තේ කර්මාන්ත පාර්ශවකරුවන් සඳහා කන්දේගෙදර උමා ගාර්ඩන් හෝටලයේ දී නොවැම්බර් 22 දින පවත්වන ලද වැඩමුළුව






මාතර කලාපයේ තේ කර්මාන්ත පාර්ශවකරුවන් සඳහා පිටබැද්දර සාරා ග්‍රෑන්ඩ් හෝටලයේ දී නොවැම්බර් 23 දින පවත්වන ලද වැඩමුළුව




ගාල්ල කලාපයේ තේ කර්මාන්ත පාර්ශවකරුවන් සඳහා ගාල්ල හසාරා හෝටලයේ දී නොවැම්බර් 24 දින පවත්වන ලද වැඩමුළුව




රත්නපුර කලාපයේ තේ කර්මාන්ත පාර්ශවකරුවන් සඳහා පැල්මඩුල්ල සිල්වර් රේ හෝටලයේ දී නොවැම්බර් 25 දින පවත්වන ලද වැඩමුළුව





තේ කර්මාන්ත පාර්ශවකරුවන් සඳහා බදුල්ල හෙරිටේ ෆ්‍රැන්ඩ් හෝටලයේ දී නොවැම්බර් 28 දින පවත්වන ලද වැඩමුළුව





නුවර එළිය කලාපයේ තේ කර්මාන්ත පාර්ශවකරුවන් සඳහා නුවර එළිය බිලැක් පුල් හෝටලයේ දී නොවැම්බර් 29 දින පවත්වන ලද වැඩමුළුව





නුවර කලාපයේ තේ කර්මාන්ත පාර්ශවකරුවන් සඳහා නුවර ඕක් රේ රිජන්සි හෝටලයේ දී නොවැම්බර් 30 දින පවත්වන ලද වැඩමුළුව





Lydia Gautier මහත්මිය විසින් සිදු කරන ලද සංවේදී විශ්ලේෂණය

ප්‍රංශයේ පුරෝගාමී තේ රස බලන්නෙකු සහ තේ හාරකරුවෙකු මෙන්ම තේ පිළිබඳ පරිශීලන පොත් කිහිපයක කතුවරියක් වන ලිඩියා ගෝටියර් මහත්මිය සිලෝන් තේ සඳහා වූ භූගෝලීය දර්ශක ව්‍යාපෘතියේ තාක්ෂණික උපදේශකවරියක් ලෙස සම්බන්ධ වේ. ඇය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ රස බැලීමේ මණ්ඩලයට සම්බන්ධ වී නව විතානකන්දේ තේ කර්මාන්ත ශාලාව නැරඹීය.







මෙම සාමූහික සාකච්ඡා මගින් සිලෝන් තේ භූගෝලීය දර්ශකවල පිරිවිතර හා පාලන ව්‍යුහය සකසා අවසන් කර තහවුරු කිරීමට අපේක්ෂා කෙරෙනි.

වෙළඳ සලකුණෙහි සුරක්ෂිතබව

සිංහ ලාංඡනය වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම

සිලෝන් තේ සිංහ ලාංඡන වෙළඳ සලකුණෙහි නෛතික හිමිකරුවා වනුයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල සිලෝන් තේ සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම / අලුත් කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අංශය මගින් කරනු ලබයි. 2022 වසර වන විට සිංහ ලාංඡනය රටවල් 103ක ලියාපදිංචි කර ඇත. සිංහ ලාංඡනය භාවිත කිරීමේ අධිකාරිය ප්‍රදානය කර ඇත්තේ 100% ක්ම ශ්‍රී ලංකා තේ අඩංගු, ISO 3720 ප්‍රමිතියට අනුකූල, එක් එක් වෙළඳපොළවල අවම ප්‍රමිතියට වඩා ඉහළින් වූ අගය එකතු කළ තේ නිෂ්පාදන (තේ මළු සහ ඇසුරුම්) සන්නාමයන් සඳහා පමණක් වන අතර ඒවා ශ්‍රී ලංකාවේ පෙර ඇසුරුම් කරන ලද ඒවා ද විය යුතුයි.

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, තුර්කමෙනිස්තානය, පකිස්ථානය, ඉන්දියාව, බංග්ලාදේශය, මොරොක්කෝව, සෝමාලියාව, උස්බෙකිස්තානය, අසර්බයිජානය සහ කිර්ගිස්තාන් ජනරජය යන රටවල නව සිංහ ලාංඡනයක් (සිලෝන් තේ; ගුණාත්මකබවේ සලකුණ - සිංහ ලාංඡනය සහිත) ලියාපදිංචි කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මුලිකත්වය ගෙන ඇත. හොංකොං, ජෝර්දානය, සර්බියාව සහ රුසියාව යන රටවල නව ලියාපදිංචිය සම්පූර්ණ කර ඇත. තවද, සිංහ ලාංඡන අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබා දී ඇති අතර දැනට එම කටයුතු කාම්බෝජය, ලාඕසය, මැලේසියාව, වියට්නාමය සහ සියරා ලියෝන් යන රටවල ක්‍රියාත්මක වෙමින් පවතී.

ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ ලාංඡනය ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව සහතික සලකුණක් ලෙස ශ්‍රී ලංකාව තුළ ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ලියාපදිංචි කර ඇත. මොන්ට්‍රියල් ගිවිසුම (Montreal Protocol) අනුව නිරෝධායනීය නොවන හා පූර්ව බෙදාහැරීමේ අරමුණු සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය නතර කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරන ලදී. එහෙයින්, ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදනය කරන ලොව පළමු රට බවට ශ්‍රී ලංකාව පත් වූ අතර, නවමත් මෙම සම්මානය ලත් එකම තේ නිෂ්පාදනය කරනු ලබන රට වනුයේ ශ්‍රී ලංකාව යි.

2022 කාලසීමාව තුළ, "ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ සහ ලාංඡනය" අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබා දී ඇති අතර දැනට එම කටයුතු රුසියාව, ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ මැලේසියාව යන රටවල ක්‍රියාත්මක වේ. එක්සත් රාජධානිය සහ යුරෝපා සංගමය ලියාපදිංචිය අලුත් කිරීම සම්පූර්ණ කර ඇත. සන්නාම නමයක් සඳහා ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ ලාංඡනය භාවිත කිරීම සඳහා තේ අපනයනකරුවන් නම දෙනෙකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයවෙතින් වරලත් අයිතිය ලබාගෙන ඇත.



"ලෝක ඕසෝන් දිනය" වෙනුවෙන් 2022 සැප්තැම්බර් 16 වැනි දින Daily Mirror පුවත්පත විශේෂ අතිරේකයක් ප්‍රකාශයට පත් කරයි. මොන්ට්‍රියල් ප්‍රොටොකෝලය මගින් "ඕසෝන් හිතකාමී" සම්මානයෙන් පිදුම් ලැබූ එකම වර්ගය සිලෝන් තේ වන බැවින් සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය එය ගෝලීය අලෙවිකරණ ව්‍යාපාරය සඳහා සුවිශේෂී අලෙවිකරණ

සැලැස්මක් වශයෙන් භාවිත කරන බැවින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රතිපත්තිමය වශයෙන් මෙම විශේෂ දින අතිරේකයට සහාය දීමට එකඟ වී ඇත. ඒ අනුව, Daily Mirror හි "ලෝක ඕසෝන් දිනය 2022" විශේෂ සංස්කරණය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිළිබඳ වෙළඳ දැන්වීම පිටුවෙන් හතරෙන් එකක් වන පරිදි පල කරනු ලැබේ.

විදේශීය තේ ප්‍රවර්ධන කාර්යාල සහ වෙළඳපල ආවරණය

වත්මනේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය රුසියාවේ සහ චීනයේ ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුබද්ධ කලාපීය විදේශීය තේ ප්‍රවර්ධන ඒකක දෙකක් පවත්වාගෙන යයි. මොස්කව්හි කාර්යාලය මගින් රුසියානු සමූහාණ්ඩුවේ සහ පොදු රාජ්‍ය මණ්ඩල වෙලඳපොලවල තේ ප්‍රවර්ධන කටයුතු සිදු කරයි. චීනය වර්ධනය වන වෙළඳපොළක් ලෙස හඳුනාගෙන ඇති අතර චීනයේ ප්‍රවර්ධන ඒකකය සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීමට සහ සිලෝන් තේවල වෙළඳපල කොටස වැඩි දියුණු කිරීමට ක්‍රියා කරයි. ඉහත කලාප හැර, විදේශයන්හි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමග සහයෝගයෙන් කටයුතු කරනු ලැබේ.

තේ ප්‍රවර්ධන ඒකකය - චීනය

ජාතික උත්සව සැමරීම

ශ්‍රී ලංකාව සහ චීනය 2022 දී රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ගොඩනඟා ගැනීමේ 65 වැනි සංවත්සරය සමරනු ලැබීය. මීට අමතරව, 2022 දී රබර් - සහල් ගිවිසුම අත්සන් කිරීමේ 70 වැනි සංවත්සරය ද දෙරටම විසින් සමරනු ලැබීය. චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් එහි ශ්‍රවණාගාරයේ දී ඉහත අවස්ථාවන් දෙක සැමරීමේ උත්සවයේ දී සිලෝන් තේ රස බැලීමේ උත්සවයක් පැවැත්විය. දෙරට අතර ආර්ථික, වෙළෙඳ, ආයෝජන, සංචාරක සහ ජනතාව අතර සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම සැමරුම් යොදා ගැනේ. වෙළෙඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් යටතේ තානාපති කාර්යාලයේ තේ ප්‍රවර්ධන ඒකකය විසින් චීන පාරිභෝගිකයන් අතර සිලෝන් තේ පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරකම් රැසක් සංවිධානය කරන ලදී. පළමු මුලපිරීම ලෙස, තානාපති කාර්යාලය වටකර පාර දෙසට මුහුණ ලා ඇති වැටේ සිලෝන් තේ ප්‍රවර්ධන ආලෝක පෙට්ටි සවි කරන ලදී.



Stassen, Impra, Lions, Sinolan, Baudin Mountain, Shan Teas, Steurt Tea සහ Fond Tea නියෝජනය කරමින් චීනයේ සිලෝන් තේ නියෝජිතයන් මෙම අවස්ථාවට සහභාගී වූ අතර සහභාගිවන්නන්ට තම නිෂ්පාදන ප්‍රදර්ශනය කළහ.

තානාපති ආචාර්ය කොහොන මහතා පිළිගැනීමේ කථාවක් පවත්වමින් සිලෝන් තේවල සෞඛ්‍ය ප්‍රතිලාභ පිළිබඳව අවධාරණය කළේය. දෙවන ලේකම් සහ තේ ප්‍රවර්ධන නිලධාරී සම්පත් පෙරේරා මහතා විසින් සිලෝන් තේ පිළිබඳව සවිස්තරාත්මකව හඳුන්වා දුන් අතර උත්සවය අවසානයේ සහභාගිවන්නන්ට සිලෝන් තේ සඳා ගන්නා ආකාරය සහ තේ රස බැලීමේ ආකාරය ප්‍රදර්ශනය කළේය.

2022 ජාත්‍යන්තර තේ දිනයේදී සිලෝන් කළු තේ ප්‍රවර්ධනය කිරීම

හොඳම සිලෝන් තේ, ලෙමන් තේ සහ කිරි තේ කෝප්පය සකස් කිරීම පිළිබඳ ආදර්ශනයක් පවත්වනු ලැබූ අතර ප්‍රශ්න හා පිළිතුරු සැසිය මඟින් සිලෝන් තේවල සුවිශේෂී ගුණාංග පිළිබඳව වැඩි විස්තර සපයන ලදී.

සහභාගී වූ සියලුම දෙනාට සිලෝන් තේවලින් සංග්‍රහ කරන ලදී. මෙම උත්සවයේදී ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය තේ වර්ග සහ චීන ගැණුම්කරුවන් විසින් ආනයනය කරන ලද ප්‍රධාන තේ වර්ග ප්‍රදර්ශනය කරන ලදී.



සිලෝන් තේ ප්‍රචාරණය සඳහා සජීවී විකාශන සැසි මාලාව

සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීම සඳහා සජීවී විකාශන සැසි මාලාවක් සිමාසහිත Dalian Xingyu Yuanmeng Group Co. Ltd හි සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකා නිෂ්පාදන, විශේෂයෙන්ම සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීම සඳහා සජීවී සැසි මාලාවක් සංවිධානය කරන ලදී. මූලික රැස්වීම 2022 පෙබරවාරි මාසයේදී පැවැත්විණි.



මොස්කව්හි තේ ප්‍රවර්ධන ඒකකය

ජාත්‍යන්තර සම්බන්ධතා වැඩසටහන, මොස්කව් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලය



රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් 2022 සැප්තැම්බර්

29 වන දින මොස්කව් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා වැඩසටහනේ රුසියානු සිසුන්ගේ සංචාරයක් සංවිධානය කරන ලදී.

- 2022 මැයි 19 සිට 20 දක්වා Baku Brovo Hyper Market තුළ සිලෝන් තේ සන්නාම සජීවීකරණ වැඩසටහන.
- 2022 මැයි 19 සිට 20 දක්වා Baku Rahat Super Market සිලෝන් තේ සන්නාම සජීවීකරණ වැඩසටහන.
- රුසියාවේ මොස්කව් හි රුඩන් විශ්වවිද්‍යාලයේ සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන - බහු සංස්කෘතික උත්සවය.



- Korzinka Super Market තුළ සිලෝන් තේ සන්නාම සජීවීකරණ වැඩසටහන- Azimova (Oybek Metro), Tashkent, උස්බෙකිස්ථානය.
- උස්බෙකිස්ථානයෙ Korzinka වෙළඳ දාමයේ ඊළඟ සාප්පු සංකීර්ණයේ සිලෝන් තේ සන්නාම සජීවීකරණ වැඩසටහන.

මොස්කව් හි "CHASHKA" උත්සවය, 2022 **අගෝස්තු** 27-28





2022 **වසරේ රුසියාවේ Korensckar හි Kursk තුළ කලාපිය ප්‍රදර්ශනය**



2022 **නොවැම්බර් 03 සහ 04 දිනවලදී "Jubilee" සුපිරි වෙළඳසැලෙහි සිලෝන් තේ සන්නාම සජීවීකරණ වැඩසටහන.**







රුසියාවේ පීටස්බර්හි රුබින් තේ හල හි වෙළඳ නාම ක්‍රියාකාරකම්





එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ එක්ස්පෝ ඩුබායි හි සිලෝන් තේ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

World Expo Dubai ප්‍රදර්ශනය 2021 ඔක්තෝබර් සිට 2022 මාර්තු දක්වා ඩුබායිහි පැවැත්විය. මාස හයක ප්‍රදර්ශනය තුළ දී ජාතීන් 190ක් "Connecting Minds, Creating the Future. යන තේමාව හා අවස්ථාව, වල්‍යතාවය සහ තිරසාරබව යන උප තේමාවන් යටතේ තමන්ගේම කුටියක් තුළ තම ප්‍රදර්ශන පැවැත්විය. මෙම අවස්ථාව මගින් ලොව පුරා විසිර සිටින නරඹන්නන් මිලියන 25ක පමණ ප්‍රමාණයක් අපේක්ෂා කරන ලදී.

මැද පෙරදිග වෙළඳ පොළ සිලෝන් තේ සඳහා වැදගත් වේ. මන්ද යත් එම කලාපය මගින් ශ්‍රී ලංකාවේ තේ අපනයනයෙන් 55%ක් පමණ ප්‍රමාණයක් ලබා ගන්නා හෙයින් සහ කලාපය තුළ එහි නත්වය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය සපුරාලන හෙයිනි. ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශන මණ්ඩපය තුළ මාස හයක ප්‍රදර්ශන කාල වකවානුව තුළ දී සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග එක්ව කටයුතු කරන ලදී. ප්‍රදර්ශනය පුරාවට සිලෝන් තේවල සැබෑ රසය නරඹන්නන්ට අත් විඳීමට සැලැස්වීම සඳහා සිලෝන් තේ රස බැලීමේ සැසි සහ දියර තේ සේවාවන් සංවිධානය කරන ලදී.







අඩු ක්‍රියාකාරිත්වයක් සහිත වෙළඳපල නැවත අත්කර ගැනීම

සිලෝන් තේ සම්බන්ධයෙන් අඩු ක්‍රියාකාරී වෙළඳපල නැවත අත්පත් කර ගැනීමේ සංකල්පය යටතේ සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන් රුසියාව/පකිස්ථානයේ/එක්සත් රාජධානියේ දී පවත්වන ලදී. මෙය විශේෂ ව්‍යාපෘතියක් වූ අතර තේ කර්මාන්තය නගා සිටුවීම කෙරෙහි අවධානය යොමු විය.

එක්සත් රාජධානිය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2022 වසරේ දී පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා නිල තේ සැපයුම්කරු ලෙස බර්මින්හැම් හි දී අනුග්‍රහය දැක්වීය. ලෝක ප්‍රකට තේ සන්නාම වන සිලෝන් තේ Dilmah තේ, English Tea Shop සහ Tea Tang යනාදිය මෙම අවස්ථාව සඳහා පිළිගන්වන ලදී.



- **එක්සත් රාජධානියේ තේ ඇකඩමි ප්‍රවර්ධනය**

එක්සත් රාජධානියේ තේ ඇකඩමිය සඳහා ජේමිස් සුරංග පෙරේරා සහ ජේන් පෙටිග්‍රෙව් යන අය විසින් සත්කාරකත්වය සපයා ඉදිරිපත් කරන ලද එක්සත් රාජධානියේ ප්‍රථම සිලෝන් තේ යුගල කිරීමේ උත්සවය සඳහා ලොව පුරා සිටින සිල්ලර වෙළෙන්දන් සහ පුහුණුකරුවන් ඇතුළුව තේ විශේෂඥයින්, ව්‍යාපාර සහ පුහුණු ලාභීන් 25 කට අධික සංඛ්‍යාවක් සහභාගී විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2023 වසරේ දී යුගල කිරීමේ අවස්ථාවල දී සිය තේ සඳහා ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී.

රුසියාව

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කයිරෝවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහය ඇතිව සිලෝන් තේ සන්නාමයන් අතර සිංහ ලාංඡනය හොඳම සිලෝන් තේ සොයන වෙළඳපොලේ ධනවත් පාරිභෝගික පිරිස තුළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රුසියාවට ශ්‍රී ලංකා තේ අපනයනය කරන සමාගම් සමග එක්ව සිලෝන් තේ අලෙවි සැලක් කයිරෝවේ Dandy සාප්පු සංකීර්ණය තුළ විවෘත කිරීමේ මූලික කටයුතු ආරම්භ කළේය.

පකිස්ථානය

පකිස්තානය යටතේ ශ්‍රී ලංකාවෙන් පකිස්ථානයට අගය එකතු කළ තේ නිෂ්පාදන සම්බන්ධ නිශ්චිත රීති හඳුන්වාදීම සඳහා පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳ ගිවිසුම යටතේ ආයෝජන සහ මෝටර් රථ අංශය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ 3 වැනි රැස්වීමට ඉදිරිපත් කළ යෝජනාවක් අනුව භාවිතයට නොගත් කෝටාව යටතේ තිරුබදු ප්‍රතිලාභ භුක්ති විඳීමට යෝජනා විය. මේ පිළිබඳ ශාඛ්‍යතාවයන් සොයා බැලීම සඳහා මෙම යෝජනාව අනුකමිටුව වෙත යැවීමට පාකිස්තානය එකඟ විය.

අගය එකතු කළ තේ පැකට් සඳහා කරච්චි හි තේ සැලක් පිහිටුවීමට කරච්චි හි පිහිටි කොන්සල් කාර්යාලය වෙතට පකිස්ථානයේ සිටින ආයෝජකයින්ගෙන් යෝජනා ලැබී ඇත.

දේශීය තේ ප්‍රවර්ධනය

දේශීය වෙළඳ සංදර්ශන

- **Galle food fest 2022 ආහාර සහ සංගීත උළෙල**







ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් Galle Food Fest 2022 හි දී සිලෝන් තේ සඳහා ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරන ලද අතර එය පෙබරවාරි 26 සිට 27 දක්වා ගාලු කොටුව අධිකරණ චතුරශ්‍රයේදී පැවැත්විණි.

- **බටහිර සුළඟ උත්සවය**

මෙම උත්සවය බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩලය විසින් 2022 මාර්තු 4 සහ 5 යන දිනවල සංවිධානය කරන ලද අතර එය අලුතින් නිම කරන ලද මැරීන් ඩ්‍රයිව් හි පැවැත් වූ අතර එමගින් වැඩි ප්‍රමාණයක් සංචාරකයින් සහ තරුණ ශ්‍රී ලාංකිකයින් ආකර්ෂණය කර ගත හැකි විය.




- **තානාපති සැන්දෑවේ සංස්කෘතික ප්‍රදර්ශනය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2022 පෙබරවාරි 19 වන දින නෙළුම් පොකුණේදී බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද තානාපතිවරුන්ගෙ සංස්කෘතික ප්‍රදර්ශනයේ දී සිලෝන් තේ සඳහා වෙනම ස්ථානයක් සකස් කරන ලදී.





- **ජංගම සේවා වැඩසටහන හා ප්‍රදර්ශනය - දෙණියාය**




දෙණියාය මධ්‍ය මහා විද්‍යාලයේ පැවති මෙම උත්සවයට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මාතර තේ කොමසාරිස් අංශය සමගින් සහභාගි විය.

සඟරාවල අනුග්‍රාහකත්ව / දැන්වීම්

1. සිලෝන් තේ පිළිබඳ ලිපිය - ලෝකයේ හොඳම තේ "සිලෝන් තේ"පිළිබඳ ශ්‍රව්‍ය දෘශ්‍ය පටයක්, විස්තර සහිත පෝස්ටර් / අත්පත්‍රිකා, ඔවුන්ගේ ඉල්ලීම පරිදි, 74 වන නිදහස් දින සැමරුමේදී භාවිතා කිරීම සඳහා විදේශ දූත මණ්ඩල වෙත ලබා දීමට විදේශ අමාත්‍යාංශයට යවන ලදී.
2. "නිදහස් අරුණළු" වාර්ෂික සඟරාවේ දැන්වීම.
3. The Big Life සඟරාවේ සිලෝන් තේ පිළිබඳ ලිපිය.
4. ජාත්‍යන්තර තේ දිනය සඳහා අනුග්‍රහය (2022 දෙසැම්බර් 15) Star Tamil TV හි විශේෂ වැඩසටහන.
5. 2022 ජාත්‍යන්තර තේ දිනය සැමරීම නිමිත්තෙන් සිලෝන් තේ ප්‍රවර්ධන වීඩියෝව, වෙබ් පෝස්ට් නිර්මාණය කර සමාජ මාධ්‍ය වේදිකාවල පළ කිරීමට ලිපියක් සකස් කර ඇත. මෙය විදේශ අමාත්‍යාංශය හරහා විදේශ දූත මණ්ඩල වෙත ද බෙදා හරින ලදී.
6. ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලයේ 30 වැනි වාර්ෂික අපනයන සම්මාන උළෙල 2022 සඳහා අනුග්‍රාහකත්වය.

තිළිණ තේ - දේශීය අවස්ථාවන්

ශ්‍රී ලංකා තේ මණ්ඩලය එක් එක් විශේෂ අවස්ථාවන්වලදී ඉලක්කගත ප්‍රේක්ෂකයින් අතර සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විශේෂ වැඩසටහන් සඳහා සිලෝන් තේ ලබා දෙමින් විවිධ පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩව සබඳතා ශක්තිමත් කරයි. තිළිණ වශයෙන් සිලෝන් තේ ලබා දුන් 2022 වසරේ දී එහි වටිනාකම රු. 40,000ක් විය.

රට තුළ ප්‍රවර්ධන ව්‍යාපාර (අනෙකුත් ජාතික ආයතන සමඟ එකාබද්ධ ප්‍රවර්ධන කටයුතු)

- NCE සම්මාන උළෙල - තේ සහ තේ නිෂ්පාදන අංශයට අනුග්‍රහය. 29 වැන NCE සම්මාන උළෙල ජනවාරි 21 වැනි දින ෂැංග්‍රිලා හිදී පැවැත්වුණු අතර තේ සහ තේ නිෂ්පාදන අංශය සඳහා ප්‍රධාන අනුග්‍රාහකයා ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය කටයුතු කළ අතර තේ සහ තේ නිෂ්පාදන අංශය ආවරණය වන පරිදි 30 වැනි NCE අපනයන සම්මාන සඳහා අනුග්‍රහය දැක්වීය.





- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ හා මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලේ දී ලංකාවට පැමිණෙන ගුවන් යානා සඳහා සිලෝන් තේ පිරිනමමින් විශේෂ ප්‍රවර්ධන කරයුතු සිදු කිරීම




තේ කෞතුකාගාරය

පසුගිය වසරේ දී කියුබා නානාපතිත Andres Marcelo Gonzalez Garri- do විසින් තේ කෞතුකාගාරය නරඹන ලදී.





ආරක්ෂක උපදේශකයින් ශ්‍රී ලංකාවේ සංචාරය කරන අතරවාරයේදී රටවල් 13ක ආරක්ෂක නියෝජිතයන් විසින් සිලෝන් තේ කෞතුකාගාරය නරඹන ලදී.





පේරාදෙණිය උද්භිත උද්‍යානයේ සිලෝන් තේ කෞතුකාගාරය මගින් පවත්වනු ලැබූ "The Botanical Garden GALA" වැඩසටහන.



වැවිලි කම්කරු ප්‍රජා සංවර්ධනය සහ ස්වභාවික ආපදා සහන ආධාර

කොවිඩ් 19 වකවානුව තුළ ප්‍රතිශක්තිය ඉහල නැංවීමේ ක්‍රමයක් වශයෙන් කාර්යමණ්ඩලයේ හා රෝගීන්ගේ පරිභෝජනය සඳහා ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශවල පිහිටි රජයේ රෝහල්වලට රුපියල් මිලියන 1,2ක වටිනාකමකින් යුත් සිලෝත් තේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මෙම පරිත්‍යාගය ඔවුන් විසින් ඉහලින්ම අගය කරන ලදී.



- පකිස්ථානයේ ගංවතුරෙන් හානියට පත් ජනයාට ශ්‍රී ලංකාව විසින් සිලෝන් තේ ලබා දීම.

ශ්‍රී ලංකා රජය Jinnah ජාත්‍යන්තර ගුවන් තොටුපලේදී 2022 සැප්තැම්බර මස දී පකිස්ථානයේ ගංවතුරට ලක් වූ ජනයා සඳහා සිලෝන් තේ තොගයක් බාර දෙන ලදී.





- **ප්‍රීතිමත් සංචාරක දින සැමරුම්**

ප්‍රීතිමත් සංචාරක දිනය
"සිලෝන් තේ සමගින් අමතක නොවන අවස්ථාවන්"



ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අලෙවි මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අලෙවි මධ්‍යස්ථානය විසින් සිය තේ මිලදී ගැනීමේ අවශ්‍යතා සඳහා අලෙවිසැලට පැමිණෙන දේශීය/ විදේශීය පාරිභෝගිකයන්ගේ විවිධ රස අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් පරාසයක තේ පැකට් පිරිනමනු ලබයි. පෞද්ගලික අංශයේ සිලෝන් තේ අපනයන සමාගම් 22ක ප්‍රමාණයක් නියෝජනය කරමින් තේ පැකට් 1500කට අධික ප්‍රමාණයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලේබල් සමගින් අලෙවි මධ්‍යස්ථානයේ ගබඩා කර ඇත.

ප්‍රවර්ධන/තොරතුරු ප්‍රකාශන

ප්‍රවර්ධන/තොරතුරු ප්‍රකාශන වශයෙන් ද්වි-මාසික පුවත් පත්‍රිකා 06ක් වර්ෂය තුළ නිකුත් කරන ලදී.

2.4 තේ රස බැලීමේ අංශය

ශ්‍රී ලංකාවේ තේවල තත්ත්ව සහතික කරන ප්‍රධාන ආයතනයක් වශයෙන් මෙම අංශය කටයුතු කරයි. වෙන්දේසි කිරීමට හා අපනයනයට පෙර තේවල ගුණාත්මක බව පිළිබඳ තක්සේරු කිරීම මෙහි වගකීම වේ. සාදන ලද තේවල පෙනුම සහ රසය *camellia sinensis* පැළෑටියේ විවිධ ක්ලෝන, දේශගුණික සාධකවල බලපෑම (වර්ෂාපතනය, හිරුඑළිය පවතින වේලාවන් සහ උෂ්ණත්වය වැනි) හු ලක්ෂණ සහ නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ ප්‍රභේදයන් වැනි හේතු මත විශාල වශයෙන් වෙනස්වීම්වලට ලක්වේ. රස පරීක්ෂා කරන ලද තේ නියැදිවල ගතිලක්ෂණ මත පදනම්ව පුහුණු රස බලන්නන් විසින් ඒවායෙහි තත්ත්වය සහතික කරනු ලබයි. අසතුටුදායක මට්ටමක පවතින නියැදි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරය වෙත වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා යවනු ලැබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රස පරීක්ෂා කිරීමේ කණ්ඩායම රාජ්‍ය සහ පුද්ගලික අංශයේ තේ රස පරීක්ෂා කරන්නන්ගෙන් යුත් විශේෂඥ මණ්ඩලයකින් සමන්විත වේ. ඔවුන් සියලුම පාර්ශව නියෝජනය කරයි. එනම්, කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය [Colombo Tea Traders' Association (CTTA)], කොළඹ බ්‍රෝකර්වරුන්ගේ සංගමය [Colombo Brokers' Association (CBA)], සිලෝන් වැවිලි සංගමය [Ceylon Plantation Association (CPA)], කුඩා තේ හිමියන්ගේ සංවර්ධන සමාජ පිළිබඳ ශ්‍රී ලංකා සම්මේලනය [Sri Lanka Federation of Tea Small Holdings Development Societies (SLFTSHDS)], ශ්‍රී ලංකා තේ කර්මාන්ත හිමියන්ගේ සංගමය [Sri Lanka Tea Factory Owners Association (SLTFOA)] වැනි ආයතනයන් සහ ස්වාධීන සාමාජික මඩුල්ලකින් ද මෙම කණ්ඩායම සමන්විත වේ.

මම අංශයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි ලැයිස්තු ගත කළ හැක.

- තේ ලබා දෙන ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය සහ ISO 3720 හා ISO 11287 යන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- පුද්ගලික විකුණුම්, සෘජු විකුණුම් හා කොන්ත්‍රාත්තු අධීක්ෂණය හා අනුමත කිරීම.
- සන්නාම සහිත නිෂ්පාදන සහ පරිභෝජන ඇසුරුම් සඳහා සිංහ ලාංඡන සහතික නිකුත් කිරීම පහසුකරණය කිරීම.
- නව අපනයන සමාගම් සඳහා තේ රස බලන්නන් ඇගයීමට ලක් කිරීම.

තේ රස බැලීමේ සංකල්පය හා ක්‍රමවේදය

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවේදක පරීක්ෂණවලදී තේ පිළියෙල කිරීම පිළිබඳ ISO 3103 පිළිගනු ලබයි.
- ශ්‍රී ලංකාවේ තේ රස බැලීම සම්බන්ධයෙන් කළු තේ සඳහා ISO 6078 පාරිභාෂිත වචන මාලාව / ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය පිළිබඳ විෂය ග්‍රන්ථය - අංක 4 - ලංකාවේ තේ නිෂ්පාදනය.



තේ ලබා දෙන ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය

තේ පිළිබඳ විශේෂඥ මණ්ඩලයක සහභාගිත්වයෙන් ප්‍රධාන වශයෙන් සඳුදා සහ බ්‍රහස්පතින්දා යන දිනයන්හි දී සතියකට දෙවරක් සාමාන්‍ය තේ රස බැලීමේ සැසි පවත්වනු ලැබේ. මෙම සැසි අතරවාරයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ආනයනය අංශයට මගින් ලබාදෙන සහ තේ රස බැලීමේ අංශයට සෘජුව ලැබෙන පහත තේ නියැදි ඇගයීම සඳහා සලකා බලනු ලැබේ.

(අ) පූර්ව වෙන්දේසි තේ
(ආ) විශේෂ විමර්ශන තේ
(ඇ) පූර්ව ආනයන නියැදි
(ඈ) සෘජු විකුණුම්
(ඉ) දෛනික ඇගයීමට ලක්කරන බෙදාහැරීමට පෙර කරනු ලබන අධීක්ෂණය

නියැදි සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණය වැඩිදුර නියාමන කටයුතු සඳහා තේ කොමසාරිස් ශාඛාවට සහ තේ අපනයන අංශයට යවනු ලැබේ.

වගුව 2.4.1 : 2022වසර තුළ පරීක්ෂා කරන ලද හා සැක සහිත නියැදි පිළිබඳ විස්තර

විස්තරය	පරීක්ෂාවට ලක් කළ නියැදි සංඛ්‍යාව	සැකයට බඳුන් කරන ලද නියැදි සංඛ්‍යාව
දෘශ්‍ය පරීක්ෂණ	224,186	
කාබනික පරීක්ෂණය	79,432	
පූර්ව වෙන්දේසි නියැදි		
අහඹු ඇගයීම	4,988	331
දියර වර්ග මිශ්‍ර වීමෙන් අපවිත්‍ර වී ඇතැයි යන සැකය හේතුවෙන් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම		346
සිලිකාමය කරුණු		1,183
අමු කෙඳි		1,438

මූලාශ්‍රය - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

අ) පූර්ව වෙන්දේසි තේ

විකිණීමට සති දෙකකට පෙර තැරැව්කරුවන් අටදෙනා ඔවුන්ගේ තේ නියැදි වෙන්දේසියට පෙර ඇගයීම සඳහා එවනු ලැබේ. පළමු පියවර ලෙස උඩරට සහ මධ්‍යම, හොඳින් මල් සහිත, අඩු වැඩුණු පතු, අඩු වැඩුණු අර්ධ-පතු, අඩු වැඩුණු කිනිති සහිත/ තත්වයෙන් පහල කුඩා සහ උප වර්ග, කුඩු සහ BOP1A නියැදීන් හඳුනාගැනීම සඳහා දෘශ්‍ය ඇගයීම සිදු කරනු ලැබේ. තැරැව්කරුවන් තේ නියැදි, පරිගණක යෙදවුමකින් අහඹු ලෙස තෝරාගනු ලබන අතර. ඉන් පසුව, කාබනික ඇගයුම සිදු කරනු ලැබේ. ඇගයීමෙන් පසු තෝරාගත් සාම්පල ඉදිරි වෙන්දේසියේදී ඉදිරිපත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සාමූහික තීරණයක් ගැනීමට විශේෂඥ කණ්ඩායමට ඉදිරිපත් කර අදාළ තීරණය අපනයන අංශයේ නියෝජ්‍ය තේ කොමසාරිස් වෙත දැනුම් දෙනු ලැබේ.

ආ) බෙදා හැරීමට පෙර තේ

සිංහ ලාංඡනය භාවිතය, කළු තේ ISO 3720 සහ හරිත තේ සඳහා ISO 11287 හෝ නැවිගත කිරීමට පෙර වෙනත් අපවිත්‍රතාවයක් පරීක්ෂා කිරීම ආදිය පෙර නැවිගත කිරීම් සාම්පල පරීක්ෂාවේ දී පරීක්ෂා කරනු ලැබේ. මේ යටතේ 2021 සඳහා නැව් ගත කිරීම් සාම්පල 10103 ක් අධීක්ෂණය කරන ලදී.

ඇ) පූර්ව ආනයන තේ සහ පශ්චාත් ආනයන තේ

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අපනයන අංශය හරහා ලැබෙන පූර්ව ආනයන නියැදි සමග අපනයනය සඳහා එහි වූ යෝග්‍යතාවය ඇගයීමට ලක්කිරීම සඳහා ආකෘතියක්ද අඩංගු කර ඇත. සෑම ඉල්ලුම් පත්‍රයකම අදාළ නියැදිය පිළිබඳ විස්තර ඇතුලත්ය. එනම්, එහි සම්භවය, ශ්‍රේණිය සහ අදාල අනෙකුත් තොරතුරුය.
තේ රස බැලීමේ කණ්ඩායම විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ චක්‍රලේඛ අංක OR/1/65 සහ එහි සංශෝධනයන්හි මාර්ගෝපදේශ අනුව තේ නියැදි ඇගයීමට ලක් කරනු ලබයි. 2021 වසර සඳහා තේ රස බැලීමේ අංශය විසින් නියැදි 1,126ක් ආනයනයට පෙර නියැදි වශයෙන් පරීක්ෂාවට ලක් කරන ලදී.

පුද්ගලික විකුණුම් අනුමත කිරීම සහ මණ්ඩල තක්සේරු සහතිකය

අ) පුද්ගලික විකුණුම් අනුමත කිරීම

ස්වාධීන තැරැව්කරුවන්ගේ අනුමැතිය සමග විකුණුම් තැරැව්කරුවන් විසින් මණ්ඩලය මගින් ලැබෙන තේ නියැදි තේ රසය පිළිබඳ ඇගයීම සඳහා ඉදිරිපත් කර ඇත. මෙහිදී නියමිත සේවා ගාස්තු අදාළවන අතර අනුමත කිරීමේ ගාස්තු වශයෙන් එක් තේ වර්ගයක් සඳහා රුපියල් 500ක් [+අගය මත එකතු කළ බද්ද (VAT)] අය කරනු ලැබේ. වර්තමානයේදී, ඉහත යෝජනා ක්‍රමය කොළඹ වෙන්දේසි හරහා විකුණනු නොලබන හරිත තේ, කාබනික තේ, විශේෂිත තේ සහ කුඩා පරිමාණයේ ශ්‍රේණි සඳහා පමණක් සීමා කර ඇත. සමස්ථයක් ලෙස 9,655ක පුද්ගලික විකුණුම් කොටස් ප්‍රමාණයක් 2021 වර්ෂය සඳහා පරීක්ෂා කර අනුමත කරන ලදී.

ආ) ඉදිරි කොන්ත්‍රාත්තු සහතික කිරීම

ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවය අනුව තෝරාගත් ලකුණු කිහිපයක් සඳහා යම් කාල වකවානුවක් වෙනුවෙන් අනුමත කිරීම සිදු කරන ලදී. විකුණුම්කරු, ගැනුම්කරු, තැරැව්කරු සහ තේ මණ්ඩලය විසින් විකිණීමේ කොන්ත්‍රාත්තුව අනුමත කිරීම සිදු කරන ලදී. රු.500ක අනුමත කිරීමේ ගාස්තුවක් [+අගය මත එකතු කළ බද්ද (VAT)] ඉහත සේවාව සඳහා ද අය කරන ලදී. වර්ෂය තුළ ඉදිරි කොන්ත්‍රාත්තු 1103ක් අනුමත කරන ලදී.

ඇ) සෘජු විකිණීම අනුමත කිරීම

තම නිෂ්පාදන සෘජුවම විදේශීය ගැනුම්කරුවන්ට විකිණීම සඳහා ඉහත යෝජනා ක්‍රමය මගින් නිෂ්පාදකයාට සහ අපනයනකරුවාට අවසර දෙනු ලබයි. හරිත තේ හැර, කාබනික තේ සහ විශේෂ තේ දේශීය ගැනුම්කරුවන්ට අලෙවි කිරීමට හැකි විය. බ්‍රහස්පතින්දා දිනයන්හි රැස්වන විශේෂඥ කමිටුව මගින් සෘජු විකුණුම් අනුමත කරනු ලැබේ. එමෙන්ම, සලකා බලන ලද වර්ෂය සඳහා විකුණුම් වාර 1,527 ක් අනුමත කරන ලද අතර අනුමත කළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 1.56 කි.

සිංහ ලාංඡනය සඳහා ලියාපදිංචි වීම

ගුණාත්මකබව සහ නිෂ්පාදනයේ ආරම්භක රට පිළිබඳ සංකේතයක් වන සිංහ ලාංඡනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුය. සන්නාම සහිත පාරිභෝගික ඇසුරුම්වල සිංහ ලාංඡනය නිරූපණය කිරීමට අපේක්ෂා කරන අපනයනකරුවන් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර එහිදී ගමනාන්තය සහ වෙළඳපොළ අනුව සන්නාමගත නිෂ්පාදන ඇගයීමට ලක් කරනු ලැබේ. වෙළඳ නාම සඳහා සිංහ ලාංඡන සහනිකයකය වලංගුවන කාලය වසර තුනකි. සිල්ලර ඇසුරුම්වල සිංහ ලාංඡනය භාවිත කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවසරය ලබා දෙනු ලබයි. 2022 වසරේදී නව වෙළඳ නාම, අළුත් කිරීම් සහ අමතර ඇසුරුම් සඳහා අයදුම්පත් 357ක් පිළිබඳ කටයුතු කරන ලදී.

ගුණාත්මකබව හා කීර්ති නාමය පවත්වා ගැනීම උදෙසා මෙන්ම ප්‍රධාන වශයෙන් සිංහ ලාංඡනය වංචනික ලෙස භාවිත කිරීමේ අවස්ථා හඳුනාගැනීම සඳහා විදේශීය වෙළඳපොළවල සහ දේශීය වෙළඳපොළවල සිංහ ලාංඡනය භාවිතය පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලින් සිදු කරනු ලැබේ. පූර්ව බෙදාහැරීමේ අධීක්ෂණය අතරවාරයේදී, සිංහ ලාංඡනය සහිත බෙදාහැරීමේ බඩු තොග 80%කට අධික ප්‍රමාණයක් අහඹු නියැදි පදනම මත ඇගයීමට ලක් කෙරේ. රට අමතරව, විදේශීය කාර්යාංශ සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සිටින වාණිජ තානාපතිවරු විදේශීය වෙළඳපොලවල නිබෙන සිංහ ලාංඡනය සහිත ඇසුරුම් ඇගයීම් කටයුතු සඳහා වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. දේශීය වෙළඳපොල තුළ සිංහ ලාංඡනය භාවිත කරන වෙළඳ නාම ද අහඹු ලෙස තෝරා ගැනීමෙන් සිංහ ලාංඡනය භාවිත කිරීමේ කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ඇගයීමට ලක් කෙරේ. ප්‍රධාන වශයෙන්, තේ මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින හා සැලකිය යුතු වෙළඳපල කොටසක් හිමි කිරීතිමත් හා දිගුකාලීන ඇසුරුම්කරුවන්ට සිංහ ලාංඡනය භාවිත කිරීමට අවසර ලබා දී ඒ අනුව අධීක්ෂණය කරනු ලැබේ.

2.5 විශ්ලේෂණ විද්‍යාගාරය

2022 වසර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරයට තවත් සාර්ථක වසරක් විය. රසායන, ක්ෂුද්‍ර ජීව විද්‍යා සහ පළිබෝධනාශක විද්‍යාගාරය යන රසායනාගාර තුනම මගින් ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා සිය උපරිම දායකත්වය ලබා දෙන ලදී. උපරිම නිරවද්‍යතාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් අභ්‍යන්තර සහ බාහිර පාර්ශව වෙත වාර්තා සකස් කිරීම සහ අවසාන ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා තත්ත්ව පරීක්ෂණ ඒකක මගින් ද මහඟු දායකත්වයක් ලබා දුනි.

සිංහ ලාංඡනය සහතික කිරීමේ ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රසායනාගාරය සිංහ ලාංඡනය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ නිර්ණායක විශ්ලේෂණය කරමින් 2022 දී ප්‍රවර්ධන අංශය සමග එක්ව සිංහ ලාංඡනය භාවිතය සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමට දායක විය. ජපාන අපනයන නැවැගත කිරීම් කෙරෙහි අවධානය යොමු කරමින්, MCPA, 2-4D, Hexaconazole සඳහා විශ්ලේෂණ ශිල්ප ක්‍රම හඳුන්වා දීමට රසායනාගාරයට හැකි විය. එමෙන්ම, ආනයනික තේ සම්බන්ධයෙන් අදාළ පළිබෝධනාශක පරීක්ෂණ "Acephate, Imidacloprid, Dimethoate, Methidathion, Triazophos, Fipronil, Qui-nalphos, Propiconazole Profenofos 2022 මැයි මාසයේදී තේ කර්මාන්තයට හඳුන්වා දී ඇත.

රසායනාගාරය සඳහා සහකාර අධ්‍යක්ෂ තනතුරු පහක් (තත්ත්ව, ක්ෂුද්‍ර ජීව විද්‍යා, රසායනික, පළිබෝධනාශක සහ රසායනාගාර) පිහිටුවීම වසර තුළ ලද විශාල ජයග්‍රහණයකි. දැනුම අඛණ්ඩව යාවත්කාලීන වශයෙන් තබා ගැනීම සඳහා, 2022 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ප්‍රතිනත මණ්ඩලය විසින් පවත්වන ලද වාර්ෂික නිරීක්ෂණ සහ විෂය පථය පුළුල් කිරීම (පළිබෝධනාශක අපද්‍රව්‍ය සඳහා) පිළිබඳ විගණන සඳහා රසායනාගාර නිලධාරීන් සහභාගී වූ අතර 2022 දෙසැම්බර 05 දින පැවති බ්‍රිතාන්‍ය ප්‍රමිති ආයතනය විසින් සත්කාරකත්වය සපයන, SO/TC 34/SC 8 අථත්‍ය රැස්වීමට ද සහභාගී විය.

වගුව 2.5.1: විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරන ලද පරීක්ෂණවල සාරාංශය

පරීක්ෂණයේ නම	පරීක්ෂණ ගණන	
	2021	2022
රසායනික විශ්ලේෂණ ඒකකය		
තේ වල තෙතමනය තීරණය කිරීම	499	649
තේ වල අඩංගු සමස්ථ අළු ප්‍රමාණය තීරණය කිරීම	339	684
තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළු ප්‍රමාණය නිර්ණය කිරීම	349	673
තේ වල අඩංගු ද්‍රාව්‍ය අළුවල ඇති අම්ල ප්‍රමාණය නිර්ණය කිරීම	312	590
තේ වල අඩංගු ජලසාරය තීරණය කිරීම	309	103
තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළුවල ක්ෂාරීයතාව තීරණය කිරීම	318	643
තේ වල ඇති අමු කෙඳි ප්‍රමාණය තීරණය කිරීම	518	339
මූලික විකිරණ නිර්ණය කිරීමේ පරීක්ෂණ	209	259
ශ්‍රේණිය හඳුනා ගැනීමේ පරීක්ෂණ / පෙරන විශ්ලේෂණය	33	323
ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය		
සමස්ථ පට්ටක ගණන තීරණය කිරීම	-	750
යීස්ට් සහ පුස් ප්‍රමාණය තීරණය කිරීම	455	757
තේවල ඇති මැරුණු හෝ සජීවී කෘමීන් සහ වෙනත් අපද්‍රව්‍ය / භාහිර ද්‍රව්‍ය පිළිබඳ අන්වීක්ෂීය පරීක්ෂණය	35	487
තේවල අඩංගු ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවීන් (GMO) නිර්ණය කිරීම	191	142
මළ කොලිෆෝම් සහ එස්චරිචියා කොලි (E.coli) හඳුනා ගැනීම සහ ගණනය කිරීම	455	592
සම්පූර්ණ කොලිෆෝම් හඳුනා ගැනීම සහ ගණනය කිරීම	462	598
පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය		
HPLC RI අනාවරකය භාවිත කරමින් සීනි පිළිබඳ විශ්ලේෂණය	5131	5205
LCMS/MS භාවිතයෙන් ඩයුරෝන් විශ්ලේෂණය	124	157
LCMS/MS භාවිතයෙන් MCPA විශ්ලේෂණය	4	175
LCMS/MS භාවිතයෙන් 2,4 D අපද්‍රව්‍ය විශ්ලේෂණය	-	140
LCMS/MS භාවිතයෙන් Hexaconazole අපද්‍රව්‍ය විශ්ලේෂණය	-	269
LCMS/MS භාවිතයෙන්, බහු අපද්‍රව්‍ය විශ්ලේෂණය (Acephate, Imidacloprid, Dimethoate, Methidathion, Triazophos, Fipronil, Quinalphos, Propiconazole & Profenofos)	-	1386
එකතුව	9746	14921

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වර්ෂය තුළ, පරීක්ෂණ 14,921ක් සිදු කිරීම සඳහා විශ්ලේෂණ විද්‍යාගාරය වෙනින් ඉල්ලම් කර ඇති අතරඅවම ISO ප්‍රමිති මට්ටමට වඩා පහල තේ නියැදි 1220 ක් හඳුනාගෙන ඇත.

වගුව 2.5.2. ISO ප්‍රමිති මට්ටමට වඩා පහල තේ නියැදි ප්‍රමාණය

විශ්ලේෂණ ඒකකය	අවම තත්ව ප්‍රමිතියට වඩා පහල තේ නියැදි සංඛ්‍යාව
ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක	473
රසායනික	608
සිනි / පළිබෝධ නාශක අපද්‍රව්‍ය	139

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය

වර්ෂය තුළ දී සිනි (5205), ක්ෂුද්‍ර විද්‍යා පළිබෝධ විශ්ලේෂණ (175), ඩියුරෝන් (157), 2-4D(140), හෙක්සකොනසොල් (269) සහ අපද්‍රව්‍ය (1386) පිළිබඳ ඉල්ලීම් විශ්ලේෂණය කර ඇති අතර සිදු කළ සමස්ථ පරීක්ෂණ සංඛ්‍යාවෙන් 139ක ප්‍රතිඵල මගින් අවම ප්‍රමිතියට වඩා අඩුවෙන් පවතින තේ නියැදි හඳුනා ගන්නා ලදී.

වගුව 2.5.3. හඳුනා ගන්නා ලද අවම ප්‍රමිතියට අඩුවෙන් ඇති තේ නියැදි පරීක්ෂණ ගණන

පළිබෝධ නාශක පරීක්ෂණයේ ස්වභාවය	අවම තත්ව ප්‍රමිතියට පහල
ෆ්ලක්ටෝස්	21
ග්ලූකෝස්	22
සුක්‍රෝස්	54
ඩියුරෝන්	1
MCPA	1
හෙක්සකොනසොල්	40

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ක්ෂුද්‍ර ජීව විද්‍යා විශ්ලේෂණ ඒකකය

වර්ෂය තුළ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ 3184ක් සිදු කරන ලදී. ඒවායින්, ක්ෂුද්‍ර ජීව පරීක්ෂණ 467ක මගින් අපේක්ෂිත ප්‍රමිතියට අඩුවෙන් පවතින හෝ පරිභෝජනයට සුදුසු නොවන තේ හඳුනා ගන්නා ලදී. මෙම නියැදි අභ්‍යන්තර සහතික කරන සේවාව මගින් ලබා ගන්නා ලදී.

වගුව 2.5.4 ක්ෂුද්‍ර ජීව විද්‍යා විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

ක්ෂුද්‍ර විද්‍යා පරීක්ෂණයේ ස්වභාවය	අවම තත්ව ප්‍රමිතියට / උපදෙස් මාලාවට පහල
සමස්ථ පට්ටක ගණන	133
යීස්ට් සහ පුස් ප්‍රමාණය	245
කොලිෆෝම්	89

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

රසායනික විශ්ලේෂණ ඒකකය

රසායනික විශ්ලේෂණ ඒකකය මගින් පරීක්ෂණ 4263ක් සිදු කරන ලද අතර එයින් නියැදි 608ක් ප්‍රමිතියට පහලින් ඇති බවට හඳුනා ගන්නා ලදී. එම නියැදි අභ්‍යන්තර නියාමන සේවාව හරහා ලබා ගන්නා ලදී.

වගුව 2.5.5: රසායනික විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය.

රසායනික පරීක්ෂණයේ ස්වභාවය	අවම තත්ව ප්‍රමිතියට / උපදෙස් මාලාවට පහල
අමු කෙඳි ප්‍රමාණය	127
ක්ෂාරීයතා ප්‍රමාණය	7
තෙතමනය	459
ජලයේ ද්‍රාව්‍ය නොවන අළු	2
සමස්ථ අළු ප්‍රමාණය	13

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තත්ව පරීක්ෂණ ඒකකය

ISO/IEC 17025 රසායනාගාර ප්‍රමිතියට අනුව ලේඛන පාලන පටිපාටි පවත්වා ගනිමින් අභ්‍යන්තර නියාමන හා බාහිර සහතික කිරීමේ සේවාවන් යන දෙකම සඳහා අදාළ විශ්ලේෂණ ඒකකය වෙතට ලැබෙන, ලියාපදිංචි වන හා පැවරෙන නියැදි මෙම ඒකකය මගින් කළමනාකරණ කරනු ලැබේ. තේ කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය තේ කොමසාරිස්වරුන්ගේ ඉල්ලීම පරිදි, 2022 වසර තුළ නැවත නියැදි කිරීම වෙනුවෙන් තේ නියැදි 14ක් සඳහා මෙම ඒකකය සහාය ලබා දී ඇත.



2.6 පාලන අංශය

සියළුම මානව සම්පත් කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන කටයුතු සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම, තොරතුරු තාක්ෂණ සේවා ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, තේ මණ්ඩලයේ සැලසුම්, අධීක්ෂණ හා ඇගයීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒ සඳහා පහසුකම් සැපයීම, සංඛ්‍යාත්මක තොරතුරු බෙදා හැරීම, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පුස්තකාලය කළමනාකරණය කිරීම හා පවත්වාගැනීම, ප්‍රසම්පාදන කටයුතු මෙන්ම මණ්ඩලයේ ආරක්ෂක හා ප්‍රවාහන කටයුතු යන කාරණා පාලන අංශයයේ වගකීම් වේ.

වගුව 2.6.1: ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වත්මන් කාර්යමණ්ඩලය

වර්ගය	කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව		එකතුව
	පුරුෂ	ස්ත්‍රී	
ජ්‍යේෂ්ඨ මට්ටම	26	15	41(16.7%)
තෘතියික මට්ටම	15	04	19(7.8%)
ද්විතියික මට්ටම	44	81	125(51%)
ප්‍රාථමික මට්ටම	56	04	60(24.5 %)
එකතුව	141(57.5%)	104 (42.5%)	245(100%)

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

පසුගිය වසර තුළ සේවකයින්ගේ ඉල්ලා අස්වීම් 04 ක් සහ විශ්‍රාම යෑම් 11 ක් ඇතුළුව රැකියා පිරිවැටුම් 15ක් දැකිය හැකි විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා වූ නිලධාරීන් කොවිඩ් 19 මාර්ගෝපදේශ අනුගමනය කරමින් ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. රට තුළ සහ ගෝලීය වශයෙන් පවතින වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වසර සඳහා අයවැයෙන් වෙන් කරන ලද විදේශ පුහුණු වැඩසටහන් සහ දේශීය කණ්ඩායම් ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට නොහැකි විය.



වගුව 2.6.2: සේවක වර්ගය අනුව දේශීය පුහුණු වැඩසටහන්

වර්ගය	පුහුණු වූ සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	08
තෘතියික මට්ටම	04
ද්විතියික මට්ටම	07
ප්‍රාථමික මට්ටම	00
එකතුව	19

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ආයතනික සමාජ වගකීම (CSR) සම්බන්ධ ක්‍රියාකාරකම්

පස්සර මිදුම්පිටිය මූලික රෝහල සඳහා ඔක්සිජන් යන්ත්‍රයක් ප්‍රදානය කරන ලදී.

සුබ සාධන කටයුතු

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යමණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා සුහද හමුවක් දෙසැම්බර මස 10වන දින පිළියන්දල









2.7 අභ්‍යන්තර විගණන ඒකකය

අභ්‍යන්තර විගණන අංශයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකා රජයේ තේ කම්හල් හිමියන්, තේ වතු හිමියන්, තේ අංශයේ සේවකයන් සහ මහජනතාව වැනි ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා එහි මූල්‍ය, පරිපාලන සහ මානව සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීම උදෙසා අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමයි.

අවදානම් කළමනාකරණය, පාලනය සහ පාලන ක්‍රියාවලියේ සඵලතාවය ඇගයීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමවත් විෂයානුකූල ප්‍රවේශයක් අනුගමනය කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අභ්‍යන්තර විගණන අංශය විසින් උපකාර කරනු ලබයි. වසංගත තත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටුව දෙවරක් රැස් වූ අතර අවශ්‍යතාවය අනුව කැඳවීම් මත අදාළ අංශ ප්‍රධානීන් / නිලධාරීන් කමිටු රැස්වීම් සඳහා සහභාගි වූහ. සුදුසු නිවැරදි ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික කිරීම සඳහා වාර්තා සහ පසු විපරම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ සපයන ලදී.

2.8 තොරතුරු තාක්ෂණ ඒකකය

2021 වසරට සාපේක්ෂව 2022 වසර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ විෂය පථය කෙරෙහි ප්‍රමාණවත් වෙනසක් ඇති කරන ලදී. රට තුළ පැවති තත්වය හේතුවෙන් සුපුරුදු පරිදි සංවර්ධන කටයුතු පවත්වා ගැනීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයට නොහැකි විය. කෙසේවෙතත්, තේ වට්නාකම් දාම පද්ධතියේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීමට හැකිවිය. එයට අමතරව, සජීවී පරිසරයක් තුළ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අප විසින් ආරම්භ කළ අතර අවසර ලත පරිශීලකයන්ට අඛණ්ඩව දත්ත ඇතුලත් කිරීමට එමගින් හැකියාව ලැබේ. ප්‍රාදේශීය කාර්යාල ඇතුළුව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සෑම දෙපාර්තමේන්තුවකටම බඩුභාණ්ඩ පාලන පද්ධතියක් අප විසින් ලබා දී ඇත. එමගින් ඉදිරි වර්ෂවලදී කඩදාසි භාවිතය අවම කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයට උපකාර වන අතර ආයතනයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට ද හැකිවේ. කඩදාසිවලින් තොර පරිසරයක් සඳහා මෙය ඉදිරි පියවරක් වේ.

සන්නිවේදනය හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා කළමනාකරණයට පහසුකම් සැලසීමට ඉදිරි වසර 03 සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් Google Workspace හි බලපත්‍රය මගින් අලුත් කරන ලදී. "ගෝලීය ප්‍රවර්ධනය" යටතේ ප්‍රවර්ධන අංශය මගින් ආරම්භ කරන ලද ඩිජිටල් ප්‍රවර්ධන වැඩසටහන් බොහොමයකට තොරතුරු තාක්ෂණ කණ්ඩායම උපකාර කර ඇත.

3. කර්මාන්ත පැතිකඩ

පොහොර පිළිබඳ ප්‍රතිපත්ති හේතුවෙන් සිලෝන් තේ කර්මාන්තයේ දැනට උද්ගතව පවතින අවාසි සහගත තත්වයන් මගහැරෙනු ඇතැයි යන සුබවාදී බලාපොරොත්තු පෙරදැරිව 2022 වර්ෂය ආරම්භ විය. ලංකාවේ තේ කර්මාන්තය මුහුණ පා සිටින විවිධ බාධාවන් නොසලකා 2022 වසරේ දී තේ මිලෙහි අඛණ්ඩ ඉහළ යාමක් දැකිය හැකි විය. 2022 වර්ෂය තුළ වාර්ෂික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 251.5 ක් වූ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ කිලෝග්‍රෑම් මිලියන 299.49 ට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 48ක පහත බැසීමක් වාර්තා විය. සමාලෝචිත වර්ෂය තුළ වාර්තා වූ එම අගය කිලෝග්‍රෑම් මිලියන 179.6 ක් වාර්තා කළ 1992 වසරට පසු වාර්තා වූ අඩුම අගය විය හැකිය. එසේම 2022 වර්ෂය තුළ වාර්ෂික තේ අපනයන ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 250ක් වූ අතර 2021 වසරේ දී එය කිලෝග්‍රෑම් මිලියන 285.9 කි. එසේම, 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා තේ අපනයන ආදායම රුපියල් බිලියන 411ක් වූ අතර 2021 වසරේ එම වකවානුව තුළ එය රුපියල් බිලියන 263කි. 2022 වර්ෂය තුළ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 1.25 ක් (ඇමරිකානු ඩොලර් මිලියන 1,258.7) වූ අතර 2021 වර්ෂය තුළ අපනයන ආදායම වූ ඇමරිකානු ඩොලර් බිලියන 1.32ක් (ඇමරිකානු ඩොලර් මිලියන 1,324.4) විය. එනම්, 2022 වසරේ දී අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 65.6ක් අඩු විය. අඩු වීමට හේතු ආදායමට වූයේ අඩු නිෂ්පාදනයයි. කෙසේවෙතත්, අපනයන ආදායමේ රුපියල් වලින් 56%ක කැපිපෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන අතර ඩොලර් අනුව බැලූ කළ 5%ක පහත බැසීමක් පෙන්නුම් කරයි.

2021 වසරේ දී ලබා ගත් කිලෝ ග්‍රෑමයට රුපියල් 921ක් වූ FOB සාමාන්‍ය මිල 2022 වසරේ දී රුපියල් 1,643 ක් දක්වා තව දුරටත් වර්ධනය විය. එපමණක් නොව, සමාලෝචිත වර්ෂයේ දී එය කිලෝ ග්‍රෑමයකට ඇමරිකානු ඩොලර් 5.00ක් ලෙස වාර්තා විය. වාර්තා වූ පසුගිය සංඛ්‍යාලේඛන අනුව, කිලෝ මිලියන 250ක් වූ අවම තේ අපනයන ප්‍රමාණය 2022 වසරේ දී වාර්තා විය. 2022 වසරේ දී ප්‍රධාන සිලෝන් තේ වර්ගයක් කිලෝ ග්‍රෑම් මිලියන 227.1ක් ලෙස වාර්තා විය. සම්ප්‍රදායික තේ වන 2021 වසරේ අදාළ කාල වකවානුව තුළ එය කිලෝග්‍රෑම් මිලියන 270.7ක් ලෙස වාර්තා විය. කෙසේවෙතත්, 2021 වසරට සාපේක්ෂව එය 16%ක පහත බැසීමකි. එමෙන්ම, 2022 වසර සඳහා සමුච්චිත CTC නිෂ්පාදනය 14%ක අඩුවීමක් පෙන්නුම් කළ අතර සමාලෝචිත වසර තුළ එය කිලෝග්‍රෑම් මිලියන 23ක් ලෙස වාර්තා විය. 2021 වසරේ කිලෝග්‍රෑම් මිලියන 2.5ක් වූ හරිත තේ නිෂ්පාදනය 2021 වසරේ කිලෝග්‍රෑම් මිලියන 1.8ක් වූ අතර එය 30%ක පහත බැසීමකි. පසුගිය වසර තුළ කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය සමුච්චිත මිල කිලෝ ග්‍රෑමයකට ඇ.ඩො 3.80 ක් විය. එහෙයින්, 2011 වසරේ කොළඹ තේ වෙන්දේසියේ මිල රුපියල් 615.44ක සිට 2022 වසරේ රුපියල් 1,234.24 දක්වා වර්ධනය විය.

රාජ්‍ය හා පුද්ගලික යන දෙඅංශය තුළම පාර්ශවකරුවන් විසින් කරන ලද වෙළඳපල විවිධාංගීකරණය පිළිබඳ වූ මූලපිරිමි තව තවත් අපනයන වෙළඳපොළවල් විවෘත කර ගැනීමට හේතු විය. සමාලෝචිත වකවානුව තුළ වූ වෙළඳපොලවල් අතර, සිලෝන් තේ අපනයනය කරන ප්‍රධාන රට බවට ඉරාකය පත් වූ අතර එය තේ කිලෝ ග්‍රෑම් මිලියන 43.2ක් ලබා ගෙන තිබේ. එනම්, සමස්ත තේ අපනයන ප්‍රමාණයෙන් 17%කි. සිලෝන් තේ අපනයනය කරන අනෙකුත් රටවල් අතර රුසියාව (කි.මී 24.7), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (කි.මී 22.5), තුර්කිය (කි.මී 15.6), ඉරානය (කි.මී 13.0), අසර්බයිජානය (කි.මී 12.0), ලිබියාව (කි.මී 11.2), චීනය (කි.මී 11.1), ජර්මනිය (කි.මී 6.57) සහ චිලි (කි.මී 6.51) වේ.

ශ්‍රී ලංකා රජය විසින් රසායනික පොහොර භාවිතය තහනම් කිරීමෙන් පසු, තේ වගාකරුවන් හා විශාල ප්‍රමාණයේ වැවිලි කරුවන්ට කාබනික පොහොර පමණක් භාවිත කිරීමට සිදු විය. එම හේතුවෙන් 2022 වසරේ දෙසැම්බර් දක්වා පසුගිය වසරට සාපේක්ෂව 16%කින් නිෂ්පාදන මට්ටම පහළ බසින ලදී. කෙසේ වෙතත්, අඩු ඵලදා මට්ටම හා තේ පදුරු වයස් ගත වීම හා අවාසි සහගත කරුණකි. පොහොර පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය සමග රටේ තේ නිෂ්පාදනයේ ක්‍රමික වර්ධනයක් පිළිබඳ අපේක්ෂාවක් පවතී.

තේ ඉඩම් ව්‍යාප්තිය

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ තේ වගා කරන සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 267,186 කි. කළමනාකරණ නිර්ණායක අනුව මෙම තේ වතු පෞද්ගලික අංශය (60%) සහ රාජ්‍ය අංශය(40%) යනුවෙන් වර්ග කළ හැකිය. මෙරට තේ වගාව ව්‍යාප්තව ඇත්තේ දිස්ත්‍රික්ක කිහිපයක් තුළය. එනම්, ප්‍රධාන වශයෙන් තේ වගාව සඳහා හිතකර දේශගුණික තත්වයන් හේතුකොටගෙන තෙත් කලාපයේ ය.

තේ නිෂ්පාදනය

2022 වසර තුළ ශ්‍රී ලංකාවේ ජාතික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 251.5 ක් ලෙස වාර්තා විය. එය 2021 වසරට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 48ක (16%) අඩු වීමකි. ශ්‍රී ලංකාවේ තේ වගා කරන හා නිෂ්පාදනය කරන භූමියේ විවිධ මුහුදු මට්ටම් අනුව ශ්‍රී ලංකාවේ තේ වර්ග තුනකට බෙදනු ලැබේ. මුහුදු මට්ටමේ සිට මීටර් 600 දක්වා පරාසයක් තුළ වූ උස භූමි මට්ටම්වල පහත රට තේ වගාකරන අතර කළු පැහැති පෙනුමකින්, සාදන තේ කෝප්පය තද වර්ණයකින් හා රසයකින් යුක්ත වන අතර ජාතික නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට (2022 දී 61%) වඩා දායක වේ.

වගුව 3.1 උන්නතාංශය අනුව තේ නිෂ්පාදනය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

මීටර් 1,200 වැඩි උන්නතාංශයකින් යුත් භූමිවල වගාකරන තේ උඩරට තේ වශයෙන් හඳුනාගන්නා අතර ඒවා මනා රසයකින් හා සුවඳකින් යුත් උසස්ම තත්වයේ තේ ලෙස සලකනු ලැබේ. 2022 වසර තුළ ජාතික නිෂ්පාදනයට උඩරට හා මැදරට තේ මගින් දෙන ලද දායකත්වය පිලිවෙලින් 22% ක් හා 16%ක් විය. එමෙන්ම, ජාතික තේ නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට (62%) වඩා වැඩි ප්‍රමාණයකට පහත රට තේ නිෂ්පාදනය දායක වී ඇත.

මාසික තේ නිෂ්පාදනය

වසර පුරාම පහතරට තේ නිෂ්පාදනය මගින් ජාතික තේ නිෂ්පාදනය සඳහා ප්‍රධාන දායකත්වයක් ලැබුණි. 2022 වසරේදී කිලෝ ග්‍රෑම් මිලියන 26ක ඉහළම මාසික තේ නිෂ්පාදනය මැයි මාසය තුළදී වාර්තා වූ අතර කිලෝ ග්‍රෑම් මිලියන 18ක අවම නිෂ්පාදනයක් පෙබරවාරි මස තුළ දී වාර්තා විය.

ප්‍රස්තාරය 3.2: භූමියේ උස අනුව මාසික තේ නිෂ්පාදනය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

සමාලෝචිත වසර තුළදී ඉහළම උඩරට තේ නිෂ්පාදනය නුවර එළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර බදුල්ල හා මහා නුවර දිස්ත්‍රික්ක විසින් ඊළඟට ඉහළ නිෂ්පාදන වාර්තා කරන ලදී. ඉහළම පහත රට තේ නිෂ්පාදනය ර ත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්ක ඊළඟට ඉහළ නිෂ්පාදන සහිත දිස්ත්‍රික්ක විය. මෙම දිස්ත්‍රික්ක දෙකම ජාතික තේ නිෂ්පාදනයට 16% කින් සහ 21% කින් පිළිවෙලින් දායක විය. උන්නතාංශ තුනම පිළිබඳ සැලකීමේ දී, ඉහළම නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද පහළම නිෂ්පාදනය මොණරාගල දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය.

වගුව 3.3: දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

දිස්ත්‍රික්කය	ඉහළ	මධ්‍යම	පහළ	එකතුව
බදුල්ල	15,417,721	10,019,355	-	25,437,076
කොළඹ	-	-	1,128,566	1,128,566
ගාල්ල	-	-	35,648,676	35,648,676
හම්බන්තොට	-	-	188,839	188,839
කළුතර	-	-	15,477,248	15,477,248
මහනුවර	764,403	16,971,989	10,487,280	28,223,671
කෑගල්ල	-	283,448	8,713,158	8,996,606
මාතලේ	-	1,437,263	401,774	1,839,037
මාතර	-	45,944	29,897,082	29,943,026
මොණරාගල	-	22	-	22
නුවරඑළිය	40,138,649	9,550,391	799,374	50,488,414
රත්නපුර	-	1,875,559	52,252,726	54,128,285
එකතුව	**56,320,773**	**40,183,970**	**154,994,723**	**251,499,466**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

දිස්ත්‍රික්ක අනුව කෘෂි දේශගුණික විශ්ලේෂණය

කිලෝ ග්‍රෑම් මිලියන 40ක ප්‍රමාණයකින් නිෂ්පාදන දායකත්වයක් සපයමින් කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව ඉහළම තේ නිෂ්පාදනයක් රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර දෙවන ඉහළම නිෂ්පානදය වූ කිලෝ ග්‍රෑම් මිලියන 36ක් ගාල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. සමාලෝචිත වසර තුළ පහත රට තේ කිලෝ ග්‍රෑම් මිලියන 141.6ක් නිෂ්පාදනය කර ඇති අතර 2021 වසර තුළ දී එය කිලෝ ග්‍රෑම් මිලියන 27ක් (16%) විය.

වගුව 3.2: කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය	2022 (කි.ග්‍රෑ.)	*2021(කි.ග්‍රෑ.)	වෙනස (කි.ග්‍රෑ.)	%
නුවරඑළිය	3,100,723	3,587,636	(486,913)	(14)
බටහිර				
රම්බොඩ	1,769,419	1,957,781	(188,362)	(10)
පුඩලු ඔය	3,677,365	3,685,134	(7,769)	(0)
ආගරපතන	4,204,143	5,069,113	(864,971)	(17)
නානුඔය/ ලිදුල/ තලවකැලේ	7,346,084	8,514,839	(1,168,755)	(14)
පතන / කොටගල	2,848,637	4,187,182	(1,338,545)	(32)
හැටන් / දික්ඔය	6,317,777	8,152,096	(1,834,319)	(23)
බොගවන්තලාව	4,627,349	5,588,128	(960,779)	(17)
අප්කොට් / මස්කෙළිය	4,211,417	5,488,000	(1,276,583)	(23)
බටහිර එකතුව	35,002,189	42,642,272	(7,640,083)	(18)
මධ්‍යම				
වටවල/ ගිනිගත්හේන/ නෝටන් බ්‍රිජ්	1,196,123	1,817,763	(621,640)	(34)
පුස්සැල්ලාව/ හේවාහැට	4,877,643	5,905,005	(1,027,362)	(17)
කොත්මලේ	712,872	940,778	(227,906)	(24)
ගම්පොළ/ නාවලපිටිය/ දොළොස්බාගේ	17,728,354	19,650,628	(1,922,274)	(10)
නිලඹේ/ හන්නාන/ ගලහ	1,267,816	1,441,313	(173,497)	(12)
කඩුගන්නාව	4,551,687	5,462,630	(910,943)	(17)
මඩුල්කැලේ / නකල්ස් / රන්ගල	2,645,825	3,121,792	(475,967)	(15)
හුන්නස්ගිරිය / මාතලේ / යක්දෙස්ස	1,262,310	1,522,678	(260,368)	(17)
බලංගොඩ / රක්වාන	7,090,552	8,846,827	(1,756,274)	(20)
මධ්‍යම එකතුව	41,333,181	48,709,412	(7,376,232)	(15)
උඩපුස්සැල්ලාව				
උඩපුස්සැල්ලාව/ හල්ග්‍රාන්ඔය	3,614,356	4,060,550	(446,194)	(11)
මතුරට	1,729,244	1,373,647	355,597	26
උඩපුස්සැල්ලාව එකතුව	5,343,600	5,434,197	(90,597)	(2)
ඌව				
කොස්ලන්ද/ හල්දුමුල්ල	600,444	602,593	(2,149)	(0)
හපුතලේ	3,681,191	4,130,515	(449,324)	(11)
බණ්ඩාරවෙල/ පුනාගල	2,750,843	3,289,655	(538,812)	(16)
මල්වත්ත/ වැලිමඩ	2,510,844	3,378,505	(867,661)	(26)
දෙමෝදර/ හාළිඇල/ බදුල්ල	8,960,319	9,996,299	(1,035,981)	(10)
ඇල්ල/නමුණුකුළ	1,148,791	1,904,508	(755,717)	(40)
පස්සර/ ලුණුගල	2,877,873	3,663,468	(785,595)	(21)
මඩුල්සිම	2,621,201	3,486,843	(865,642)	(25)
ඌව එකතුව	25,151,505	30,452,384	(5,300,879)	(17)
පහතරට				
දෙනියාය	11,637,057	13,691,965	(2,054,908)	(15)
ගාල්ල	36,104,671	42,869,465	(6,764,794)	(16)
කළුතර	15,989,223	18,953,545	(2,964,322)	(16)
කෑගල්ල	5,401,157	7,071,361	(1,670,204)	(24)
කැලණි මිටියාවත	7,453,456	8,231,949	(778,493)	(9)
මහනුවර/ මාතලේ/ කුරුණෑගල	2,939,898	3,889,004	(949,106)	(24)
මාතර	12,743,079	14,157,203	(1,414,124)	10
මොරවක	5,186,075	6,292,262	(1,106,187)	(18)
රත්නපුර	40,002,281	48,328,640	(8,326,359)	(17)
බලන්ගොඩ	4,111,372	5,177,128	(1,065,756)	(21)
පහතරට එකතුව	141,568,268	168,662,520	(27,094,253)	(16)
එකතුව	**251,499,466**	**299,488,422**	**(47,988,955)**	**(16)**

ප්‍රතිශෝධනය කර ඇත. (මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

අමු තේ දළු රැස්කිරීමේ ක්‍රමවේදය අනුව නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම

තේ කර්මාන්ත ශාලාවක තේ දළු අවශ්‍යතාවය ඔවුන්ගේම වතුවලින් මෙන්ම මිලදී ගත් තේ දළුවලින් සපුරා ගනු ලැබේ. නිමි තේ ප්‍රමාණය 4.65න් ගුණාකරමින් රැස් කරගන්නා ලද තේ දළු ප්‍රමාණය ගණනය කරන අතර එය තේ කර්මාන්තයේ පිළිගත් සූත්‍රයක් ලෙස භාවිත කෙරේ.

වගුව 3.3: දිස්ත්‍රික්ක අනුව අමු තේ දළු නිෂ්පාදනය (කි.ග්‍රෑ)

දිස්ත්‍රික්කය	ඉහළ	මධ්‍යම	පහළ	එකතුව
බදුල්ල	71,692,403	46,590,003	-	118,282,406
කොළඹ	-	-	5,247,832	5,247,832
ගාල්ල	-	-	165,766,345	165,766,345
හම්බන්තොට	-	-	878,101	878,101
කළුතර	-	-	71,969,205	71,969,205
මහනුවර	3,554,474	78,919,747	48,765,850	131,240,071
කෑගල්ල	-	1,318,033	40,516,184	41,834,217
මාතලේ	-	6,683,271	1,868,249	8,551,520
මාතර	-	213,640	139,021,431	139,235,070
මොනරාගල	-	102	-	102
නුවරඑළිය	186,644,718	44,409,318	3,717,089	234,771,125
රත්නපුර	-	8,721,347	242,975,178	251,696,525
එකතුව	**261,891,595**	**186,855,461**	**720,725,464**	**1,169,472,519**

සැකසුම් ක්‍රමවේද අනුව නිෂ්පාදන විශ්ලේෂණය කිරීම

කළු තේ සහ හරිත තේ නිෂ්පාදනය

2022 වසර තුළදී සම්ප්‍රදායික තේ නිෂ්පාදනය 16% කින් ද සි.ටි.සි. තේ නිෂ්පාදනය 14% කින්ද පහත වැටීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වසර තුළදී සමස්ත කළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 47 කින් (16%) පහල ගොස් ඇත. හරිත තේ නිෂ්පාදනය පෙර වර්ෂය හා සැසඳීමේදි 30%ක අඩුවීමක් පෙන්නුම් කරයි.

ක්ෂණික තේ සහ පෙව තේ නිෂ්පාදනය

2021 වසර හා සැසඳීමේ දී 2022 වසර තුළදී ක්ෂණික තේ කිලෝ ග්‍රෑම් 834,971 කින් පහල යාමක් පෙන්නුම් කරන අතර පෙව තේ නිෂ්පාදනය මෙටෝ 1211ක පහත වැටීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂය තුළ පෙව තේ නිෂ්පාදනය මෙටෝ 977ක් වූ අතර එය 2011 වසරේදී මෙටෝ 1188ක් විය. සමාලෝචිත වර්ෂය තුළ ක්ෂණික තේ නිෂ්පාදනය 4,473,784 ක් වශයෙන් වාර්තා විය.

නිමි තේ නිෂ්පාදන වියදම

ඵලදායිතාවය සහ නිෂ්පාදන වියදම එකිනෙකට සම්බන්ධ කාරණා වන අතර නිෂ්පාදන වියදම ඉහළයාම වැවිලි අංශය තුළ බොහෝවිට දැකිය හැකි කණගාටුදායක කරුණක් බවට පත්ව ඇත. තේ නිෂ්පාදනයේ දී ශ්‍රමය විශාල වශයෙන් අවශ්‍යවන හෙයින් ශ්‍රම ඵලදායිතාව හා නිෂ්පාදන වියදම අතර දැඩි සම්බන්දතාවයක් පවති. තේ නිපදවන ප්‍රධාන පෙලේ රටවල් අතර ශ්‍රී ලංකාව තුළ ඉහළ නිෂ්පාදන වියදමක් දැකිය හැක. ගෝලීය සන්දර්භය තුළ රටෙහි පවතින තරගකාරිත්වය සඳහා මෙම තත්වය බලපා ඇත.

නිමි තේ කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන වියදම පසුගිය දශකය තුළ සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. ශ්‍රම පිරිවැය සහ යෙදවුම් මිල ඉහළ යාම විශේෂයෙන් නිෂ්පාදන වියදම සඳහා බලපා තිබුණි. 2021/2022 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්ත අනුව තේ කිලෝ ග්‍රෑමයක් සඳහා වාර්ෂික නිෂ්පාදන වියදම රුපියල් 638.99 වූ අතර (ඇස්තූ මේන්තු) එය 2021/2022 හා සැසඳීමේදි 3% ක වර්ධනයකි.

ප්‍රස්තාරය 3.3: නිමි තේ කිලෝවක සමස්ත පිරිවැය.



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2021/2022
මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තේ අලෙවිය

තේ වෙන්දේසිවල දී වාර්තා වූ ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගයන් සමග සසඳන විට, 2022 වසරේ මේ දක්වා වාර්ෂික සාමාන්‍යය රුපියල් 1,234.24ක් (අවමය කිලෝ ග්‍රෑමයකට රුපියල් 705ක්, උපරිමය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,599), එය පසුගිය වසරේ සාමාන්‍ය අගය වූ රුපියල් 615.44ක අගය හා සැසඳීමේ දී කිලෝ ග්‍රෑමයක් රුපියල් 619ක් ලෙස වර්ධනය විය. (කිලෝ ග්‍රෑමයකට රුපියල් 628.21). ඉහළම විකුණුම් සාමාන්‍යය වාර්තා වුයේ පහත රට තේ මගින් කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,340 ක් වශයෙනි. 2022 වර්ෂයේ දී වාර්ෂික විකුණුම් ප්‍රමාණය මිලියන 249ක් වූ අතර 2021 දී එය තේ කිලෝග්‍රෑම් මිලියන 296ක් විය. එනම්, පොදු, පෞද්ගලික සහ සෘජු විකුණුම් ඇතුළුව, සමාලෝචිත වර්ෂය සඳහා කිලෝග්‍රෑම් මිලියන 47ක අඩුවීමක් (16%) වාර්තා කරන ලදී. 2022 ජනවාරි මාසය තුළ මේ දක්වා විකුණුම් සාමාන්‍යය කිලෝ ග්‍රෑමයකට රුපියල් 705ක් වූ අතර එය 2021 ජනවාරි මාසයට සාපේක්ෂව කිලෝ ග්‍රෑමයකට රුපියල් 60 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. වසරේ පළමු මාස තුන තුළ විකුණුම් සාමාන්‍යය රුපියල් 700 – 850 අතර වාර්තා වූ නමුත් ඉතිරි මාස තුළ දී මසකට රු.1200ට වැඩි විය.

අලෙවි ක්‍රම

කර්මාන්තශාලාවල නිපදවන තේ අලෙවි කරන ප්‍රධාන මාදිලිය වන්නේ ප්‍රසිද්ධ වෙන්දේසියයි 2022 වසරේදී තේ කිලෝ ග්‍රෑම් මිලියන 241ක ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියේ දී අලෙවි කරන ලදී. පෞද්ගලික විකුණුම් කිලෝ ග්‍රෑම් මිලියන 6 ක් වූ අතර ඉතිරි කිලෝ ග්‍රෑම් මිලියන 2ක ප්‍රමාණය සෘජු විකුණුම් හරහා අලෙවි කරන ලදී.

කොළඹ තේ වෙන්දේසිය

කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය යටතේ ලංකා වානිප මණ්ඩලය මගින් පවත්වන කොළඹ තේ වෙන්දේසිය 2022 වසර තුළ දී වෙන්දේසි 50ක් පවත්වන ලදී. ප්‍රසිද්ධ වෙන්දේසියේදී කිලෝ ග්‍රෑම් මිලියන 46ක (16%) ක අඩු වීමක් වාර්තා විය. එම වසර තුළදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 626ක් ලෙස කොළඹ තේ වෙන්දේසිය තුළ වාර්තා වූ අතර එය පසුගිය වසර හා සැසඳීමේ දී 100%ක මිල වැඩි වීමකි.

භූමි උන්නතාංශය අනුව අලෙවිය

උන්නතාංශ තුනම අතුරින්, අලෙවි ප්‍රමාණය අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන අතර වාර්ෂික අලෙවිය පසුගිය වසර හා සැසඳීමේ දී 16%ක පහත බැස ඇති බව දක්නට ලැබේ. සියලු උන්නතාංශවල කිලෝවකට පවතින ඒකක මිල සැලකිය යුතු ප්‍රතිශතයකින් පහත බැස ඇත. කෙසේ වෙතත්, පසුගිය වසරට සාපේක්ෂව සමස්ත තේ විකුණුම් මිල රුපියල් 618.00 ක වර්ධනයක් පෙන්නුම් කළේය. පසුගිය වසර හා සැසඳීමේ දී එය 100%ක මිල වැඩිවීමකි.

චගුව 2,4: භූමි උන්නතාංශය අනුව තේ අලෙවිය

උන්නතාංශය	ප්‍රමාණය (කි.ග්‍රෑම් මිලියන)			
	2022	2021	වෙනස	%
උඩරට	53.72	63.52	(9.80)	(15.43)
මැදරට	42.08	52.34	(10.26)	(19.60)
පහතරට	152.84	179.94	(27.10)	(15.06)
මුළු විකුණුම්	248.64	295.79	(47.15)	(15.94)

උන්නතාංශය	එකක මිල (රු./කි.ග්‍රෑම්)			
	2022	2021	වෙනස	%
උඩරට	1,093.10	587.13	505.97	86.18
මැදරට	1,030.82	550.8	480.02	87.15
පහතරට	1,339.86	644.23	695.63	107.98
මුළු විකුණුම්	1,234.24	615.44	618.80	100.55

මූලාශ්‍රයථ ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තේ අපනයනය

සමාලෝචන වර්ෂය සඳහා කිලෝ ග්‍රෑම් මිලියන 250ක් වූ සමස්ත තේ අපනයනය (ප්‍රති අපනයනය ඇතුළුව) කිලෝ ග්‍රෑම් 36ක වර්ධනයක් පෙන්නුම් කළ අතර 2022 වර්ෂය සඳහා එය කිලෝ ග්‍රෑම් මිලියන 286ක් විය. සමාලෝචිත වර්ෂයේදී රුපියල් බිලියන 263ක් වූ අපනයන ඉපයීම් වර්ධනයක් පෙන්නුම් කළ අතර 2021 අවසානයේදී ඉපයීම වුයේ රුපියල් බිලියන 148කි. 2022 වසර තුළ දී සාමාන්‍ය වාර්ෂික FOB ඒකක මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 1643ක් වූ අතර සාපේක්ෂව එය පසුගිය වසරේ කිලෝ ග්‍රෑමයකට රුපියල් 921ක් ලෙස වාර්තා විය. ලෝක තේ වෙළෙඳපොළ තුළ තේ අපනයනය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව විකුණුම් ප්‍රමාණය අතින් තුන්වන ස්ථානයේ පසුවන අතර තේ මගින් ආදායම් ලබන රටවල් අතරින් දෙවන ස්ථානය හිමිකරගෙන සිටී. ගෝලීය තේ වෙළඳපොල තුළ ගුණාත්මක තේ සපයනු ලබන රටක් වශයෙන් ඉදිරියට යාමට ශ්‍රී ලංකාව සතු හැකියාව එමගින් පෙන්නුම් කෙරේ.

අපනයන කරුවන් තුළ දැකිය හැකි දැඩි තරඟකාරිත්වය රටෙහි තරඟකාරී තත්වය කෙරෙහි අයහපත් ලෙස බලපා ඇති අතර මෙම තත්වය ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන වියදම අධික වීම සහ තේ අස්වැන්න පහළ මට්ටමක පැවතීම යන කරුණු හේතුවෙන් වඩාත් උග්‍ර වී ඇත. රට අමතරව ගෝලීය තේ පරිභෝජකයන්ගේ වෙනස්වන රුචිකත්වයන් හමුවේ ශ්‍රී ලංකාව තවදුරටත් CTC තේවලින් බැහැරව සම්ප්‍රදායික තේ මත ම රැඳීසිටීමෙන් තම වෙළෙඳපොළ කොටස තව දුරටත් අහිමි විය.

නිෂ්පාදන ප්‍රභේදය අනුව තේ අපනයනය

සාමාන්‍යයෙන් සලකා බැලීමේදී, තේ දළුවල සම්භවය හා ගුණාත්මකභාවය අනුව තේ සඳහා ඇති රුචිකත්වය සැලකිය යුතු අන්දමෙන් වෙනස් වේ. මැද පෙරදිග සහ පොදුරාජ්‍ය මණ්ඩලයට අයත් ස්වාධීන රටවල් තුළ මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන පහත රට, සාම්ප්‍රදායික, තද රසයක් සහිත තේ සඳහා ඉල්ලුමක් පවතී.

2022 වසරේදී, ප්‍රති අපනයනයන් ද සහිතව සමස්ත කළු තේ, හරිත තේ සහ ක්ෂණික තේ අපනයනය ප්‍රමාණාත්මකව අඩුවීමක් පෙන්නුම් කරන අතර රුපියල් වටිනාකම අතින් ඉහළ නැගීමක් පෙන්නුම් කරයි. සාමාන්‍යයෙන් කළු තේ අපනයන ප්‍රතිශතය ආසන්න වශයෙන් සෑම වසරකම 97%ක් වන අතර හරිත තේ ප්‍රතිශතය 2%ක් පමණ හා ක්ෂණික තේ අපනයනය 1%ක් වශයෙන් පවතී. ප්‍රති අපනයනයන් ද සහිතව කිලෝ ග්‍රෑම් මිලියන 36ක ප්‍රමාණාත්මක වෙනසක් සහිතව සමස්ත තේ අපනයනය 12%ක පහත බැසීමක් පෙන්නුම් කරන ලදී. අපනයන සහ ප්‍රති අපනයන වෙන් වෙන් ම ප්‍රමාණයෙන් හා වටිනාකමෙන් පිලිවෙලින් 12%ක හා 14%ක පහල බැසීමක් පෙන්නුම් කරන ලදී. නවද, අපනයන සහ ප්‍රති අපනයන ප්‍රමාණයෙන් පිළිවෙලින් 56%ක හා 51%ක ඉහල නැගීමක් වාර්තා කරන ලදී. කෙසේවෙතත්, 2021 වසරේදී සමුච්චිත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1,324ක් වූ අතර 2022 වසරේදී එය ඇමරිකානු ඩොලර් මිලියන 1,259 විය. එනම්, 5% ක පහළ බැසීමකි.

ප්‍රස්තාරය 3.5: වාර්ෂික තේ අපනයනය 2022

උපනයන ස්වභාවය	ප්‍රමාණය (කි.ග්‍රෑම්)	වටිනාකම (රු)	FOB (රු./කි.ග්‍රෑම්)
අපනයනය			
කළු තේ			
මළු	17,856,567	50,318,834,916	2,817.95
තොග	109,326,468	157,876,743,351	1,444.09
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	2,519,201	3,628,421,839	1,440.31
ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ)	10,496,157	15,556,823,076	1,482.14
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	69,365,042	112,719,806,735	1,625.02
ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ)	27,206,924	34,118,331,231	1,254.03
සමස්ථ කළු තේ	**236,770,359**	**374,218,961,148**	**1,580.51**
හරිත තේ			
මළු	718,621	4,271,453,436	5,943.96
තොග	316,554	615,832,597	1,945.43
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	9,907	26,682,268	2,693.27
ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ)	7,809	19,831,902	2,539.62
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	775,359	2,274,194,074	2,933.08
ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ)	23,815	40,385,635	1,695.77
සමස්ථ හරිත තේ	**1,852,066**	**7,248,379,912**	**3,913.67**
ක්ෂණික තේ			
මළු	78	207,329	2,651.27
ඇසුරුම් (කි.ග්‍රෑ 3 ට වැඩි)	3,023,483	8,036,682,105	2,658.09
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	277	559,090	2,019.10
සමස්ථ ක්ෂණික තේ	3,023,838	8,037,448,524	2,658.03
සමස්ත අපනය	**241,646,262**	**389,504,789,584**	**1,611.88**
ප්‍රති අපනයන			
කළු තේ			
මළු	3,816,963	8,465,366,534	2,217.83
තොග	1,126,687	1,575,671,476	1,398.50
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	4,937	6,420,350	1,300.55
ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ)	647	1,835,327	2,835.53
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	1,086,921	2,071,493,422	1,905.84
ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ)	65,180	124,450,297	1,909.33
සමස්ථ කළු තේ	**6,101,336**	**12,245,237,406**	**2,006.98**
හරිත තේ			
මළු	1,271,310	7,083,652,184	5,571.93
තොග	282,161	317,932,572	1,126.78
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	308	1,600,114	5,195.18
ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ)	54,969	116,121,236	2,112.49
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	745,424	1,661,975,786	2,229.57
ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ)	16,760	34,604,432	2,064.70
සමස්ථ හරිත තෙ	**2,370,932**	**9,215,886,324**	**3,887.03**
ක්ෂණික තේ			
ඇසුරුම් (කි.ග්‍රෑ 3 ට වැඩි)	52,095	87,517,917	1,679.98
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	715	1,524,012	2,130.89
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	-	-	-
සමස්ථ ක්ෂණික තේ	52,810	89,041,929	1,686.09
එකතුව (ප්‍රති අපනයන)	**8,525,077**	**21,550,165,659**	**2,527.86**
මුළු එකතුව (අපනයන + ප්‍රති අපනයන)	250,171,340	411,054,955,243	1,643.09

මූලාශ්‍රය: ශ්‍රීලංකා තේ මණ්ඩලය

ප්‍රස්තාරය 3.4: මාසික තේ අපනයන 2022 - ප්‍රමාණයන සහ ඒකක



අගය එකතු කළ තේ අපනයන

තේ සඳහා වූ ගෝලීය රුචිකත්වය අගය එකතු කළ තේ කරා සිඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින අතර ගෝලීය සන්දර්භය තුළ, ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වෙළඳපොළ තත්වය ආරක්ෂා කර ගැනීම උදෙසා එකී වෙනස්කම්වලට ශ්‍රී ලංකාව අනුගත විය යුතුය. අගය එකතු කළ තේ එනම් කි. ග්‍රෑම් 03 වඩා අඩු ඇසුරුම්. තේ මළු සහ ක්ෂණික තේ අපනයනය 2022 වසරේ සමස්ත තේ අපනයනයෙන් 40% ක් විය. එමගින් උපයාගත් ආදායම රුපියල් බිලියන 201ක් වූ අතර එය සමස්ත අපනයන ආදායමෙන් 49% ක් විය.

වගුව 3.6: වාර්ෂික අගය එකතු කළ තේ අපනයනය – 2022

අපනයනය	වර්ගය	ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වටිනාකම් (රු.)	FOB (රු/ කි.ග්‍රෑ.)
අපනයනය	කළු	89,740,810	166,667,063,490	1,857.20
	හරිත	1,503,887	6,572,329,778	4,370.23
	ක්ෂණික	3,023,838	8,037,448,524	2,658.03
උප එකතුව		94,268,535	181,276,841,792	1,922.98
ප්‍රති අපනයනය	කළු	4,908,821	10,543,280,306	2,147.82
	හරිත	2,017,042	8,747,228,084	4,336.66
	ක්ෂණික	52,810	89,041,929	1,686.09
උප එකතුව		6,978,673	19,379,550,319	2,776.97
එකතුව		**101,247,208**	**200,656,392,111**	**1,981.85**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ප්‍රස්තාරය 3.5: අගය එකතු කළ තේ අපනයනය සහ තොග තේ අපනයනය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

අගය එකතු කළ තේ සඳහා FOB මිල තොග තේ මිලට වඩා වැඩියඑබැවින් තොග තේ වලට වඩා අගය එකතු කළ තේ අපනයනය සඳහා වන ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දේ. සමාලෝචන වර්ෂය තුළ අගය එකතු කළ තේ හා තොග තේ යන දෙවර්ගයම සඳහා FOB මිලෙහි ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. කිලෝග්‍රෑම් 3ක් දක්වා අපනයන කාණ්ඩ අගය එකතු කළ තේ වශයෙන් සලකා ඇත.

ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල්

අතීතයේ දී එක්සත් රාජධානිය, පකිස්ථානය හා ඊජිප්තුව තුළ ශ්‍රී ලංකා තේ සඳහා ශක්තිමත් වෙළඳපොළක් පැවතුන නමුත් වත්මනේ දී ශ්‍රී ලංකාව විසින් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 25 අතර එකී රටවල් නොපවතී. සමස්ත තේ අපනයනයෙන් 17%ක් ආනයනය කරමින් ඉරාකය ශ්‍රී ලංකාවේ තේ සම්බන්ධයෙන් ප්‍රධාන අපනයනකරුවා බවට පත් විය. එනම්, 2021 වසර හා සැසඳීමේ දී 2%ක වර්ධනයකි.

2022 වසරේ දී 10%ක අපනයන කොටසක් සහිතව දෙවන අපනයන රට බවට රුසියාව පත් වූ අතර එය 2020 වසර ට සාපේක්ෂව අපනයන ප්‍රමාණයේ 8%ක අඩුවීමක් පෙන්නුම් කරයි. ජර්මනිය සඳහා FOB මිලෙහි සාමාන්‍ය අගය 2022 වසරේ දී ඉහළම රටවල් දහය අතරින් ඉහළ මිලක් පෙන්නුම් කළ අතර එය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,882ක් විය. ප්‍රධාන රටවල් දහය අතරින් ඉරාකයල අසර්බයිජානය හා ජර්මනිය සිලෝන් තේ අනයනයේ තම තත්වය වැඩි දියුණු කර ගෙන ඇති අතර එක්සත් අරාබි එමීර් රාජ්‍යය, තුර්කිය, ඉරානයල චිනයල ලිබියාව හා චිලි හා සිරියාව විසින් 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ අඩු ප්‍රමාණයක් ආනයනය කර ඇත.

කෙසේවෙතත්, 2022 වසර තුළ ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 10 විසින් සිලෝන් තේ අපනයනයෙන් 67%ක් අපනයනය කර ඇත. මෙම රටවල් අතරින්, තුර්කිය විසින් ඉල්ලුම් කළ සිලෝන් තේ 48%කින් අඩු වී ඇත. එනම්, ඔවුන්ගේ මුදලේ අගය අඩු වීමයි. එමෙන්ම, නිෂ්පාදනයේ අඩුව හේතුවෙන් 2013 වසරෙන් පසු ලෝකයට සිලෝන් තේ සැපයුමේ ක්‍රමික අඩුවීමක් ඇත.

ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් ලැයිස්තුවේ රුසියාවට දෙවන තැන හිමිවී ඇත. එක්සත් අරාබි එමීර් රාජ්‍යය 9%ක අපනයන ප්‍රමාණයකින් දායක වෙමින් තෙවන ස්ථානයේ රැඳී සිටීමට සමත්වී ඇත. කලාපයක් වශයෙන් මැද පෙරදිග ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ප්‍රදේශය වේ. ඉහල තෙල් මිල හේතුවෙන් ඉල්ලුම විශාල වශයෙන් වැඩි වෙමින් පවතී. කෙසේ වෙතත්, ජර්මනිය, අසර්බයිජානයල එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා ඉරානය විසින් සාමාන්‍ය FOB ඒකක මිල සම්බන්ධයෙන් සැලකිය යුතු ඉහළ FOB මිල ගණන් පවත්වා ගන්නා ලදී. එපමණක් නොව, සමස්ත අපනයන ආදායම 2021 ට සාපේක්ෂව 2022 දී ඉහල නැගීමක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 411ක් ඉක්මවිය. කෙසේවෙතත්, අනෙකුත් කලාපවල තේ මළු භාවිත කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා තොග තේ අපනයනය මැද පෙරදිග දෙසට යොමු වී ඇත.

වගුව 3.7 ඇසුරුම් ක්‍රමය අනුව ප්‍රධාන රටවල් 20 සඳහා තේ අපනයන ප්‍රමාණයන් හා ශ්‍රේණිගත කිරීම – 2022

රට	ප්‍රමාණය කි.ග්‍රෑ.							හිමි ස්ථානය							
	මළු	තොග	ඇසුරුම් (>කි.ග්‍රෑ 3)	ඇසුරුම් (1-3 කි.ග්‍රෑ)	ඇසුරුම් (3 -5 කි.ග්‍රෑ)	ඇසුරුම් (4ග්‍රෑ -1 කි.ග්‍රෑ)	ඇසුරුම් (5කි.ග්‍රෑ-10කි.ග්‍රෑ)	මුළු එකතුව	මළු	තොග	ඇසුරුම් (>කි.ග්‍රෑ 3)	ඇසුරුම් (1%-3 කි.ග්‍රෑ)	ඇසුරුම් (3%-5 කි.ග්‍රෑ)	ඇසුරුම් (4%-1 කි.ග්‍රෑ)	ඇසුරුම් (5%-10 කි.ග්‍රෑ)
ඉරාකය	312,200	5,610,683	-	467,081	1,532,385	22,214,971	13,108,604	43,245,924	9	6	-	3	3	1	1
රුසියාව	714,113	19,975,038	439	-	10,440	4,017,989	15,170	24,733,188	8	1	10	-	13	4	10
එ.අ.එ.රාජ්‍ය	243,695	14,870,011	878	42,497	495,450	2,663,434	4,242,489	22,558,454	11	2	7	7	4	6	2
තුර්කිය	127,257	3,156,089	-	654,733	4,376,951	4,312,427	2,967,610	15,595,068	14	11	-	1	1	3	4
ඉරානය	157,027	6,707,148	-	543,225	363,825	1,182,854	4,105,750	13,059,829	13	5	-	2	5	12	3
අසර්බයිජානය	5,456	11,570,097	-	-	38,785	468,070	9,480	12,091,887	20	3	-	-	11	14	14
ලිබියාව	33,109	-	-	-	-	11,167,410	-	11,200,519	18	-	-	-	-	2	-
චීනය	208,689	9,333,154	72,129	60,509	4,661	344,932	1,104,808	11,128,882	12	4	3	6	14	15	5
ජර්මනිය	247,770	4,004,429	33,600	-		2,283,177	3,940	6,572,916	10	10	5	-	-	8	15
චිලි	816,728	5,432,585	671	-	-	230,849	32,690	6,513,522	6	7	9	-	-	17	9
ඇ.එ.ජ.	1,538,014	2,742,884	97,379	2,395	25,235	2,033,133	13,998	6,453,037	4	13	2	9	12	9	11
සෞදි අරාබිය	1,914,751	1,117,855	10,611	25,179	283,340	2,908,444	10,390	6,270,569	1	15	6	8	7	5	13
සිරියාව	875,850	453,625	-	455,625	2,708,435	1,601,483	58,500	6,153,518	5	16	-	4	2	11	8
ජපානය	805,272	4,814,867	703	-	71,585	86,714	125,515	5,904,655	7	8	8	-	9	19	6
නාගිවානය	106,245	4,247,876	34,230	145	303,501	143,273	122,635	4,957,905	16	9	4	10	6	18	7
ජෝර්දානය	1,884,500	21,708	-	-	65,000	1,959,231	282	3,930,721	2	18	-	-	10	10	17
හොංකොං	103,413	3,106,546	3	245,541	108,941	240,474	12,129	3,817,046	17	12	12	5	8	16	12
පෝලන්තය	1,562,346	1,275,010	-	-	29	539,636	1,300	3,378,321	3	14	-	-	15	13	16
බෙල්ජියම	113,085	194,497	117	-	-	2,589,480	-	2,897,178	15	17	11	-	-	7	-
අයර්ලන්තය	12,393	-	2,644,132	-	-	1,575	-	2,658,100	19	-	1	-	-	20	-
ප්‍රධාන රටවල් 20හි	11,781,908	98,634,099	2,894,893	2,496,930	10,388,563	60,989,555	25,935,291	213,121,239	-	-	-	-	-	-	-
මුළු එකතුව	**23,663,539**	**111,051,871**	**3,075,577**	**2,534,352**	**10,559,582**	**71,973,739**	**27,312,679**	**250,171,340**	-	-	-	-	-	-	-

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

රට	2022				2021				
	ස්ථානය	ප්‍රමාණය කි.ග්‍රෑ.	FOB රු./කි.ග්‍රෑම්	අපනයන කොටස (%)	ස්ථානය	ප්‍රමාණය කි.ග්‍රෑ.	FOB රු./කි.ග්‍රෑම්	අපනයන කොටස (%)	වර්ධනය (%)
ඉරාකය	1	43,245,924	1092.82	17.29	1	42,455,312	642.78	14.85	2
රුසියාව	2	24,733,188	1638.3	9.89	3	27,357,322	834.06	9.57	(10)
එ.අ.එ. රාජ්‍යය	3	22,558,454	1704.39	9.02	4	23,147,842	891.15	8.1	(3)
තුර්කිය	4	15,595,068	1503.25	6.23	2	29,745,684	858.71	10.41	(48)
ඉරානය	5	13,059,829	1748.66	5.22	5	15,833,588	887.83	5.54	(18)
අසර්බයිජානය	6	12,091,887	1749.26	4.83	8	10,591,096	882.58	3.7	14
ලිබියාව	7	11,200,519	1195.87	4.48	7	12,338,991	739.58	4.32	(9)
චීනය	8	11,128,882	1401.1	4.45	6	14,221,526	847.79	4.97	(22)
ජර්මනිය	9	6,572,916	1881.94	2.63	10	6,402,796	1025.87	2.24	3
චිලි	10	6,513,522	1394.49	2.6	9	8,834,919	809.2	3.09	(26)
ප්‍රධාන රටවල් 10 හි එකතුව		166,700,189	1,464.31	66.64		190,929,076	809.64	66.79	(13)
මුළු එකතුව		**250,171,340**	**1,643.09**	**100.00**		**285,871,722**	**921.23**	**100.00**	**(12)**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

කළු තේ අපනයනය

සමස්ත තේ අපනයනයෙන් 97% (කි.ග්‍රෑ. මි.243)ක ප්‍රමාණයක් කළු තේ අපනයනය කර ඇති අතර සමස්ත තේ අපනයන ආදායමෙන් 94% (රුපියල් බිලියන 386) ක් සඳහා දායකත්වය සපයා ඇත. ශ්‍රී ලංකාව කළු තේ අපනයනය කරන සියලු රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස මගින් 86%ක ප්‍රමාණාත්මකව හා 83%ක් වටිනාකමෙන් දායක වී තිබේ. සිලෝන් තේ අපනයනවලින් 17%ක ප්‍රමාණයක් ආනයනය කරමින් 2022 වසර තුළ දී ශ්‍රී ලංකාවෙන් කළු තේ ආනයනය කරනු ලබන රටවල් අතරින් ඉරාකය පළමු ස්ථානයේ රැඳුන අතර එම වසර තුළ දී සිලෝන් තේ අපනයනවලින් 10%ක ප්‍රමාණයක් ආනයනය කරමින් ශ්‍රී ලංකාවෙන් කළු තේ දෙවන ස්ථානයට වැඩියෙන්ම ආනයනය කළ රට බවට රුසියාව පත් විය. කෙසේවෙතත්, 2013 වසර දක්වා රුසියාව ශ්‍රී ලාංකීය කළු තේ ආනයනය කරන ප්‍රධාන රට වශයෙන් පැවතුනි. 2014 වසරේදී තුර්කිය ශ්‍රී ලාංකීය කළු තේ ආනයනයේ ප්‍රමුඛ රට බවට පත්විය. නැවතත් රුසියාව විසින් ශ්‍රී ලාංකීය කළු තේ ආනයනයෙන් 12% කට දායක වෙමින් 2015 වසර තුළ ශ්‍රී ලංකා කළු තේ ආනයනයේ පළමු ස්ථානයට පැමිණියේය.

3.9: කළු තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 20 සහ වෙළඳපොළ කොටස් 2022 (ප්‍රති අපනයනය සමග)

රට	ප්‍රමාණය (කි.ග්‍රෑම් මිලියන)	වටිනාකම (රු.බිලි)	FOB (රු / කි.ග්‍රෑම්)	ප්‍රමාණයේ කොටස (%)	වටිනාකමේ කොටස (%)	ප්‍රමාණයේ වර්ධනය (%)
ඉරාකය	43.21	47.20	1,092.34	17.79	12.21	1.83
රුසියාව	24.25	39.16	1,614.40	9.99	10.13	(9.48)
එ.අ.එ. රාජ්‍යය	22.22	37.78	1,700.04	9.15	9.77	(2.18)
තුර්කිය	15.58	23.41	1,502.74	6.41	6.06	(47.57)
ඉරානය	13.04	22.80	1,748.60	5.37	5.90	(17.57)
අසර්බයිජානය	12.09	21.13	1,748.55	4.98	5.47	14.21
චීනය	11.00	15.28	1,389.76	4.53	3.95	(21.05)
ලිබියාව	10.80	12.81	1,185.62	4.45	3.31	(10.94)
ජර්මනිය	6.45	11.98	1,858.54	2.65	3.10	2.71
චිලි	6.44	8.76	1,359.76	2.65	2.27	(26.31)
සිරියාව	6.15	10.83	1,760.79	2.53	2.80	(20.80)
සෞදි අරාබිය	6.13	13.86	2,262.99	2.52	3.59	(3.72)
ජපානය	5.90	11.43	1,938.25	2.43	2.96	(10.51)
ඇ.එ. ජනපදය	5.77	9.82	1,702.89	2.38	2.54	9.40
නාගිවානය	4.82	6.73	1,395.81	1.98	1.74	1.64
ජෝර්දානය	3.91	7.22	1,846.90	1.61	1.87	(24.84)
හොංකොං	3.81	5.16	1,354.02	1.57	1.34	(14.00)
පෝලන්තය	3.26	7.09	2,177.87	1.34	1.84	2.19
බෙල්ජියම	2.88	4.44	1,541.07	1.19	1.15	(18.11)
යුක්‍රේනය	2.21	3.73	1,689.15	0.91	0.97	(43.31)
ප්‍රධාන රටවල් 20හි	**209.91**	**320.63**	**1,527.48**	**86.43**	**82.97**	**(12.57)**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

හරිත තේ අපනයනය

වගුව 3.10: හරිත තේ අපනයනය කරන ප්‍රධාන රටවල් විස්ස - 2022

රට	ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වටිනාකම (රු.මිලි)	FOB (රු./කි.ග්‍රෑ.)	ප්‍රමාණයේ කොටස (%)	වටිනාකමේ කොටස (%)	ප්‍රමාණයේ වර්ධනය (%)
ඇමරිකා එක්සත් ජනපදය	587,122	3,257,205,316	5,547.74	13.90	19.78	(5.77)
රුසියාව	477,822	1,362,397,283	2,851.26	11.31	8.27	(14.92)
ලිබියාව	398,205	586,830,987	1,473.69	9.43	3.56	89.75
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	336,910	668,951,328	1,985.55	7.98	4.06	(22.14)
නෙදර්ලන්තය (ඕලන්දය)	229,982	1,302,209,778	5,662.22	5.45	7.91	(12.81)
යුක්‍රේනය	207,359	473,968,508	2,285.74	4.91	2.88	(45.42)
සෞදි අරාබිය	133,481	498,808,170	3,736.93	3.16	3.03	(6.44)
පෝලන්තය	121,132	490,713,793	4,051.07	2.87	2.98	(25.31)
ඕස්ට්‍රේලියාව	115,755	637,495,119	5,507.27	2.74	3.87	(9.33)
තායිවානය	104,933	223,413,203	2,129.10	2.48	1.36	1.80
නයිජීරියාව	95,210	373,800,486	3,926.05	2.25	2.27	17.19
ජර්මනිය	91,125	274,168,327	3,008.71	2.16	1.67	18.38
උස්බෙකිස්ථානය	76,124	189,190,696	2,485.30	1.80	1.15	8.84
චිලි	73,167	324,443,225	4,434.28	1.73	1.97	(22.96)
බොරැස්	65,664	173,556,630	2,643.10	1.55	1.05	50.23
චෙක් ජනරජය	64,574	433,432,826	6,712.16	1.53	2.63	36.26
එක්සත් රාජධානිය	62,737	491,723,801	7,837.83	1.49	2.99	(8.89)
කැනඩාව	60,882	333,820,004	5,483.09	1.44	2.03	(19.94)
චීනය	59,304	196,205,408	3,308.47	1.40	1.19	(40.81)
ප්‍රංශය	55,531	388,041,441	6,987.78	1.31	2.36	(53.80)
ප්‍රධාන රටවල් 20හි එකතුව	**3,417,021**	**12,680,376,329**	**3,710.95**	**80.91**	**77.02**	**(9.75)**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

2022 වසරේ දී සමස්ත තේ අපනයනයෙන් 2% (කිලෝ ග්‍රෑම් මිලියන 4.2) ක් සහ ආදායමෙන් 4%ක් (රුපියල් බිලියන 16.4ක්) සඳහා හරිත තේ මගින් දායක වී තිබේ. ශ්‍රී ලංකාවෙන් හරිත තේ අපනයනය කරන සියලු රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස මගින් ප්‍රමාණය අනුව 81% ක් හා වටිනාකම අනුව 77%ක් සඳහා දායක වේ. ශ්‍රී ලාංකීය හරිත තේ ආනයනය කරන ප්‍රධාන රටවල් අතුරින් ඇමරිකා එක්සත් ජනපදය සැලකියයුතු ප්‍රමාණයක් එනම් කි.ග්‍රෑම් මිලියන 0.6ක් සඳහා දායක වූ අතර එක්සත් රාජධානිය ඉහළ FOB මිලක් 2022 වසරේ දී වාර්තා කර ඇත. අනෙක් අතට, ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනු ලබන ප්‍රධාන පෙළේ සියලු රටවල් 20 ම පාහේ ඉහළ FOB මිලක් වාර්තා කරන ලද අතර ලිබියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය තුළ තරමක් පහළ මිල ගණන් වාර්තා විය. කෙසේ වෙතත්, පසුගිය වසර හා සැසඳීමේ දී 2022 වසර තුළ ශ්‍රී ලංකා හරිත තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 20 හි අපනයනයේ පහල යාමක් පෙන්නුම් කරන ලදී.

ක්ෂණික තේ අපනයනය

ශ්‍රී ලංකාවෙන් ක්ෂණික තේ ආනයනය කරනු ලබන ප්‍රමුඛ රටක් ලෙස ශ්‍රී ලංකා ක්ෂණික තේ වෙළඳපොල තුළ අයර්ලන්තය ක්ෂණික තේ කිලෝ ග්‍රෑම් මිලියන 2.6 (86%)ක ප්‍රමාණයක් ආනයනය කරමින් මහත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ ක්ෂණික තේ අපනයනය කරනු ලබන ඊළඟ ප්‍රමුඛ රටවල් වන්නේ පිළිවෙලින් ඇමරිකා එක්සත් ජනපදයල පකිස්ථානය, චීනය හා තායිවානය යි. සමාලෝචන වර්ෂය තුළ අපනයනය කළ සමස්ත ක්ෂණික තේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 3ක් වන අතර වටිනාකම රුපියල් බිලියන 8ක් වේ.

පානය සඳහා පිළියෙල කළ (RTD) තේ අපනයනය

2022 වර්ෂය තුළදී, පානය සඳහා පිළියෙළ කළ සමස්ථ තේ ලීටර් 4,757ක් අපනයනයෙන් රුපියල් මිලියන 4.8 ක අපනයන ආදායමක් ලබා ගත හැකි විය. ශ්‍රී ලංකාවෙන් ලීටර් 4,032ක් ආනයනය කරමින් ඉරාකය විසින් පානය සඳහා පිළියෙළ කළ තේ වෙළඳපොලේ වැදගත් භූමිකාවක් ඉටු කරන ලද අතර එමගින් රටට රුපියල් මිලියන 2.9ක අදායමක් ලැබිණි. එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඇමරිකා එක්සත් ජනපදය යනු ලංකාවේ පානය සඳහා පිළියෙළ කළ තේ අපනයන වෙළඳපොලේ සිටින අනෙකුත් ප්‍රධාන රටවල් ය. කෙසේ වෙතත්, පසුගිය වසර දෙක තුළ, ශ්‍රී ලංකා පානය සඳහා පිළියෙළ කළ තේ වෙළඳපොළ තුළ ක්‍රමික පහත වැටීමක් පවතින බව නිරීක්ෂණය විය.

ගෝලීය තේ කර්මාන්තයේ පසුබිම

තේ යනු ජලයට පමණක් දෙවෙනි වන ලෝකයේ නිතරම පරිභෝජනය කරන උණුසුම් පානවලින් එකකි. ස්වාභාවික පානයක් ලෙස එය ලෝකයේ සියලුම ජනවාර්ගික කණ්ඩායම් අතර සහ සෑම වයස් කාණ්ඩයකම පාහේ ජනප්‍රියය. ශ්‍රී ලංකාවෙන් කරනු ලබන අපනයන අතර, විශේෂයෙන් තේ මගින් ජාතික ආර්ථිකය හා සමාජ සංවර්ධනය සඳහා ඉතිහාසයේ පටන් වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම් සඳහා සැලකිය යුතු දායකත්වයක් වෙළඳ භාණ්ඩ පදනම් කරගත් නිෂ්පාදන මගින් සපයන අතර රටේ සේවා යෝජකයන් වැඩි ප්‍රමාණයක් සිටින කණ්ඩායමට තේ අංශයද ඇතුළත්ය.

තේ නිෂ්පාදනය කරනු ලබන රටවල් අතර ප්‍රධාන නිෂ්පාදකයින්

වන්නේ චීනය, ඉන්දියාව, කෙන්යාව, තුර්කිය හා ශ්‍රී ලංකාව යි. සමාලෝචිත වසර තුළ සිව්වන ස්ථානයේ රැඳී සිටීමට ශ්‍රී ලංකාව අපොහොසත් වූ අතර තුර්කිය ශ්‍රී ලංකාව අභිබවා සිව්වන ස්ථානයට පැමිණ තිබේ. එමෙන්ම, වියට්නාමය ප්‍රධාන නිෂ්පාදන රටවල් ලයිස්තුවේ පස්වන ස්ථානයට පත්විය. මෙම රටවල් පහ ලෝක නිෂ්පාදනයෙන් 85%ක් සහ ගෝලීය අපනයනයෙන් 80%ක් සඳහා දායක වේ. ලෝක තේ වගාව ඉහළ නැංවීම සඳහා චීනය ප්‍රමුඛ ලෙස වැදගත් වූ අතර අප්‍රිකානු මහාද්වීපය විශේෂයෙන් කෙන්යාව ද විශාල අස්වැන්නක් වාර්තා කළේය. කෙසේ වෙතත්, ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවේ පසුබම සැලකිල්ලට ගනිමින්, 2020 වසරේ කාර්ය සාධනය අනෙකුත් තේ නිෂ්පාදන සාමාජිකයින්ට සාපේක්ෂව අපනයන, නිෂ්පාදනය, වෙන්දේසි මිල සහ ආදායම් කාර්ය සාධනය (අපනයන) පිළිබඳ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සැලකිල්ලට ගැනීමේ දී මධ්‍යස්ථ මට්ටමක පවතී.

ගෝලීය තේ වගාව

2022 වසර අවසානයේදී ලෝකයේ තේ වගාව සහිත මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර මිලියන 5 ඉක්මවනු ඇතැයි ගණන් බලා තිබේ.

වගුව 3.11: වැඩිම තේ වගා බිම් පිළිබඳ විස්තර (හෙක්)

රට	2016	2017	2018	2019	2020	2021
චීනය	2,920,000	3,059,000	2,985,800	3,065,500	3,165,130	3,264,060
ඉන්දියාව	577,480	590,000	636,560	636,560	636,560	636,560
ශ්‍රී ලංකාව*	202,839	202,540	202,540	202,540	202,540	202,540
කෙන්යාව	218,538	232,742	234,300	269,430	269,430	269,430
වියට්නාමය	134,000	134,000	130,000	130,000	130,000	130,000
ඉන්දුනීසියාව	118,100	116,500	115,300	114,300	113,500	113,400
මියන්මාරය	80,000	80,000	81,000	81,400	81,400	81,600
තුර්කිය	77,000	77,000	83,000	83,000	83,000	83,000
බංගලිදේශය	59,000	59,000	59,300	61,000	65,429	65,972
ජපානය	43,100	42,400	41,600	40,600	39,100	38,000

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2022

*වගා කර ඇති බවට ලියාපදිංචි ඇස්තමේන්තුගත ප්‍රදේශ

ජාත්‍යන්තර තේ කමිටුවට අනුව වැඩිම තේ වගා ව්‍යාප්තියක් දකින්නට ලැබෙන්නේ චීනයේ (62.74%) වන අතර, වාර්ෂිකව ඔවුන් තම තේ වගාව සිෂ්‍රයෙන් ව්‍යාප්ත කරමින් සිටී. කෙන්යාව ද 2010 සිට 2021 දක්වා කාලය තුළ වැඩි බිම් ප්‍රමාණයක තේ වගා කරන ලදී. තේ වගා කරනු ලබන ප්‍රමුඛ රටවල් 10 ලොව සමස්ත තේ වගා ව්‍යාප්තයෙන් 94%ක ප්‍රමාණයකට හිමිකම් කියයි.

ගෝලීය තේ නිෂ්පාදනය

ප්‍රස්තාරය 3.6: ලෝක තේ නිෂ්පාදන සංඛ්‍යාදත්ත



මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

2021 වසරේ දී ගෝලීය තේ නිෂ්පාදනය කි.ග්‍රෑම් බිලියන 6.5ක් වූ අතර 2020 වසර හා සැසඳීමේදී එය 3%ක වර්ධනයකිග 2021 වසර තුළ දී, චීනය, ඉන්දියාව, කෙන්යාව, ශ්‍රී ලංකාව, තුර්කිය, වියට්නාමය සහ ඉන්දුනීසියාව මගින් ගෝලීය තේ නිෂ්පාදනයෙන් 91% ක් පමණ නිෂ්පාදනය කර ඇත. ඉන්දියාව සහ චීනය තවමත් විශාලතම තේ නිෂ්පාදකයන් වන නමුත් මෙම රටවල් දෙකෙහි තේ පරිභෝජනය සැලකියයුතු අන්දමින් ඉහළ මට්ටමක පවතින හෙයින්, ලොව විශාලතම තේ අපනයනකරු බවට කෙන්යාව පත්ව ඇත.

2021 වසර තුළ දී සීලෝන් තේ නිෂ්පාදනයේ ඉහළ නැගීමක් සහිතව ශ්‍රී ලංකාව ගෝලීය නිෂ්පාදක ලැයිස්තුව තුළ ලෝකයේ සිව්වන විශාලතම තේ නිෂ්පාදකයා බවට පත්වන අතරතුර තුර්කිය සිව්වන ස්ථානයට පැමිණ තිබේ. කෙසේ වෙතත්, 2021වසර තුළ ගෝලීය තේ නිෂ්පාදනයෙන් 5%ක කොසටක් සඳහා ශ්‍රී ලංකාව දායක වී තිබේ.

ලෝක තේ නිෂ්පාදනයෙන් 48%ක කොටසකට හිමිකම් කියමින් කි.ග්‍රෑ. මිලියන 3,120 ක් නිපදවමින් චීනය ඉහළ ම ස්ථානයේ රැඳී සිටින අතර ලෝක තේ නිෂ්පාදනයෙන් 21%ක කොටසකට හිමිකම් කියමින් ඉන්දියාව 2021 වසරේ දී කි.ග්‍රෑ. මිලියන 1,329 ක වාර්ෂික නිෂ්පාදනයක් වාර්තා කරමින් දෙවැනි ස්ථානයෙහි පසුවෙයි. කිලෝ ග්‍රෑම් මිලියන 533ක් නිෂ්පාදනය කරමින් හා 8%ක කොටසක් හිමිකර ගනිමින් කෙන්යාව තුන්වන ස්ථානයට පත්ව ඇත. ලෝක තේ නිෂ්පාදනයේ සිව්වන දායකයා වශයෙන් තුර්කිය 2021 වසරේ දී 4%ක කොටසකට හිමිකම් කියමින් තේ කිලෝ ග්‍රෑම් මිලියන 280ක් නිෂ්පාදනය කර ඇත.

ගෝලීය තේ පරිභෝජනය

2019-2021 තෙවසරක කාල වකවානුව තුළ වාර්ෂික තේ පරිභෝජනය සහ තෙවාර්ෂික සාමාන්‍ය ඒක පුද්ගල තේ පරිභෝජනය අනුව වාර්ෂික තේ පරිභෝජනය ඉහළින්ම පවතින්නේ චීනයේය. එය කි.ග්‍රෑ. මිලියන 2,489ක් ලෙස වාර්තාවී ඇති නමුත් ඒක පුද්ගල තේ පරිභෝජනය කිලෝ ග්‍රෑම් 1.78 ක් ලෙස වාර්තා වී ඇත. වාර්ෂික තේ පරිභෝජනය කි.ග්‍රෑ.මිලියන 269.47ක් වශයෙන් පවතින තුර්කිය ඉහළම ඒක පුද්ගල තේ පරිභෝජනය වන කි.ග්‍රෑ. 3.23 ක ප්‍රමාණය වාර්තා කරන ලදී. ලිබියාව ද කිලෝග්‍රෑම් 2.06ක් ලෙසට ඉහළ මට්ටමේ ඒක පුද්ගල පරිභෝජනයක් පෙන්නුම් කරයි.

වගුව 3.12: රටවල් අනුව තේ පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාලේඛන (එකතුව: කිලෝ ග්‍රෑම් මිලියන / ඒක පුද්ගල: කිලෝ ග්‍රෑම්)

රට	2017-19		2018-20		2019-21	
	එකතුව	එක පුද්ගල	එකතුව	එක පුද්ගල	එකතුව	එක පුද්ගල
ලිබියාව	17.83	3.02	15.33	2.64	14.13	2.05
ඇෆ්ගනිස්ථානය	30.77	1.02	27.87	0.91	25.63	0.82
තුර්කිය	252.30	3.04	263.27	3.2	269.47	3.23
එක්සත් රාජධානිය	106.77	1.59	107.6	1.61	102.25	1.52
මොරොක්කෝව	73.05	2.07	74.23	2.09	75.3	2.09
අයර්ලන්ත ජනරජය	9.76	2.00	10.38	2.1	9.89	1.99
නායිවානය	36.67	1.31	36.55	1.3	36.94	1.32
කටාර්	4.19	1.51	4.28	1.53	4.28	1.51
ශ්‍රී ලංකාව	29.16	1.35	29.53	1.36	29.59	1.35
හොංකොං	11.85	1.59	12.37	1.65	13.73	1.83
චිලි.	20.25	1.09	21.45	1.12	20.74	1.07
සිරියාව	10.70	0.60	9.85	0.64	10.9	0.61
ඊජිප්තුව	99.86	1.00	98.85	1	100.59	1
ඉරාකය	43.50	1.13	43.23	1.11	43.8	1.1
ඉරානය	81.87	1.00	78.23	0.94	73.27	0.87
චීනය	2,152.67	1.55	2289	1.64	2489	1.78
ඉන්දියාව	1,083.33	0.84	1091	0.83	1096.73	0.81
පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS)	245.33	0.83	239.23	0.82	237.75	0.82
පාකිස්ථානය	190.81	0.89	216.34	1.01	234.9	1.08
ඇ.එ.ජ.	120.96	0.37	114.09	0.35	112.54	0.34
ජපානය	104.21	0.82	100.05	0.79	97.26	0.77
ඉන්දුනීසියාව	94.33	0.35	95.33	0.36	95.67	0.35
බංගලිදේශය	82.83	0.50	85.17	0.51	88.17	0.52
පෝලන්තය	37.37	0.98	38.78	1.02	39.49	1.04
ජර්මනිය	28.07	0.34	24.93	0.3	23.82	0.29

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2022

ගෝලීය තේ අලෙවිය

2021 වසරේ දී කොළඹ තේ වෙන්දේසිය මගින් කි.ග්‍රෑ. 01 ක් සඳහා සාමාන්‍ය මිල ඇ.ඩො. 3.09ක් වශයෙන් කි.ග්‍රෑ. මිලියන 296ක් වෙන්දේසි කර ඇත. කෙසේ නමුත්, 2021 වසර තුළ දී මුම්බාසා වෙන්දේසියේ ද කි.ග්‍රෑ. මිලියන 500කට වැඩි ප්‍රමාණයක් හා කල්කටා වෙන්දේසියේ දී කි.ග්‍රෑ. මිලියන 169ක ප්‍රමාණයක් වෙන්දේසි කර ඇත. ලෝකයේ ප්‍රධාන වෙන්දේසි මධ්‍යස්ථාන සැලකීමේ දී, පසුගිය වසර කිහිපය තුළ කොළඹ වෙන්දේසිය මගින් ඉහළ සාමාන්‍ය මිලක් පවත්වා ගෙන ගිය බව පැහැදිලිව පෙනෙන කරුණ කි.

2021 වසර තුළ කොළඹ වෙන්දේසි මධ්‍යස්ථානය තුළ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 3 ඉක්මවූ අතර පසුගිය වසර කිහිපය තුළ දී තේ කිලෝ ග්‍රෑමයක මිල ඇමරිකානු ඩොලර් 3 ඉක්මවා පවත්වා ගැනීමට හැකි විය. සමාලෝචන කාල වකවානුව තුළදී චිතගොන්, කල්කටා සහ ගුවහටි වෙන්දේසිවල තේ කි.ග්‍රෑ. 01 ක මිල ඇ.ඩො. 2ක් ඉක්මවිය. කල්කටා දෙවැනි ඉහළ සාමාන්‍ය වෙන්දේසි මිල වාර්තා කළ අතර ගුවහටි තුන්වෙනි තැනට පත්විය.

වගුව 3.13: ප්‍රධාන තේ වෙන්දේසි සංඛ්‍යාලේඛන (ප්‍රමාණය - කි.ග්‍රෑ. මිලියන / සාමාන්‍ය ඒකක මිල ඇ.ඩො./කි.ග්‍රෑ.)

වෙන්දේසි මධ්‍යස්ථානය	2018		2019		2020		2021	
	ප්‍රමාණය	මිල	ප්‍රමාණය	මිල	ප්‍රමාණය	මිල	ප්‍රමාණය	මිල
චිතගොන්	79	3.12	85	2.31	82.99	2.05	88	2.32
කොචින්	48	1.81	42	1.66	41.52	1.92	48	1.92
කොළඹ	288	3.60	298	3.07	268.24	3.39	296	3.09
ගුවාහාත	177	2.13	150	2.09	162.52	2.69	155	2.49
ජකර්තා	-	-	-	-	-	-	-	-
කල්කටා	159	2.46	168	2.43	132.60	2.91	169	2.86
ලිම්බෙ	9	1.84	9	1.46	5.98	1.44	13	1.38
මොම්බාසා	458	2.43	454	2.04	516.80	1.93	504	1.97

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටුවේ වෙබ් අඩවිය

ගෝලීය තේ අපනයනය

ප්‍රස්තාරය 3.7: ප්‍රධාන තේ අපනයනකරුවන්



මූලාශ්‍රය: අතිරේකය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2022
සැගයු- ශ්‍රී ලංකාවට අදාළ සංඛ්‍යා ප්‍රති අපනයනයන් ඇතුළත් නොකර දක්වා තිබේ.

පසුගිය වසර හා සැසඳීමේදී 2021 වසර තුළ ගෝලීය තේ අපනයනය කි.ග්‍රෑ. මිලියන 49 (3%) කින් අඩු වුණි. පසුගිය වසර හා සැසඳීමේදී චීනය හා වියට්නාමය සිය අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් 7% සහ 2%ක ප්‍රමාණයෙන් අඩුවීමක් පෙන්නුම් කරයි. 2020 වර්ෂයට සාපේක්ෂව කෙන්යාව විසින් 7%ක වර්ධනයක් සහිතව අපනයන ප්‍රමාණයන්ගේ වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. විශාලතම තේ අපනයන කරුවන් තිදෙනා වන කෙන්යාව, චීනය සහ ශ්‍රී ලංකාව ගෝලීය තේ අපනයනයෙන් 64% කට වඩා වැඩි කොටසකට හිමිකම් කියා ඇත. 2021 වසරේ ප්‍රමුඛ පෙළේ තේ අපනයනකරුවන් සහ ඔවුන්ගේ අපනයන ආදායම් පහත දැක්වේ. එයට අනුව, තේ අපනයන මගින් වැඩිම ආදායමක් උපයාගන ලැබුයේ චීනය විසිනි. කෙන්යාව තෙවන විශාලම තේ අපනයන ආදායම් උපයන්නා බවට පත් විය. දෙවැනි තැනට වැඩිම අපනයන ආදායම් ලබන රට වශයෙන් ශ්‍රී ලංකාවට තම ශ්‍රී ලංකා තේ අපනයනය මගින් ඇ.ඩො. බිලියන 1.2ක කර්මාන්ත තත්වයක් පවත්වා ගැනීමට හැකිවිය.

ප්‍රස්තාරය 3.8: ඉහළම අපනයන ආදායම් මූලාශ්‍රය:



ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2022

4. තිරසාර සංවර්ධන ඉලක්ක වෙත යොමු වීම



තිරසාර සංවර්ධන ඉලක්ක යනු වසර 2030 වන විට මිනිසුන්ට සමෘද්ධිමත්, සමාන, සාධාරණ සහ සුරක්ෂිත ලෝකයක් සහ සියලු ආකාරයේ දරිද්‍රතාවය අවසන් කිරීම සඳහා වූ ප්‍රබල විශ්වීය එකඟතාවයකි.

වසර 2030 වන විට අපගේ ලෝකය පරිවර්තනය කිරීමේ අංගයක් වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක 169 සහ දර්ශක 230ක් අඩංගු වේ. න්‍යාය පත්‍රය 2015 සැප්තැම්බර් මස පැවති ඓතිහාසික එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සමුළුවේදී සාමාජික රටවල් 193ක් විසින් සම්මත කරන ලද අතර, එය 2016 ජනවාරි 1 දින සිට බලාත්මක විය.

තිරසාර සංවර්ධන අරමුණු සාකස්කර ඇත්තේ පෙර නොවූ විරූ උපදේශන ක්‍රියාවලියක් මගින් ජාතික ආණ්ඩු සහ ලොව පුරා වාසය කරන මිලියන සංඛ්‍යාත පුරවැසියන් සාකච්ඡා කිරීමට සහ බලාපොරොත්තු සහගත න්‍යාය පත්‍රය අනුගමනය කිරීම සඳහා එක් රොක් කරමිනි.

ස්ථාපිත ඉලක්ක 17න් තේ කර්මාන්තයට ඉලක්ක කිහිපයක් අදාළ වන අතර උප දර්ශක මගින් ශ්‍රී ලංකා තේ මණ්ඩල විෂය පථය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදු කරන ලද සියලු ව්‍යාපෘති හා වැඩසටහන් ආවරණය කරනු ලබයි. තේ කර්මාන්තයේ තිරසාර බව සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ සියලුම පාර්ශවකරුවන් දරන උත්සාහයන් එක් එක් ඉලක්ක යටතේ පහත කෙටියෙන් විස්තර කෙරේ.

1 දරිද්‍රතාවයෙන් තොරවීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය තේ කර්මාන්තය නියාමනයකින් යුක්තව පවත්වා ගැනීම තුළින් දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කරයි.

- තේ දළුවල ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා තේ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පත්‍ර ප්‍රමිතීන් සහතික කිරීම සහ කුඩා පරිමාණ හිමියන්ට සාධාරණ මිලක් ගෙවීම සඳහා නිත්‍ය අධීක්ෂණ යාන්ත්‍රණයක් පැවැත්වීම මගින් ලියාපදිංචි නිෂ්පාදකයින් හරහා පහළ මට්ටමේ වගාකරුවන් වෙත FOB මිල ඉහළ යෑමේ බලපෑම ගලායාම සහතික කිරීම. දැනට තේ කර්මාන්ත ශාලා 819 ක් පමණ සහ කුඩා තේ වතු හිමියන් 485,000ක් පමණ ඇත.
- 2022 වසර තුළ තේ නිෂ්පාදනය අඩු වුවද, කොළඹ වෙන්දේසිය තුළ ගැණුම් මිල සැලකිය යුතු අන්දමෙන් ඉහල යන ලදී.

3 නිරෝගී බව සහ යහපැවැත්ම

- කොවිඩ් 19 වසංගත වකවානුව තුළ රුපියල් මිලියන 1.2ක වටිනාකමකින් යුත් සිලෝන් තේ ප්‍රතිශක්ති වර්ධකයක් වශයෙන් රෝහල් කාර්යමණ්ඩයේ හා රෝගීන්ගේ පරිභෝජනය සඳහා ශ්‍රී ලංකාවේ තේ වගා කරනු ලබන ප්‍රදේශවල පිහිටි රජයේ රෝහල් වෙතට ලබා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කටයුතු කරන ලදී.

4 ගුණාත්මක අධ්‍යාපනය

- අදාළ අංශ ප්‍රධානීන්ගේ මගපෙන්වීම ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සඳහා සේවකයන් 19 දෙනෙකු සහභාගි විය.
- සිලෝන් තේ හා එහි ගුණය පිළිබඳ දැනුවත්බව වර්ධනය කිරීම මෙන්ම තේ කර්මාන්තය පිළිබඳ තොරතුරු ලබා දීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් ස්වාධීන රූපවාහිනියේ දොරමඩලාව වැඩසටහනට සහභාගි විය.

5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කිසිදු පක්ෂග්‍රාහිත්වයක් නොමැති අතර ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලුම ක්‍රියාකාරකම් සැකසීම සඳහා සියලුම පාර්ශවකරුවන් දිරිමත් කරනු ලැබේ.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2022 වසර තුළ සුර්ය බලශක්ති සහනාධාර වැඩසටහන සඳහා පොලි ගෙවීම් සිදු කළ අතර පොලි වශයෙන් රුපියල් මිලියන 23ක පමණ ගෙවීම් සිදු කර ඇත.

7 දැරිය හැකි පිවිතුරු බලශක්තිය

8 සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය

- ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ නිෂ්පාදන නවෝත්පාදන සහ විවිධාංගීකරණය දිරිගැන්වීම් සඳහා සහනාධාර යෝජනා ක්‍රමයේ නව ව්‍යාපෘති සැලසුම් ක්‍රියාකාරකම් සිදු කිරීම.
- අගය එකතු කළ තේ අපනයනය දිරිගැන්වීම් සඳහා අපනයනකරුවන් සඳහා 5% දිරි දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම් හා ඒ වෙනුවෙන් රුපියල් මිලියන 572ක් අපනයනකරුවන්ට ගෙවීමට සුදානම් කර ඇත.

- තේ කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇති අතර මේ වන විට රුපියල් මිලියන 22.79ක් වැය කරමින් කර්මාන්ත ශාලා 27ක් ආවරණය කර ඇත.

9 කර්මාන්ත නවෝත්පාදන සහ යටිතල පහසුකම්

12 වගකීමෙන් යුතු පාරිභෝජනය සහ නිෂ්පාදනය

- තේ කර්මාන්තශාලා ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර පිළිගැනීම් වැඩි දියුණු කිරීම් වෙනුවෙන් HACCP සහතිකය ලබා ගැනීම් සඳහා සහනාධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී.
- තේ අපනයනකරුවන්ගේ යන්ත්‍ර සඳහා සහනාධාර ලබා දීමේ වැඩසටහනක් සිදු කිරීම.

- තේ ඉඩම්වල නිසි ජලසම්පාදන පද්ධතියක් ඇති කිරීම සඳහා ජලසම්පාදන සහනාධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සිදු විය. මේ සඳහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 24.5ක මුදලක් 2022 වසරේ දී වෙන් කරන ලදී.
- උස් සෙවන වගා කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

13 දේශගුණික ක්‍රියාකාරකම්

17 තිරසාර සංවර්ධනය සඳහා පාර්ශ්වකරණයන්

- සිලෝන් තේ සඳහා ඉල්ලුමක් සහිත වෙළඳපොලේ විශාල පාරිභෝගික පිරිසක් අතර සිංහ ලාංඡනය සහිත සිලෝන් තේ සන්නාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ඊජිප්තුවට ශ්‍රී ලංකා තේ අපනයන කරනු ලබන සමාගම් හා එක්ව කයිරෝ හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කයිරෝ හි පිහිටි ඩැන්ඩි (Dandy) සුපිරි වෙළඳසැල තුළ සිලෝන් තේ වෙළඳ කුටියක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කරුතු සිදු කරන ලදී.
- භාවිත නොකළ කෝටාවන් සඳහා තීරුබදු ප්‍රතිලාභ හුක්ති විඳීමට පකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවෙන් පකිස්ථානයට යවනු ලබන අගය එකතු කළ තේ සම්බන්ධයෙන් නිෂ්පාදන විශේෂිත නීති රීති හඳුන්වා දීමේ අරමුණෙන් පකිස්ථානය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ, ආයෝජන හා ස්වයංක්‍රිය අංශ පිළිබඳ ඒකාබද්ධ කෘත්‍යාධිකාරී කණ්ඩායමේ හුන්වන රැස්වීමට යෝජනාව දෙන ලදී.
- පකිස්ථානයේ ආයෝජකයන් විසින් යෝජනාව ලබා ගන්නා ලද අතර අගය එකතු කළ තේ හලක් කරච්චි තුළ ස්ථාපිත කිරීම සඳහා කරච්චි තානාපති කාර්යාලය විසින් අදාළ යෝජනාව බාර ගන්නා ලදී.

5. මූල්‍ය සමාලෝචනය

මූල්‍ය තත්ව ප්‍රකාශය
2022 **දෙසැම්බර්** 31 **දිනට**

වත්කම්	සටහන්	2022 (රු.)	2021 (රු.)
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	F	1,613,886,378	908,011,343
ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම්	G	2,427,337	2,503,722
අස්පෘශ්‍ය වත්කම්	H	28,993,877	24,353,347
		1,645,307,592	**934,868,413**
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	I	34,494,977	32,614,625
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	J	476,573,193	133,629,022
තැන්පතු සහ පෙර ගෙවුම්	K	59,668,267	30,610,919
අනෙකුත් මූල්‍ය වත්කම්	L	9,881,196,687	8,752,587,569
මෑය	M	1,055,385,399	1,244,653,507
මුදල් සහ මුදල් හා සමාන දෑ	N	388,067,757	174,934,865
		11,895,386,281	**10,369,030,507**
මුළු වත්කම්		13,540,693,873	11,303,898,919
හිමිකම් සහ වගකීම්			
දායක ප්‍රාග්ධනය		672,012,202	672,012,202
රඳවා ගත් ඉපැයුම්		41,600,571	(172,889,012)
ප්‍රවර්ධන සහ අලෙවි බද්ද	O	9,869,442,654	9,476,026,219
ප්‍රත්‍යාගණන සංචිත		1,275,202,496	537,223,481
මුළු හිමිකම්		11,858,257,923	10,512,372,890
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ බැඳීම්	P	43,699,322	58,344,044
		43,699,322	**58,344,044**
ජංගම වගකීම්			
ගෙවිය යුතු ආදායම් බදු	Q	163,276,674	22,959,560
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	R	1,308,577,437	709,462,475
බැංකු අයිරාව	S	215,852	759,950
බැංකු ණය		166,666,666	-
		1,638,736,629	**733,181,985**
මුළු වගකීම්		13,540,693,873	11,303,898,919

පිටු අංක 67 සිට 78 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 79 සිට 93 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේය

Director Finance
Date: 27.02.2023

Director General
Date: 27.02.2023

Chairman
Date: 27.02.2023

Director
Date: 27.02.2023

ආදායම් ප්‍රකාශය
2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	සටහන්	2022 (රු.)	2021 (රු.)
ආදායම	A	797,122,462	616,447,345
වියදම			
තේ ක්ෂේත්‍ර සංවර්ධන වියදම්	B	(144,658,596)	(177,021,114)
පරිපාලන වියදම්	C	(504,880,134)	(449,018,159)
මෙහෙයුම් අතිරික්තය / (හිඟය)		147,583,732	(9,591,928)
මූල්‍ය ආදායම්	D	75,129,356	22,916,904
මූල්‍ය වියදම්	E	(174,594)	(169,885)
බදු අය කිරීමට පෙර අතිරික්තය / (හිඟය)		222,538,495	13,155,091
පොළී ආදායම මත ගෙවූ බදු	Q	(12,248,758)	(4,961,058)
බදු අය කිරීමෙන් පසු අතිරික්තය / (හිඟය)		210,289,737	8,194,033

පිටු අංක 65 සිට 70 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 71 සිට 91 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

	2022 (රු.)	2021(රු.)
කාලපරිච්ඡේදය තුළ අතිරික්තය/ (හිඟය)	210,289,737	8,194,034
සැබෑ තක්සේරුව	24,704,215	-
ප්‍රත්‍යාගණන අතිරික්තය	737,979,015	-
කාලපරිච්ඡේදය තුළ අතිරික්තය/ (හිඟය)	972,972,967	8,194,034

පිටු අංක 67 සිට 78 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 79 සිට 93 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2022 **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	දායක ප්‍රාග්ධනය (රු.)	ප්‍රවර්ධන හා අලෙවි බද්ද (රු.)	ප්‍රත්‍යාගණන සංචිත (රු.)	පවත්නා ඉපැයීම් (රු.)	සමුච්චිත ලාභය (රු.)
2020 **ජනවාරි 01 දිනට ශේෂය**	672,012,202	9,003,547,467	509,766,986	(117,001,094)	10,068,325,560
ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O)	-	148,907,390	-	-	148,907,390
ගැළපුම්	-	(1,064,340)	-	411,077	(653,263)
2020 වර්ෂය සඳහා අතිරික්තය	-	-	27,456,495	(21,447,654)	6,008,840
2020 **දෙසැම්බර් 31 දිනට ශේෂය**	672,012,202	9,151,390,518	537,223,481	(138,037,672)	10,222,588,528
2021 **ජනවාරි 01 දිනට ශේෂය**	672,012,202	9,151,390,518	537,223,481	(138,037,672)	10,222,588,528
ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O)	-	744,046,097	-	-	744,046,097
ගැළපුම්	-	(419,410,396)	-	(43,045,374)	(462,455,769)
2021 වර්ෂය සඳහා අතිරික්තය	-	-	-	8,194,034	8,194,034
2021 **දෙසැම්බර් 31 දිනට ශේෂය**	672,012,202	9,476,026,218	537,223,481	(172,889,012)	10,512,372,889
2022 **ජනවාරි 01 දිනට ශේෂය**	672,012,202	9,476,026,219	537,223,481	(172,889,012)	10,512,372,889
ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O)	-	391,720,699	-	-	391,720,699
ගැළපුම්	-	1,695,736	-	(20,504,369)	(18,808,633)
සැබෑ ලැබීම්		-	-	24,704,215	24,704,215
2022 වර්ෂය සඳහා අතිරික්තය	-	-	737,979,015	210,289,737	948,268,752
2022 **දෙසැම්බර් 31 දිනට ශේෂය**	672,012,202	9,869,442,653	1,275,202,496	41,600,571	11,858,257,923

පිටු අංක 67 සිට 78 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 79 සිට 93 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	2022 (රු.)	2021 (රු.)
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය	222,538,495	13,155,091
පහත සඳහන් කාරණා සඳහා ගැලපුම්:		
දේපල, පිරියත හා උපකරණවල ලාභය හෝ පාඩුව බැහැර කිරීම	42,208,606	38,154,509
දේපල, පිරියත සහ උපකරණ ක්ෂය වීම	1,380,288	930
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	2,193,170	3,909,037
කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරීම	76,385	76,386
ස්ථාවර වත්කම්	(691,683,083)	-
සත්‍ය ලැබීම්	24,704,215	-
ප්‍රත්‍යාගණන සංචිතය	737,979,015	-
පාරිතෝෂික ගැලපීම	(12,348,938)	957,006
මූල්‍යමය වියදම්	174,594	169,885
මූල්‍යමය ආදායම්	(75,129,356)	(22,916,904)
ගැලපුම්	(18,808,633)	6,198,261
	10,746,263	26,549,109
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	233,284,758	39,704,201
භාණ්ඩ ලැයිස්තුවල අඩුවීම / (වැඩිවීම)	(1,880,352)	2,779,513
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුත්ත දෑ අඩුවීම /(වැඩිවීම)	(342,944,171)	(45,309,268)
තැන්පතු සහ පෙර ගෙවුම් අඩුවීම /(වැඩිවීම)	(29,057,348)	18,737,812
වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ අඩුවීම /(වැඩිවීම)	599,114,962	68,568,208
ගෙවිය යුතු අදායම් බදුවල අඩුවීම /(වැඩිවීම)	128,068,355	(11,654,903)
ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා ණය	189,268,108	456,092,767
	542,569,554	489,214,129
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල	775,854,312	528,918,331
ගෙවනු ලැබූ පාරිතෝෂික	(2,295,785)	(13,074,643)
ප්‍රවර්ධන කටයුතු සඳහා ශුද්ධ වියදම	391,720,699	743,107,885
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල	389,424,914	730,033,242
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ	1,165,279,226	1,258,951,571
ආයෝජන ක්‍රියාකාරකම්වල (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ		
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් ප්‍රවාහ	195,532	7,900
මූල්‍ය ආදායම්	75,129,356	22,916,904
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	(6,735,492)	(9,578,977)
දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	(58,074,586)	(112,172,285)
පිරියත හා යන්ත්‍රෝපකරණ ඇතුළු ආයෝජන	(1,128,609,119)	(1,131,297,836)
ආයෝජන ක්‍රියාකාරකම්වල භාවිත කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	(1,118,094,308)	(1,230,124,294)
මූල්‍ය කටයුතුවලදී භාවිත කරන ලද මුදල් ප්‍රවාහ		
මූල්‍ය වියදම්	(174,594)	(169,885)
බැංකු ණය	166,666,666	-
ශුද්ධ මුදල් ප්‍රවාහ / මූල්‍ය කටයුතුවලදී (භාවිත කරන ලද)	166,492,072	(169,885)
ශුද්ධ වැඩිවීම (අඩුවීම) / මුදල් සහ මුදල් හා සමාන දේවල්	213,676,990	23,696,335
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	174,174,915	150,478,579
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	387,851,905	174,174,915

පිටු අංක 71 සිට 84 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 93 සිට 99 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

1. සංස්ථාව පිළිබඳ තොරතුරු

පොදු

1985 අංක 17.1990 අංක 44.2003 අංක 29 හා 2006 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාරි 01 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවන ලදී. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 574, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 27 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.

මූලික කාර්යයන්

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නියාමනය කිරීම, සංවර්ධනය කිරීම, සහ ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමයි. එයට තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම හා අධිකාරිය පැවරී ඇත. එනම්; තේ නිෂ්පාදනය, අලුත් ප්‍රදේශවල තේ වගාකිරීම සහ තේ නැවත වගාකිරීම, පැරණි තේ වතු පුනරුත්ථාපනය කිරීම, තේ කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් යනාදී කටයුතු ය. තවද, තේ වෙන්දේසි පැවැත්වීම, ගුණාත්මක තත්වය අධීක්ෂණය කිරීම මෙන්ම තේ විකිණීම, අපනයනය, තැරැව්කරුවන්, ගබඩා සහ තේ බෙදා හැරීම ආදී කටයුතු නියාමනය කිරීම ද එමගින් සිදුකරනු ලබයි. තේ වතු පාලනයේ සහ තේ නිෂ්පාදනයේ මෙන්ම අලෙවිකරණයේ නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීමද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා අදාළවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර.) පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මුදල් වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර) සහ ලංකා ගිණුම් ප්‍රමිති (ලං.ගි.ප්‍ර) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

3.1 ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පහත සඳහන් ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරන ලදී.

3.2 දේපළ, පිරියත සහ උපකරණ

කිසියම් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු වෙතොත් ඒවා හැර, දේපළ, පිරියත හා උපකරණ පිරිවැය යටතේ දක්වනු ලැබේ. එම පිරිවැය යන්නට දේපළ, පිරියත සහ උපකරණවල උපාංග කොටස් ප්‍රතිෂ්ඨාපනය කිරීම් සඳහා දරනු ලබන පිරිවැය සහ හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් දිර්ඝකාලීන ඉදිකිරීම් සඳහා අදාළ වන ණය පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් වරින්වර ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍යවන විටදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපිත උපාංග හඳුනා නොගන්නා අතර නව කොටස් ඒවායේ සඵල ආයු කාලය හා ක්ෂයවීම මත හඳුනාගනී. එසේම ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරන අවස්ථාවකදී එහි පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් ප්‍රතිෂ්ඨාපනයක් වශයෙන් පිරියත සහ උපකරණවල ධාරණ අගය මත හඳුනාගනී. අනෙකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද පිරිවැයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනී.

3.3 ක්ෂයවීම

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ පහත ආකාරයේ දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හෝ ඇස්තමේන්තුගත සඵල ආයු කාලය මත පදනම්වූ සෘජු රේඛීය ක්‍රමයෙනි.

සින්නක්කර ගොඩනැගිලි	අවුරුදු 50
කාර්යාල උපකරණ	අවුරුදු 02 - 20
ලීබඩු සහ සවිකුරු	අවුරුදු 01 - 20
මෝටර් වාහන	අවුරුදු 10
පරිගණක උපාංග	අවුරුදු 05
පුස්තකාල පොත්	අවුරුදු 05
රසායනාගාර උපකරණ	අවුරුදු 03 - 10
පරිගණක මෘදුකාංග	අවුරුදු 01 – 10

3.4 දේපල, පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම් ක්ෂය වීම පිලිබඳ ප්‍රයෝජ්‍ය ආයු කාලය හා ක්‍රමය සමාලෝචනය කරනු ලබයි. ඒවායේ අවිනිශ්චිතභාවයට හේතුවන මෙම අගයන්, අනුපාත හා ක්‍රම පිළිබඳ ඇස්තමේන්තුවක් කළමනාකරණ විසින් සිදු කරනු ලබයි.

3.5 ප්‍රත්‍යාගණනය

ඉඩම් සහ ගොඩනැගිල

ගම්පොල, නුවරඑළිය, රත්නපුර සහ බදුරලිය සහ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් සහ ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමේ කටයුත්ත තක්සේරු දෙපාර්තමේන්තුවට පවරා ඇත. ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ගම්පොල සහ බදුරලිය යන ප්‍රාදේශීය කාර්යාල ප්‍රති ඇගයීම් වාර්තා සමාලෝචිත කාල සීමාව තුළ ලැබී ඇත.

මෝටර් වාහන

මෝටර් වාහන නැවත තක්සේරු කිරීම සීමාසහිත ඔටෝමොබයිල් ඉංජිනියරින් සමාගමට පවරා ඇති අතර ප්‍රති ඇගයීම් වාර්තා ලබාගෙන ගිණුම්වල ගැලපීම් සිදු කරන ලදී.

රසායනාගාර උපකරණ

මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර ඇති අතර නැවත ඇගයීමේ කටයුත්ත තවමත් අවසන් කර නොමැත.

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

අනෙකුත් වත්කම්
අනෙකුත් වත්කම් නැවත තක්සේරු කිරීම ප්‍රාදේශීය කාර්යාල 04 ක් ආවරණය වන පරිදි සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් ලද වාර්තා සඳහා පමණක් ගිණුම්වල ගැලපීම් සිදු කරන ලදී.

3.6 සිදු වෙමින් පවතින ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

ශේෂ පත්‍රයේ දිනට ප්‍රාග්ධනීකරණය නොකරන ලද වර්ෂය තුළ වූ වියදම්, සිදු වෙමින් පවතින ප්‍රාග්ධන ක්‍රියාකාරකම් ලෙස දක්වන අතර ප්‍රාග්ධනීකරණය කර භාවිතයට ගෙන ඇති ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත හා උපකරණ යටතේ වර්ගීකරණය කර ඇත.

3.7 කල්බදු ඉඩම්

යම් විධිවිධානයක්, වත්කමක් හෝ කල්බද්දක් ආරම්භක දිනයේ දී විධිවිධානයේ තත්වය මත පදනම් වන්නේ ද, විධිවිධානය සපුරාලීම යම් දේපලක්/දේපොළ භාවිත කිරීම මත රඳා පවතින්නේ ද, නැතහොත් එකී විධිවිධානය මගින් දේපොළ භාවිත කිරීමේ අයිතිය ලබා දෙන්නේ ද (එම අයිතිය විධිවිධානයක නිශ්චිතව දක්වා නොමැති වුවද) යන්න තීරණය කෙරේ. කල්බදු වත්කම්වල ඇස්තමේන්තුගත සඵල ආයු කාලය පහත පරිදි වේ. කල්බදු ඉඩම - අවුරුදු 50.

3.8 අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේ පිරිවැය මත ගණනය කරනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව පිරිවැය අඩුකළ සමුච්චිත ක්‍රමක්ෂයට සහ කිසියම් සමුච්චිත හානි පාඩු වෙතොත් ඒ මත අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලැබේ. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තර වශයෙන් ඇති කරගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු නොලබන අතර පිරිවැය දරනු ලබන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය තුළ පිරිවැය දක්වනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

2021.12.31 දිනට අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම්	අපේක්ෂිත සඵල ආයු කාලය
POS පද්ධතිය - අළෙවි කවුන්ටරය	අවුරුදු 1
SOL Server 2012 ප්‍රමිතිය සඳහා බලපත්‍රය	අවුරුදු 2
Hsenid මෘදුකාංග පද්ධතිය	අවුරුදු 5
Finpac මෘදුකාංග	අවුරුදු 6
B 60 සහනාධාරය සඳහා මෘදුකාංග පැකේජය	අවුරුදු 4
Hsenid මෘදුකාංග නිපැයුම MSL/Co.	අවුරුදු 4
Factory Moder / ප්‍රතිරෝපණ මෘදුකාංගය	අවුරුදු 4
Jumla මාදිලියේ වෙබ් අඩවිය	අවුරුදු 2
Finpac ඒකක අනුකලනය	අවුරුදු 6
FINPAC ස්ථාවර වත්කම් මොඩියුලය	අවුරුදු 10
Hsenid – TI මොඩියුල මෘදුකාංගය	අවුරුදු 3
DMS- තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ මෘදුකාංගය	අවුරුදු 10
Hsenid මානව සම්පත් පද්ධතිය	අවුරුදු 3
DMS – තේ ඉඩම් දත්ත කළමනාකරණ පද්ධතිය	අවුරුදු 10
පද්ධතිය	අවුරුදු 5
Hsenid වැටුප් ගෙවීමේ මොඩියුලය	අවුරුදු 5
POS භාණ්ඩ ලැයිස්තු පාලන පද්ධතිය	අවුරුදු 10

3.9 ආදායම් බදු

වත්මන් ආදායම් බදු වත්කම් සහ වත්මන් හා පූර්ව කාලපරිච්ඡේද සඳහා බැරකම් මනිනු ලබන්නේ බදු අධිකාරීන්ගෙන් (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) අයකර ගැනීමට හෝ ඔවුන් වෙතට ගෙවීමට අපේක්ෂා කරන මුදලෙනි.

ප්‍රමාණය සංසන්දනය කිරීම සඳහා වාර්තා කරන දිනයේ දී බලපැවැත්වෙන හෝ සැලකිය යුතු අන්දමෙන් පනවනු ලබන බදු නීති භාවිත කරනු ලැබේ.

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම් සහ වියදම් පිළිබඳ මූලිකාංග මත පදනම් වන අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ගණනය කෙරේ.

3.10 භාණ්ඩ ලැයිස්තු

පළමුව ගත් භාණ්ඩය පළමුව නිකුත් කිරීමේ පදනම යටතේ කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරිත්වයක් සහිත අයිතම සඳහා නියමිත ගැළපීම් කිරීමෙන් පසු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග හඳුනාගනී.

3.11 මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වනුයේ අතැති සහ බැංකුවේ ඇති මුදල් මෙන්ම අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජනවලිනි.

4. වගකීම් සහ ප්‍රතිපාදන

4.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

4.1.1 නිර්ණිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය බැඳී සිටී. සේවකයෙකු පාරිතෝෂික ලබා ගැනීම සඳහා හිමිකම් ලබන්නේ එකී සේවකයා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අඛණ්ඩව වසර පහක සේවා කාලයක් සපුරන්නේ නම් පමණි. මෙම වගකීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 මගින් නිර්දේශ කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය මගින් ක්‍රියාත්මක කරන ලදී. "සේවක ප්‍රතිලාභ"- වර්ෂයේ ආරම්භයේ දී ඉදිරියට ගෙන එන ලද ප්‍රතිපාදන සහ වසර අවසානයේ ඉදිරියට ගෙන යන ලද ප්‍රතිපාදන අතර වෙනස වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සමඟ සම්බන්ධව පවතී.

ගණනයේ දී භාවිත කරනු ලබන ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ.

අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප් වර්ධන අනුපාතය	- 1.01% - 1.03%
පොලී අනුපාතය /වට්ටම් අනුපාතය	- 1.01% - 1.03%
කාර්ය මණ්ඩල පිරිවැටුම්	- 18%
	- 5.86%

ඒ අනුව උපකල්පන හා පැහැදිලි කරන ලද ක්‍රමවේදය මත පදනම්ව සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දිනට නියමිත නිර්ණිත ප්‍රතිලාභ වගකීමේ (PVD BO) වර්තමාන වටිනාකම රුපියල් 43,699,321.13ක් ලෙස දැක්වේ.

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

4.1.2 නිර්ණීත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ නීති රීති මගින් ආවරණයවන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දායකත්වය ලබා දේ. සේවකයන් සඳහා මෙම සැලසුම වෙත කරනු ලබන දායකත්වය වියදමක් ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල

අර්ථසාධක අරමුදල සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සේවකයාගේ දළ වැටුපෙන් 15%ක ප්‍රමාණයක් ද අදාළ සේවකයා විසින් තම දළ වැටුපෙන් 10% ක ප්‍රමාණයක් ද දායක කරනු ලැබේ.

සේවක භාරකාර අරමුදල

මේ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 3% ක ප්‍රමාණයක් දායක කරනු ලැබේ.

5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා පිරිවැය ක්‍රමවේදයේ ක්‍රියාකාරිත්වය මණ්ඩලයේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ ලෙස නියෝජනයවන පරිදි යොදා ගනු ලැබේ.

රජයේ ප්‍රදාන

ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ පවත්නා රජයේ ප්‍රදාන කර්මාන්ත නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය සහ තේ නැවත වගා කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය සඳහා සංවර්ධන සහනාධාර ගෙවීම වෙනුවෙන් සම්පූර්ණයෙන් ම භාවිත කෙරේ. පුනරාවර්තන වැය ශීර්ෂය යටතේ පවත්නා රජයේ ප්‍රදාන, සේවකයන්ගේ වැටුප් ගෙවීම සඳහා භාවිත කෙරේ.

5.1ආදායම් හඳුනාගැනීම

ගෙවීම් සිදු කරන කාලය නොසලකා, ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන ප්‍රමාණයට සහ ආදායම විශ්වසනීය ලෙස ගණනය කළ හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ගිවිසුම්ගත නිශ්චිත ගෙවීම් පිළිබඳ නියමයන් සැලකිල්ලට ගෙන ලැබුණු හෝ ලැබිය යුතු මුදල්වල සාධාරණ අගයට ආදායම ගණනය කරනු ලැබේ.

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත නිර්ණායක ද සපුරාලිය යුතුය.

භාණ්ඩ විකිණීම

කාර්ය සාධන බැඳීම් සම්පූර්ණ වීම මත අදායම හඳුනා ගනී. සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදා හැරීමේ දී, භාණ්ඩයේ හිමිකාරත්වය පාරිභෝගිකයාට පැවරෙන අවස්ථාවේදී ම ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එකී අදායම අපේක්ෂා කරනු ලබයි.

සේවා සැපයීම

සේවය සපයන හෝ ඉටුකරනු ලැබූ කාලපරිච්ඡේදයේදී සේවා සැපයීමෙන් ලබන ආදායම හඳුනාගනු ලැබේ. අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

පොළී ආදායම්

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන සියලුම මූල්‍ය උපකරණ සහ විකිණීම සඳහා තබා ඇති ලෙසට වර්ගීකරණය කළ පොලී, දරණ මූල්‍ය වත්කම් සඳහා පොලී ආදායම හෝ වියදම මූල්‍ය වත්කමේ අපේක්ෂිත ආයුකාලය හෝ ඊට අඩු කාලපරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තු ගත අනාගත මුල්‍ය ගෙවීම් හෝ ලැබීම් උචිත පරිදි මූල්‍ය වත්කමේ හෝ ශුද්ධ ධාරණ අගයට වට්ටම් කරනු ලබන සැබෑ අනුපාතය වන සළුල පොළී අනුපාතය භාවිත කරමින් වාර්තා කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුල පොළී ආදායම ඇතුල් කර ඇත.

5.2වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දරණ ලද සියලුම වියදම් වර්ෂය සඳහා අනිරික්තය ගණනය කිරීමේදී ආදායමට එකතු කර ඇත. අලුත්වැඩියා සහ අලුත්කිරීම් එම වියදම දරණ ලද වර්ෂය තුළදී ආදායමට හා වියදමට ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් විදේශ කාර්යාල තුනක් පවත්වාගෙන යනු ලැබේ. එම ඒකකවලට අනුයුක්ත නිලධාරීන් තිදෙනාගේ වැටුප්වලට අමතරව අනෙකුත් සියලු වියදම් සෑම ඒකකයකම (මොස්කව්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ චීනය) ප්‍රවර්ධන හා අලෙවි බදු යටතේ නඩත්තු වියදම් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

6. බැඳීම් හා ප්‍රතිපාදන

6.1 2022 දෙසැම්බර් 31 දිනට පවතින නඩු විභාග

අංකය	නඩු අංකය	අධිකරණය	පාර්ශව	ක්‍රියා මාර්ගය	වත්මන් තත්වය
1	30430 M	දිසා අධිකරණය, රත්නපුර	එස්.එම්.එස්.පුෂ්පකුමාර පැමිණිලිකරු ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් දෙදෙනෙකු - වගඋත්තරකරු	2 වන චිත්තිකරු විසින් පවත්වාගෙන යනු ලබන තේ කර්මාන්තශාලාවට පැමිණිලිකරු විසින් සපයන ලද හරිත තේ පත්‍ර සඳහා රුපියල් 756,077.35ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා සිටියි. (පොලි සහ නඩු ගාස්තු වශයෙන්)	බෙරුම්කරණය සඳහා පවති
2	HC/ARB/ 725/ 2022	වාණිජ මහාධිකරණය	කේ.ටී.ඊ.එන්. සුබසේන පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලය - චිත්තිකරුවන්	2021.10.04 දිනැති බේරුම්කරණ ප්‍රදානය ක්‍රියාත්මක කිරීම (ප්‍රදානය: රු. 485,232.00 x වාණිජ බැංකුවලට මහ බැංකුවෙන් ලබා දෙන ණය අනුපාතය - 1%) [2016.11.11 සිට - ගෙවන දිනය දක්වා] - 383.200.00	බෙරුම්කරණය සඳහා පවති
3	CA (Writ) 196/2020	අභියාචනාධිකරණය	සීමාසහිත එන්.එම්.එම්. සහෝදරයෝ (පුද්ගලික) සමාගම. - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවන්	පහත දැ අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම - දෙහිවත්ත තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීම - P2 සහ P4 ක්‍රියාත්මකවීම අත්හිටුවීම. - තේ තැරැව්කරුවන් විසින් පෙත්සම්කරුගෙන් නිමි තේ මිලදී ගැනීම වැළැක්වීම දෙහිවත්ත තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් හා P2 සහ P4 ලේඛන අහෝසි නොකරන ලෙසට සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම. දෙහිවත්ත තේ කර්මාන්ත ශාලාව වෙතින් නිමි තේ මිලදී ගැනීම සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් බලපත්‍රලාභී තේ තැරැව්කරුවන් හට සීමා පැනවීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති
4.	CA (Writ) 197/2020	අභියාචනාධිකරණය	ඊබ්‍රහිම් සිති සහ තවත් 04 දෙනෙකු - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවන්	පහත දැ අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම - රෝසිත් තේ කම්හල ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීම - P2 සහ P3 ක්‍රියාත්මකවීම අත්හිටුවීම. - තේ තැරැව්කරුවන් විසින් පෙත්සම්කරුගෙන් නිමි තේ මිලදී ගැනීම වැළැක්වීම රෝසිත් තේ කම්හල ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් හා P2 සහ P3 ලේඛන අහෝසි නොකරන ලෙසට සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම. රෝසිත් තේ කම්හල වෙතින් සෑදූ තේ මිලදී ගැනීම සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් බලපත්‍රලාභී තේ තැරැව්කරුවන් හට සීමා පැනවීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති

5.	CA (Writ) 198/2020	අභියාචනාධිකරණය	පී.සචාරිමුතු රෙට් සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගම - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවන්	පහත දැ අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම - උඩරට තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීම - P2 සහ P3 ක්‍රියාත්මකවීම අත්හිටුවීම. - තේ තැරැව්කරුවන් විසින් පෙත්සම්කරුගෙන් නිමි තේ මිලදී ගැනීම වැළැක්වීම උඩරට තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් හා P2 සහ P3 ලේඛන අහෝසි නොකරන ලෙසට සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම. උඩරට තේ කර්මාන්ත ශාලාව වෙතින් සෑදූ තේ මිලදී ගැනීම සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් බලපත්‍රලාභී තේ තැරැව්කරුවන්හට සීමා පැනවීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති
6.	CA (Writ) 199/2020	අභියාචනාධිකරණය	ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම -පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවන්	පහත දැ අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම - ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීම - P2 සහ P3 ක්‍රියාත්මකවීම අත්හිටුවීම. - තේ තැරැව්කරුවන් විසින් පෙත්සම්කරුගෙන් නිමි තේ මිලදී ගැනීම වැළැක්වීම ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් හා P2 සහ P3 ලේඛන අහෝසි නොකරන ලෙසට සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම. ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම වෙතින් සෑදූ තේ මිලදී ගැනීම, පිරිවැය දීමනා සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් බලපත්‍රලාභී තේ තැරැව්කරුවන් හට සීමා පැනවීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති

7	CA (Writ) 200/2020	අභියාචනාධිකරණය	එච්.එම්. රුමේෂ් රංගන පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවන්	පහත දැ අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම - නිව් ෆර්න්ලන්ඩ් තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීම - P2 සහ P3 ක්‍රියාත්මකවීම අත්හිටුවීම. - තේ තැරැව්කරුවන් විසින් පෙත්සම්කරුගෙන් නිමි තේ මිලදී ගැනීම වැළැක්වීම නිව් ෆර්න්ලන්ඩ් තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් හා P2 සහ P3 ලේඛන අහෝසි නොකරන ලෙසට සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම. නිව් ෆර්න්ලන්ඩ් තේ කර්මාන්ත ශාලාව වෙතින් සෑදූ තේ මිලදී ගැනීම සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් බලපත්‍රලාභී තේ තැරැව්කරුවන් හට සීමා පැනවීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති
8.	CA (Writ) 337/2020	අභියාචනාධිකරණය	මස්කෙළිය වැවිලි සමාගම - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවන්	අතුරු නියෝගයක් නිකුත් කිරීම -P8 සහ P5 ලෙස සලකුණු කළ ලේඛන ක්‍රියාත්මකවීම අත්හිටුවීම. -ක්‍රේග් වතුයායෙන් / තේ අළෙවියෙන් තැරැව්කරුවන් විසින් තේ මිලදී ගැනීම වගඋත්තරකරුවන් විසින් වැලැක්වීම නතර කිරීම -ක්‍රේග් තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම. -P8, P5 සහ P6 ලේඛන අහෝසි කෙරෙන සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම. ක්‍රේග් තේ කර්මාන්ත ශාලාව වෙතින් නිමි තේ මිලදී ගැනීම සම්බන්ධව බලපත්‍රලාභී තේ තැරැව්කරුවන් හට සීමා පැනවීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති

9.	CA (Writ) 364/2020	අභියාචනාධිකරණය	සම්රින් හොල්ඩින් පුද්ගලික සමාගම, රංගම් පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවන්	අතුරු නියෝගයක් නිකුත් කිරීම - සම්රින් තේ කම්හල ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීම අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම. - P7 සහ P8 ක්‍රියාත්මකවීම. - තේ වෙන්දේසියෙන් සහ විකිණීමෙන් තේ ඉවත් කර ගැනීමට තේ තැරැව්කරුවන්ට උපදෙස් නිකුත් කිරීම වැළැක්වීම. සම්රින් තේ කම්හල ලියාපදිංචිය අත්හිටුවීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම. P7 සහ P8 ලේඛන අහෝසි කරන ලෙසට සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම. සම්රින් තේ කම්හල වෙතින් නිමි තේ මිලදී ගැනීම/ විකිණීම සම්බන්ධව බලපත්‍රලාභී තේ තැරැව්කරුවන් හට සීමා පැනවීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති
10	CA (Writ) 415/21	අභියාචනාධිකරණය	තේ කම්හල් හිමියන්ගේ සංගමය - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් දෙදෙනෙක් - වගඋත්තරකරුවන්	(2021.06.29 දින නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව තේ කර්මාන්ත ශාලාවක් විසින් මිලදී ගන්නා හරිත තේ දළු සඳහා සාධාරණ මිලක් ගෙවීම- P3 ලේඛන අවලංගු කරමින් Certiorari ආඥාවක් P3 ලෙස සලකුණු කර ඇති ලේඛනය මත ක්‍රියාමාර්ග ගැනීම තහනම් කරමින් රිට් තහනමක් නිකුත් කිරීම. P3 පිරිවැය අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම.	බෙරුම්කරණය සඳහා පවති
11.	CA (Writ) 304/21	අභියාචනාධිකරණය	Rado Lanka (Pvt) Ltd - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් හත් දෙනෙකු - වගඋත්තරකරුවන්	P24 ලේඛන අවලංගු කරමින් සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම හා පිරිවැය ලබා දීම. (2021.01.21 දිනැති චක්‍රලේඛ අංක TC-CIR (204)/01/2021) වන්දි/හානි ලබා දීම රු. 100,000,000/-	බෙරුම්කරණය සඳහා පවති
12.	CA (Writ) 613/21	අභියාචනාධිකරණය	ඩබ්ලිව්.ඩී.එල්. විජේසිංහ, අංක 162, නැබොඩ පාර, මතුගම - පෙත්සම්කරු. ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් දාහත් දෙනෙකු - වගඋත්තරකරුවන්.	P16 ලේඛන අහෝසි කෙරෙන සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම. (2021.01.20 දිනැති විනය පරීක්ෂණ වාර්තාව) සහ P17 (2021.08.06 දිනැති විනය පරීක්ෂණ නියෝගය) පෙත්සම්කරු ප්‍රසම්පාදන නිලධාරී (II ශ්‍රේණිය) තනතුරෙහි නැවත සේවයේ පිහිටුවීම සඳහා මැන්ඩාමුස් ආඥාවක් නිකුත් කිරීම. පිරිවැය ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති
13.	SC FR 333/18	ශ්‍රේෂ්ඨාධිකරණය	කේ.බී.පී.එස්. ලක්ෂ්මන් - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලය - වගඋත්තරකරු	21වන වගඋත්තරකරුගේ සිට 24වන වගඋත්තරකරු දක්වා පත්වීම් අවලංගු කිරීම. පෙත්සම්කරු සහකාර තේ කොමසාරිස් (ATC) තනතුරට උසස් කිරීම. රු. මිලියන 1.5ක වන්දියක් හා නඩු පිරිවැය ගෙවීම.	බෙරුම්කරණය සඳහා පවති

14.	SC/SPL/ LA 238/2020	ශ්‍රේෂ්ඨාධිකරණය	සීමාසහිත සේසම් සෙන්හෝරා පුද්ගලික තේ සමාගම - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවනි	අතුරු නියෝගය - P7 සහ P9 ක්‍රියාත්මකවීම අත්හිටුවීම :තේ කම්හල්වල අනුමත ධාරිතාව- - තේ කම්හල්වල අනුමත ධාරිතාව මත තේ ලබා ගැනීම සඳහා බලපත්‍ර ලාභී තැරැව්කරුවන් මත සීමා පැනවීම වැලැක්වීම. වගඋත්තරකරුවන්ට (ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් 3 දෙනෙකුට) පක්ෂව ලබා දුන් අභියාචනාධිකරණයේ තීන්දුව පසෙක තැබීම. පෙත්සම්කරු විසින් ඉල්ලා සිටි පරිදි තීන්දුව ලබා දීම. පෙත්සම්කරුගේ පිරිවැය.	බෙරුම්කරණය සඳහා පවති
15.	SC/SPL/ LA 207/21	ශ්‍රේෂ්ඨාධිකරණය	සීමාසහිත මතුරට වැවිලි සමාගම - වගඋත්තරකාර පෙත්සම්කරු Rado Lanka (pvt) Ltd. සහ තවත් 7 දෙනෙක් - වගඋත්තරකාර පෙත්සම්කරු	Z ලෙස සලකුණු කර ඇති ලේඛනයට එරෙහිව අභියාචනා කිරීමට විශේෂ අවසරයක් ලබා ගැනීම (නඩු අංකයඟ CA(writ) 304/21),	බෙරුම්කරණය සඳහා පවති
16.	SC(HC)LA 90/2022	ශ්‍රේෂ්ඨාධිකරණය	වයි.එම්.ඒ.කේ. බණ්ඩාර - පෙත්සම්කරු ශ්‍රී ලංකා තේ මණ්ඩලය - වගඋත්තරකරු	2020.02.27 දිනැති කම්කරු විනිශ්චය සහ තීන්දුව පසෙක තැබීම (ප්‍රතික්ෂේප කිරීම - වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ සමඟ දිස්ත්‍රික් ව්‍යාපෘති සහකාර තනතුරේ නැවත පිහිටුවීම හා වන්දි, පිරිවැය ලෙස සාධාරණ මුදලක් ලබා දීම) 2022.08.09 දිනැති මහාධිකරණ තීන්දුව පසෙක තැබීම. අභියාචනා කිරීම සඳහා අවසර ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති
17.	SC(SPL)LA 292/22	ශ්‍රේෂ්ඨාධිකරණය	ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් 3 දෙනෙක් - පෙත්සම්කාර වගඋත්තරකරු කුරුගම තේ කර්මාන්ත ශාලාව (පුද්ගලික) සමාගම - වගඋත්තරකාර පෙත්සම්කරු	2022.09.26 දිනැති අභියාචනාධිකරණ තීන්දුව පසෙක තැබීම. අභියාචනා කිරීමට අවසර ලබා දීම.	බෙරුම්කරණය සඳහා පවති

7.අදාළ පාර්ශව සමඟ කරන ලද ගනුදෙනු

7.1රජයේ හා රජයෙන් පාලනයවන ආයතන සමඟ වූ ගනුදෙනු

සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරිත්වය තුළදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලය අදාළ පාර්ශවයන් සමඟ ගනුදෙනු සිදු කරයි. අදාළ පාර්ශවයන් ලෙස ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අවසාන හිමිකරු රජය වේ). රජයේ විවිධ දෙපාර්තමේන්තු සහ රජයෙන් පාලනයවන ආයතන ඇතුළත් වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රජයේ හා රජය මගින් පාලනයවන ආයතන සමඟ ඇති කර ගත් තනි තනි වශයෙන් වැදගත් සහ තනි තනිව වැදගත් නොවන නමුත් සාමූහිකව වැදගත් ගනුදෙනු සහ විධිවිධාන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

වසර 30ක කාල සීමාවකට ශ්‍රී ලංකා තේ කෞතුකාගාරය සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ දේපල භාවිත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමඟ 2001 දී ගිවිසුමකට එළඹ තිබේ. එයට අමතරව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රුපියල් මිලියන 34ක ණයක් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා දී ඇත.

7.2 තේ මන්දිරය (Tea Moments) සඳහා මිලදී ගත් ස්ථාවර වත්කම් ආපසු ලබා දීමේ පදනම මත තාවකාලිකව ශ්‍රී ලංකා කජු සංස්ථාවට පවරා දෙන ලදී.

7.3 ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වාහන 02ක් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයට ලබා දී ඇත.

ඉහත වාහන 02 තාවකාලික පදමන මත වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වෙතට ලබා දෙන ලදී.

8. ප්‍රධාන කළමනාකරණ වන්දි

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන නිලධාරී මඩුල්ලට අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුලත් වේ.
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති නිරාජ් ද මෙල් මහතා තේ කෞතුකාගාරයේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි.
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් එස්.ඒ. සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා තේ කෞතුකාගාරයේ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරමින් සිටි.

අමතර අනාවරණය කිරීම්
වෙළඳ හා වෙනත් කටයුතු සඳහා කුලියට පරිශ්‍ර ලබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය ගිවිසුම්වලට එළඹ තිබේ.

ප්‍රාදේශිය කාර්යාලය	ප්‍රදේශය	නම සහ ලිපිනය	ගිවිසුම් කාලය	මාසික කුලිය (රු.)
බදුරලිය	ඉංගිරිය	සිතා බමුණුසිංහ මහත්මිය 04 වන පටුමග, එල්ස්මෝර් වත්ත, පානදුර පාර, ඉංගිරිය	2022/1/1 - 2023.12.31	15,000.00
	ඇල්පිටිය	අයි.පී. කමලාවති මහත්මිය, "කමලා සිල්ලර බඩ" ඉගල, ඇල්පිටිය	2021/4/1 - 2023/3/31	15,000.00
ගාල්ල	යක්කලමුල්ල	එන්.පී. ජයතිලක මයා 13 තැපැල් කණුව, තෙලබුර, නාකියාදෙනියා, ගාල්ල	2022/1/1 - 2023/12/31	15,000.00
	ගාල්ල	ඉන්දු සුබුද්ධිකා විද්‍යාගම මිය, දිසානායක පාර, අනංගෙඩ.	2022/6/20 - 2024/6/19	15,000.00
	හිනිදුම	ඩබ්ලිව්. කේ. ඩී. සසිත් මහතා. "සසිත්", තවලම දකුණ, තවලම	2022/1/1 - 2023/12/31	15,000.00
ගම්පොල	බද්දේගම	ගුරුගේ පියල්කිත් මහතා, ගුරුගේ වී මෝල, බද්දේගම පාර, ගෝනාපිනුවල.	2021.08.01 - 2023.07.31	15,000.00
	ගම්පොල	ඩබ්ලිව්.ඒ.පී.යු. විජේසිංහ මහතා 173/ඒ, මහර, ගම්පොල	2022/8/1 - 2024/7/31	15,000.00
	උඩුනුවර	කේ. ඩී. එස්. කේ. සේනාධීර මිය 8/2, නාරන්වල, ගම්පොල	2022/8/8 - 2024/8/7	15,000.00
	මාතලේ	ආර්.පී. කරුණාසේකර මහතා, කයිකාවල මාතලේ	2022/4/23 - 2024/4/22	15,000.00
	මාවනැල්ල	එම්.පී.පී.ඩී. කරුණාරත්න මයා, අංක .89/1, කෙහෙල්වල, කිරිබත්කුඹුර, පේරාදෙණිය	2021/1/1 - 2023/1/1	15,000.00
	මහනුවර	ඩබ්ලිව්.එම්.සී කුමාරිහාමි මිය අංක 170/6, සමගි මාවත, රණවන, කටුගස්තොට	2020/12/31 - 2022/12/1	15,000.00
	නාවලපිටිය	එම්.ඒ.බී.වී ගුණසේකර අංක 800 2/1, නාවල්පටිය පාර, ඇත් ගාල, ගම්පොල	2021/1/7- 2022/1/7	15,000.00

රත්නපුර	කලවාන	ටී.එම්.එල්. කුමාරසිරි 'මල් රේණු', රද්දල්ල පාර, මානාන, කලවාන	2022/1/1 - 2022/12/31	15,000.00
	පැල්මඩුල්ල	එස්. ආර්. සමන් කුමාර ජයමාන්න වලව්ව පාර, පැල්මඩුල්ල.	2021/12/1 - 2022/11/30	15,000.00
	රක්වාන	එච්.එම්.පී.කේ කුමාරි මහත්මිය අංක 33/10, ටෙලිකොම් පාර, රක්වාන	2021/5/15 - 2023/5/31	15,000.00
	බලන්ගොඩ	එච්.කේ.එච්.ශ්‍රී ප්‍රියාල් මයා, ඇල්ලේපොල, බලංගොඩ	2022/6/1 - 2023/5/31	7,500.00
	කරවනැල්ල	කේ.ඩී.අජිත් කුමාර මයා, 297/3, කිරිවාන වෙන්දුල, රුවන්වැල්ල.	2022/03/01 - 2024.02.29	15,000.00
	රත්නපුර	වයි.එස්.කාන්ති, අංක 68බී, මුත්තට්ටුපිට, හිදැල්ලන, රත්නපුර	2022/4/1 - 2023/3/31	15,000.00
බණ්ඩාරවෙල	හාලි ඇල	වී.එම්.එන්.ආර්.කුමාරදාස 149/15, ස්ටේෂන් පාර, හාලි ඇල	2022/5/1 - 2024/4/30	15,000.00
	පස්සර	එච්.එම් විජේසුරිය මහතා, 07 කණුව, පැල්ගහතැන්න.	2022/8/01 - 024/7/31	15,000.00
	වැලිමඩ	කේ.ඩී ප්‍රේමවති වරල්ලවත්ත මිය, කැප්පෙට්පොළ, වැලිමඩ	2020/5/1 - 2022/4/30	15,000.00
නුවර එළිය	තලවකැලෙ	ඩබ්ලිව්.වී ධනපාල මහතා 350/1/A, නුවරඑළිය පාර, ලිඳුල	2022/8/13 - 024/8/12	15,000.00
	ගිනිගත්හේන	විජිත සේනානායක මයා, අංක 22, සැන්දෑ කඩේ, පාසල් මාවත, ගිනිගත්හේන.	2022/3/1 - 2024/2/08	15,000.00
	නෝර්වුඩ්	එස්. චන්ද්‍රසේකරම් මිය, පිනිබිදු, ෆෑටිහිල්, හැටන්	2021.03.01 - 2023.02.08	15,000.00
	කොත්මලේ	ඩී.එම්.පී.පී.ඒ.කේ. දසනායක, ශාවන්ති, හරංගලගම, නාවලපිටිය	2021/05/01 - 2023.04.30	15,000.00
	වලපනේ	පේ.එම්. දීපා ප්‍රියංගනී, අංක 147, වරක්ගොඩ, වලපනේ.	2022.01.01 - 2024.01.01	15,000.00
මාතර	දෙනියාය	ඔලිවර් ජයන්ත මයා, අංක 439/A, ගොවිජන සේවා පාර, දෙනියාය.	2022/3/15 - 2024/3/14	15,000.00
	උරුබොක්ක	ඊ.ඒ වන්නිආරච්චි මයා, දොඩම්කොරටුව, ගින්නලිය පාර, උරුබොක්ක	2021/12/31 - 2023.11.30	15,000.00
	මොරවක	එස්.පී.කේ.දහනායක මයා, වෙලගෙදර, දෙනියාය පාර, මොරවක	2022/10/1 - 2024/9/31	15,000.00
	අකුරැස්ස	පී. නලිනි ප්‍රියංකා මිය මහකුරුඳු වත්ත, මාතරපාර, අකුරැස්ස	2022/11/30- 2024/10/31	15,000.00
	කොටපොල	බී.පී.එස්. මධුරසාන් මයා, ගමගේ ස්ටෝර්ස් බාරේ, ගල්දොලගාව හේන, ගල්දොල, කොටපොල.	2021.07.01- 2023.06.30	15,000.00

නව නිවාසය – 570/1 , ගාලු පාරල කොළඹ 03. හර්ෂ විජේවීර මහතා	2021.02.01 සිට වසර 2ක්	100,000.00
සීමාසහිත ට්‍රයිකෝ ලොජිස්ටික් පුද්ගලික සමාගම	2021.11.26 – 2022.11.25	55,000.00
පී.ජේ.අමරතුංග මහතා - මාතර ප්‍රාදේශීය කාර්යාලය	2021.01.01 – 2023.01.01	100,000.00
රොසන්ති ද සිල්වා මිය, ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය	2020.03.11 – 2022.03.10	135,000.00

රුපියල් මිලියන 9.98ක් වටිනා ශේෂ පත්‍රයේ දිනට භෞතික කැපවීමක් නොමැති මූල්‍ය වර්ෂය (2021 දෙසැම්බර් 31) අවසන් වීමට පෙර කොන්ත්‍රාත්තු පුදානය කරන ලදි.

- **මහා භාණ්ඩාගාරය සඳහා ණය - ඒකාබද්ධ අරමුදල්**

ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් අනුමත කළ පරිදි, රුපියල් මිලියන 1000ක අතිරික්තය ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අවශ්‍ය වූ විටකදී ඉල්ලීම් කර ලබා ගැනීමට හැකිවන පරිදි ඒකාබද්ධ අරමුදලට පැවරීමට 1971 අංක 38 දරණ මුදල් පනතේ වගන්ති අංක 11 ප්‍රකාරව 2019 දී අනුමැතිය ලබා දෙන ලදී.

2019 ඔක්තෝබර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා නිවාඩු දීමනා සහ දීපාවලි උත්සව අත්තිකාරම් ලබා දෙන ලදී.

- **තේ කර්මාන්තශාලා නැවත බල ගැන්වීම සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය - රු. මිලියන 500**

කාරක ප්‍රාග්ධන දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින තේ කර්මාන්තශාලා සඳහා මහ බැංකුව හරහා ණය ලබා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය තීරණය කර ඇත.

	රු. මිලියන.
බැංකුවට පවරා දුන් මුළු මුදල	500
2022.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කිරීම	(234)
ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ලබා දුන් නොගෙවූ ණය ශේෂය (1-2)	266
2022.12.31 දිනට ප්‍රතිමූල්‍ය ප්‍රතිසාධනය	187.375
වසර තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ලබා දුන් මුදල්	453.325

2021 දෙසැම්බර් 31 වන සැපයුම් දාම නැවත සවිබල ගැන්වීමේ ණය යෝජනා ක්‍රමය (SCREL) වෙතින් හිඟයක් පවතී.

- **ප්‍රතිඵලදායී තේ පැල තවාන් පිහිටුවීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය**

ප්‍රමාණයෙන් අක්කර 10කට වැඩි පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ වතු සඳහා විසිරි ජල බින්දු නාක්ෂණය ඔස්සේ තේ තවාන් ජලසම්පාදනය කිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය හඳුන්වා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය තීරණය කර ඇත. අරමුදල් වෙන්කිරීම් ප්‍රවර්ධන හා අලෙවි බද්දෙන් සිදු කරන ලදී.

- **ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ලබා දුන් තාවකාලික ණය.**

රුපියල් මිලියන 34ක තාවකාලික ණයක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන දුෂ්කරතා මග හරවා ගැනීම සඳහා ලබා දෙන ලදී. මෙසේ ලබා දෙන ලද ණය පොලිය සමග අයකර ගැනීමට තීරණය විය.

- **සූර්ය බලශක්ති සහනාධාරය/ යෝජනා ක්‍රමය**

කර්මාන්ත ශාලා සඳහා විදුලිය නිපදවීම සඳහා "රුෆ් ටොප් සෝලා පවර්" පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා කර්මාන්තශාලා හිමියන් ලබාගෙන ඇති ණය සඳහා පොලී සහනාධාර ලබාදීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

2022 වර්ෂය තුළ කර්මාන්තශාලා 34ක් සඳහා සූර්ය බලශක්ති සහනාධාර යෝජනා ක්‍රමය සඳහා රුපියල් 20,997,759ක් ගෙවා ඇත.

මෑදු ණය යෝජනා ක්‍රමය යටතේ තේ කර්මාන්ත ශාලාව ඔස්සේ පොහොර බෙදා හැරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ හැරැවිකාර සමාගම් සමග ගිවිසුමකට එළැඹ ඇත.

- **ප්‍රවර්ධන සහ අලෙවි බද්ද**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තේ අපනයනය සඳහා අවසර ලබා දෙමින් රේගු හාණ්ඩ ප්‍රකාශය (CUSDEC) සඳහා අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී සෑම ලියාපදිංචි තේ අපනයනකරුවෙකුම සෑම තේ කිලෝග්‍රෑම් එකකට රු. 3.00ක් බැගින් ගෙවිය යුතුය. රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව එකතු කරනු ලබන සියලුම මුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමිත හිණුමකට බැර කළ යුතු අතර එමගින් මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදලට බොහෝ වශයෙන් දායකත්වය සැපයේ.

මෙම රෙගුලාසි (2010 ඔක්තෝබර් 27 දිනැති අංක 167714 දරන ගැසට් පත්‍රය) ක්‍රියාවට නැංවීමේදී නියමිත හිණුමේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට බැර වී ඇති සියලුම මුදල්, තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව තුළ හා බැහැරව සිදුකරනු ලබන ප්‍රවර්ධන හා අලෙවි කටයුතුවලට අදාළ කාර්යයන් සඳහා පමණක් භාවිතා කළ යුතුය.

- **කෙටි කාලීන ණය - ලංකා බැංකුව**

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය ලංකා බැංකුවෙන් කෙටි කාලීන ණය ලබාගෙන ඇත.

ණය විස්තරය	**ණය** 01	**ණය** 02	**ණය** 03
ගණන (රු)	2,000,000	10,00,000,000	500.000,000
කාලය	මාස 03	මාස 03	මාස 03
පොලි අනුපාතය	23.84	23.84	24.84

උකස් ස්ථාවර තැන්පතුව 89419144

ගණන රු 2,500,000/-

මෑදු ණය යෝජනා ක්‍රමය යටතේ තේ කර්මාන්ත ශාලාව මගින් පොහොර බෙදා හැරීම සඳහා සෙදවිය යුතු මුදල. රුපියල් 166,666,666.67 ක්වූ අවසාන වාරිකය 2023 ජනවාරි 26 දින පියවන ලදී.

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

		2022 (රු.)	2021 (රු.)
A. ආදායම			
භාණ්ඩාගාර ප්‍රදාන-- පුනරාවර්තන		164,175,000	180,000,000
ප්‍රාග්ධන හා සංවර්ධන		-	100,000,000
වැවිලි අමාත්‍යාංශයෙන් ලද ප්‍රදාන -ISSS		24,500,000	38,000,000
රසායනාගාර ආදායම	සටහන 1	19,802,796	4,993,851
ප්‍රවර්ධන සහ අලෙවි බද්දෙන් පොලිය		409,228,000	119,000,000
ලියාපදිංචි සහ අලුත් කිරීමේ ආදායම	සටහන 2	159,546,286	163,952,167
වාණිජ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය	සටහන 3	10,200,165	5,015,130
නුවර එළිය අලෙවි කවුන්ටරය හා සංචාරක නිකේතනය	සටහන 4	1,013,954	534,692
වෙනත් ආදායම්	සටහන 5	8,656,261	4,951,505
		797,122,462	616,447,345
B. තේ ක්ෂේත්‍ර සංවර්ධන වියදම්			
තේ කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනාක්‍රමය		19,762,438	20,187,582
තේ නැවත වගා සහනාධාර යෝජනාක්‍රමය		69,392,487	79,812,418
උස් සෙවණ වගා සඳහා සහනාධාර යෝජනා ක්‍රමය		271,500	133,500
යහපත් නිෂ්පාදන පිළිවෙත් - HACCP සහතිකය		1,204,682	259,727
තේ ඉඩම් ලියාපදංචිය		-	170,954
ආදර්ශ තේ වතු ව්‍යාපෘතිය		-	37,682,905
GMP-තෙතමන මීටර බෙදා දීමේ සහනාධාර යෝජනා ක්‍රමය		16,556,563	500,000
B-Leaf 60 වැඩසටහන		12,728,927	20,940
මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වගාකරුවන් සඳහා විසිරි ජල බිඳු පද්ධති ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය		24,500,000	38,253,089
ඵලදායිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන		207,000	-
අලෙවි නියෝජිත තැන්පතු මුදල් ආපසු ගැනීම		35,000	-
		144,658,596	177,021,114
C. පරිපාලන වියදම්			
පුද්ගල පඩිනඩි	සටහන 6.1	217,864,309	199,957,958
අනෙකුත් පරිපාලන වියදම්	සටහන 6.2	69,350,623	56,213,862
ගමන් වියදම්	සටහන 7	21,002,386	17,400,923
සැපයුම් සහ ආවශ්‍යතා	සටහන 8	20,210,677	16,568,467
අලුත්වැඩියා සහ නඩත්තු	සටහන 9	44,461,508	22,542,444
දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම්	සටහන F	40,637,405	36,487,463
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	සටහන H	2,193,170	3,909,037
කල්බදු දේපල ක්‍රමක්ෂය	සටහන G	76,385	76,386
උපයෝගිතා සහ වෙනත් වියදම්	සටහන 10	89,083,671	95,861,619
		504,880,134	449,018,159

	2022 (රු)	2021 (රු)
D. මූල්‍ය ආදායම්		
ආයෝජනයෙන් ලද පොළිය	75,129,356	22,808,317
ප්‍රාදේශීය වැවිලි සමාගම් වැටුප් ණය මගින් ලැබූ පොළිය	-	108,587
	75,129,356	22,916,904
E. මූල්‍ය වියදම්		
බැංකු ගාස්තු	174,594	169,885
	174,594	169,885

F දේපළ, පිරියත හා උපකරණ

F.1 ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල

	2022.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය	අපහරණ/ පැවරීම්	ප්‍රත්‍යාගණන ගැළපුම්	2022.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව
සින්නක්කර ඉඩම්	376,300,000	-	1,033,760,000	-	358,500,000	1,051,560,000
ගොඩනැගිලි	437,578,664	8,500,000	199,003,152	246,356,677	-	398,725,139
මෝටර් සහ වෙනත් වාහන	30,060,983	-	42,580,000	3,700,000	30,045,000	38,895,983
පිරියත හා යන්ත්‍ර	40,146,310	34,885,539	-	3,363,702	-	71,668,148
කාර්යාලීය උපකරණ	27,232,800	2,274,400	-	836,193	-	28,671,007
ජල විදුලිය හා දුරකථන	1,665,888	338,392	-	201,835	-	1,802,445
සැරසිලි හා ප්‍රදර්ශන භාණ්ඩ	2,098,707	-	-	1,072,100	-	1,026,607
ලිබඩු සහ සවිකුරු	41,132,780	683,630	-	140,793	-	41,675,617
පුස්තකාල පොත්	452,889	-	-	-	-	452,889
පරිගණක - දෘඪාංග	49,705,677	1,711,100	-	2,887,418	-	48,529,359
රසායනාගාර උපකරණ	172,039,656	3,024,020	-	32,132,089	600,000	142,331,588
	1,178,414,353	51,417,081	1,275,343,152	290,690,807	389,145,000	1,825,338,780
කරමින් පවතින වැඩ	34,736,816	6,657,505	-	36,736,248	-	4,658,073
ගොඩනැගිලි හා වෙනත්	34,736,816	6,657,505	-	36,736,248	-	4,658,073
	1,213,151,169	58,074,586	1,275,343,152	327,427,055	389,145,000	1,829,996,853

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන	2022.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම්	වර්ෂය සඳහා අයකිරීම	ප්‍රත්‍යාගණන ගැළපුම්	අපහරණ	ගැළපුම්	2022.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම්
ගොඩනැගිලි	80,939,181	8,819,405	64,175,166		(661,183)	26,244,603
මෝටර් සහ වෙනත් වාහන	24,313,526	4,411,499	24,862,375	2,096,667	1,750,000	15,983
පිරියත හා යන්ත්‍ර	30,721,303	5,215,819	-	3,363,700	-	32,573,420
ජල විදුලිය හා දුරකථන	1,665,888	8,865	-	201,835	-	1,472,918
කාර්යාලීය උපකරණ	19,258,128	3,107,312	-	638,193	-	21,727,247
සැරසිලි හා ප්‍රදර්ශන භාණ්ඩ	1,154,266	47,903	-	178,396	-	1,023,774
ලිබඩු සහ සවිකුරු	24,056,919	3,894,250	-	122,077	-	27,829,092
පුස්තකාල පොත්	442,975	4,701	-	-	-	447,675
පරිගණක දෘඪාංග	29,363,660	6,632,110	-	2,378,643	-	33,617,127
පුස්තකාල උපකරණ	101,993,324	8,495,541	-	32,132,089	-	78,356,776
	313,909,169	40,637,405	89,037,541	41,111,599	1,088,817	223,308,615
ශුද්ධ පොත් අගය	899,242,001					1,606,688,238

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
F.2 විදේශ කාර්යාල

	2022.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය	අපහරණ/ පැවරීම්	ගැළපුම්	2022.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව
මෝටර් සහ වෙනත් වාහන	14,242,318	-	-	-	-	14,242,318
කාර්යාලීය උපකරණ	1,874,090	-	-	-	-	1,874,090
ලිබඩු සහ සවිකුරු	822,786	-	-	-	-	822,786
පරිගණක - දෘඪාංග	336,457	-	-	-	-	336,457
	17,275,651	-	-	-	-	17,275,651

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන	2022.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම්	වර්ෂය සඳහා අයකිරීම	ප්‍රත්‍යාගණනය	ගැළපුම්	අපහරණ	2022.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම්
මෝටර් සහ වෙනත් වාහන	5,987,520	1,424,232	-	-	-	7,411,752
කාර්යාලීය උපකරණ	1,752,065	38,298	-	-	-	1,790,363
ලිබඩු සහ සවිකුරු	592,888	41,380	-	-	-	634,268
පරිගණක දෘඪාංග	173,836	67,291	-	-	-	241,128
	8,506,309	1,571,201	-	-	-	10,077,511
ශුද්ධ පොත් අගය	8,769,342					7,198,141

G. කල්බදු දේපල

	2022.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව	එකතු කිරීම්	අපහරණ/ පැවරීම්	ප්‍රත්‍යාගණනය	ගැළපුම්	2022.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව
කල්බදු දේපල - ප්‍රධාන කාර්යාලය	3,819,280	-		-	-	3,819,280
	3,819,280	-	-	-	-	3,819,280

ක්‍රමක්ෂය සඳහා ප්‍රතිපාදන	2022.01.01 දිනට සමුච්චිත ක්‍රමක්ෂය	වර්ෂය සඳහා ක්‍රමක්ෂය	ප්‍රත්‍යාගණනය	ගැළපුම්	කපා හැරීම්	2022.12.31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය
කල්බදු දේපල - ප්‍රධාන කාර්යාලය	1,315,558	76,385		-	-	1,391,943
	1,315,558	76,385	-	-	-	1,391,943
ශුද්ධ පොත් අගය	2,503,722					2,427,337

H. අස්පෘශ්‍ය වත්කම්

	2022.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව	එකතු කිරීම් අපහරණ/ පැවරීම්	ප්‍රත්‍යාගණනය	ගැළපුම්	කපා හැරීම්	2022.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව
පරිගණක මෘදුකාංග- ප්‍රධාන කාර්යාලය	26,907,478	3,000,000	-	-	-	29,907,478
කෙරිගෙන යන පරිගණක මෘදුකාංග වැඩ	14,434,407	6,735,492	-	3,000,000	-	18,169,899
	41,341,885	9,735,492	-	3,000,000	-	48,077,377

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන	2022.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම්	වර්ෂය සඳහා අයකිරීම	ප්‍රත්‍යාගණනය	අපහරණ	ගැළපුම්	2022.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම්
පරිගණක මෘදුකාංග- ප්‍රධාන කාර්යාලය	16,988,538	2,193,170	-	-	98,208	19,083,500
	16,988,538	2,193,170	-	-	98,208	19,083,500
ශුද්ධ පොත් අගය	24,353,347					28,993,877

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2022 (රු)	2021 (රු)
I. භාණ්ඩ තොග			
රසායනාගාර පාරිභෝගික භාණ්ඩ	සටහන 11.1	11,797,799	10,947,475
ප්‍රචාරණ ද්‍රව්‍ය සහ වෙනත්	සටහන 11.2	9,097,496	8,741,122
තේ සහ වෙනත් තොග	සටහන 11.3	11,847,221	10,491,154
වෙනත්	සටහන11.4	1,752,461	2,434,872
		34,494,977	32,614,623
J. වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ			
ලැබියයුතු දෑ	සටහන 12	57,649,591	46,042,643
නානාපති කාර්යාල ගිණුම්	සටහන12.1	132,574	1,380,329
තේ ප්‍රවර්ධන ඒකකය - පංගම ගිණුම්	සටහන12.2	23,491,024	14,633,373
කාර්ය මණ්ඩල ලැබියයුතු දෑ සහ වෙනත් අත්තිකාරම්	සටහන 13	395,300,004	71,572,676
		476,573,193	133,629,021
K. තැන්පතු සහ පෙර ගෙවුම්			
තැන්පතු සහ පෙර ගෙවුම්	සටහන 14	59,668,267	30,610,919
		59,668,267	30,610,919
L. අනෙකුත් මූල්‍ය වත්කම්			
ආයෝජන	සටහන 15	9,881,196,687	8,752,587,568
		9,881,196,687	8,752,587,568
M. ලැබිය යුතු ණය මුදල්			
මහා භාණ්ඩාගාරය		1,000,000,000	1,000,000,000
භාණ්ඩාගාරයට දුන් ණය (STF)		46,625,000	200,000,000
මහ බැංකුවට දුන් ණය	සටහන 18	-	21,449,815
ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා උත්සව අත්තිකාරම්	සටහන 18	8,760,399	23,203,692
		1,055,385,399	1,244,653,507
N. අතැති සහ බැංකුවේ ඇති මුදල්			
අතැති සහ බැංකුවේ ඇති මුදල්	සටහන 16	388,067,757	174,934,865

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2022 (රු.)	2021 (රු.)
ඔ. ප්‍රවර්ධන සහ අලෙවි බද්ද		
අපනයනකරුවන්ගෙන් රැස්කරගත් මුදල	754,176,431	1,028,676,021
ආයෝජන මත පොළිය	1,405,561,017	449,093,946
පොහොර ණය මත පොලිය	32,749,177	
ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට ලබා දුන් ආපදා ණය පොලිය	-	5,837
ප්‍රවර්ධන අයිතම විකිණීම	-	301,977
විනිමය වෙනස	8,946,889	-
තේ පිළිබඳ පොත් විකිණීම	2,400	1,400
	2,201,435,914	1,478,079,181
තිලිණ වශයෙන් ලබා දෙන තේ සහ තේ සාම්පල තිලිණ	2,473,058	5,729,548
සමාජ මාධ්‍යය	16,687,285	32,476,279
දේශීය ප්‍රවර්ධන වැඩසටහන	1,310,764	1,458,562
සන්නිවේදන ද්‍රව්‍ය සඳහා නිෂ්පාදන පිරිවැය (ATL/BTL)	1,575,990	338,281
ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළඳ සල්පිල් සඳහා සහභාගි වීම	104,201,553	40,495,448
විදේශ සංචාර	30,619	-
විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම	7,701,220	1,030,151
අනුකූල් උත්සව අවස්ථා	2,602,934	1,715,676
බුද්ධිමය දේපල කටයුතු	12,007,134	13,101,581
විදෙස් කාර්යාල පවත්වා ගැනීම	48,561,062	41,422,136
තේ වර්ග ප්‍රවර්ධනය	7,996,750	5,376,979
වැවිලි ප්‍රජාව සඳහා CSR ව්‍යාපෘතිය	1,018,378	1,240,000
වෙළඳපොල පර්යේෂණ හා වෙනත් වෙළඳපොල සහායක සේවා	4,039,664	1,718,878
බැංකු ගාස්තු	36,421	100
තේ කෞතුකාගාරය සඳහා ප්‍රදාන	3,000,000	3,000,000
විනිමය වෙනස	-	1,590,925
ප්‍රවර්ධනමය විනෝදාස්වාදය (විදෙස් නියෝජිතයන් / අවස්ථාවන්)	200,592	525,825
විදේශීය දූත මණ්ඩල සඳහා තිලිණ තේ	1,585,332	2,338,249
කුඩා පරිමාණයේ එළිමහන් ප්‍රචාරණ කටයුතු	69,061,525	13,539,078
රට ඇතුලත ප්‍රවර්ධන වැඩසටහන්	500,000	1,062,490
විදේශ නියෝජිතයන්ගේ පැමිණීම්	118,440	269,027
නානාපති කාර්යාල සමග වැඩසටහන	247,690	906,505
පැළ තවාන් සංවර්ධනය සඳහා සහනාධාර	750,000	212,590,710
විසිරි ජල බිඳු ක්‍රමය සහිත තේ පැළ තවාන් පිහිටුවීම - TSHDA	15,272,950	-
අහිමි වූ වෙළඳපොල නැවත ලබා ගැනීම	4,384,210	-
අගය එකතු කළ තේ අපනයන කරුවන් සඳහා දිරි දීමනා යෝජනාක්‍රමය	571,715,266	-
යාන්ත්‍රිකකරණය සමග නව වගාව සඳහා සහනාධාර ක්‍රමය	-	46,470,000
සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපනය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය	20,997,759	8,940,310
අපනයනකරුවන්ගේ යන්ත්‍රෝපකරණ සංරචක සඳහා සහනාධාර යෝජනා ක්‍රමය	33,885,388	1,747,900
පෙව පොහොර ව්‍යාපෘතිය සඳහා සහනාධාර ක්‍රමය	-	67,488,322
පොලි වියදම - ලංකා බැංකුව	133,352,253	-
මුළු වියදම	**1,065,314,237**	**506,572,960**
පොලි ආදායම මත ගෙවූ බද්ද	(335,172,977)	(108,460,124)
ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කළ පොලිය	(409,228,000)	(119,000,000)
	391,720,699	744,046,096

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

		2022(රු.)	2021 (රු.)
P. සේවක ප්‍රතිලාභ බැඳීම්			
2022.01.01ට PV-DBO		58,344,044	70,461,682
වර්තමාන සේවා පිරිවැය		1,853,350	3,682,093
පොලි පිරිවැය		10,501,928	5,777,858
PV - DBO මත සැබෑ (ලැබීම්)/ පාඩු		(24,704,215)	(8,502,945)
වර්ෂය තුළ ගෙවීම්		(2,295,785)	(13,074,643)
2022.12.31 දිනට PV-DBO		43,699,322	58,344,045
	SLTB(රු.)	**P&M levy (රු.)**	**මුළු වියදම(රු.)**
Q. ගෙවිය යුතු ආදායම් බදු			
2022.01.01 දිනය ශේෂය	-	22,959,560	22,959,560
වර්ෂය සඳහා ප්‍රතිපාදන	12,248,758	335,172,977	347,421,735
LESS: බදු ගෙවීම	(4,991,904)	(202,112,717)	(207,104,621)
2022.12.31 දිනට ශේෂය	7,256,854	156,019,820	163,276,674
R. වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ			
වෙළෙඳ ගෙවීම්	සටහන 17.1	7,656,271	19,573,999
අනෙකුත් ගෙවීම්	සටහන 17.2	363,296,515	306,342,795
කල් ඇතිව ලැබීම	සටහන 17.3	123,368,778	117,154,623
උපචිත වියදම්	සටහන17.4	635,804,675	56,780,608
වෙනත් ප්‍රතිපාදන	සටහන 17.5	178,451,198	209,610,450
		1,308,577,437	709,462,475
S . බැංකු ශේෂ - ලංකා බැංකුව			
රාස්කිරීමේ ගිණුම - ගාල්ල		3,970	30,312
රත්නපුර		134,533	-
මාතර		35,750	-
රාස්කිරීමේ ගිණුම - බණ්ඩාරවෙල		41,599	107,404
රාස්කිරීමේ ගිණුම - නුවර එළිය		-	622,234
		215,852	759,950

- **ප්‍රාග්ධන හා සංචිත**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ දී අනුදත් ප්‍රාග්ධනයේ වෙනසක් සිදුවී නොමැත.

- **දායක ප්‍රාග්ධනය**

2021.12.31 දිනට රුපියල් 672,012,201.85 ක් වූ රජයේ ප්‍රදානවලින් දායක ප්‍රාග්ධනය සකස්වී ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන
2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	2022 (රු.)	2021 (රු.)
01. රසායනාගාර ආදායම		
ISO 3720 ප්‍රමිති පරීක්ෂණය	4,936,500	1,766,851
රසායනික විශ්ලේෂණ පරීක්ෂණය	6,500	2,000
භෞතික පරීක්ෂණය	1,415,500	607,000
ක්ෂුද්‍රජීව විද්‍යාත්මක විශ්ලේෂණ පරීක්ෂණය	6,044,796	2,608,000
වෙනත් තේ සාම්පල පරීක්ෂණය	3,896,000	-
පලිබෝධක අවශේෂ විශ්ලේෂණ පරීක්ෂණය	3,490,000	-
තත්ත්ව සහතිකය සහ වෙනත් සහතික නිකුත් කිරීම	13,500	-
සීනි විශ්ලේෂණ පරීක්ෂණය	-	10,000
	19,802,796	4,993,851
02. ලියාපදිංචි කිරීමේ සහ අළුත් කිරීමේ ආදායම		
වෙළෙඳුන්ගේ බලපත්‍ර ගාස්තු	9,366,500	10,197,900
දඩ	5,654,644	4,418,299
නිෂ්පාදන තැරැව්කරුවන් සඳහා බලපත්‍ර ගාස්තු	2,245,000	1,745,600
ප්‍රතික්ෂේපිත තේ ලියාපදිංචි කිරීමේ ගාස්තු	1,300,130	1,196,000
තේ අපනයනකරුවන් ලියාපදිංචි කිරීම	1,100,000	975,000
තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,035,000	980,000
තේ අපනයනකරුවන්ගේ අලුත් කිරීමේ ගාස්තුව	42,150,000	40,090,000
තේ ඇසුරුම්කරුවන් අලුත් කිරීමේ ගාස්තුව	3,765,000	3,400,000
පුද්ගලික විකුණුම් මණ්ඩල තක්සේරුව	5,379,000	5,997,260
සෘජු විකුණුම් සහතික කිරීමේ ගාස්තු	763,425	601,560
තත්ත්ව සහ වෙනත් සහතික නිකුත් කිරීම	-	17,900
තේ ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	29,081,969	33,734,131
ආනයන අයදුම්පත් විකිණීම	15,160	12,920
කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම	-	1,000,000
ගබඩා ලියාපදිංචි කිරීම	575,000	725,000
ගබඩාව අලුත් කිරීම	3,050,000	2,440,000
තේ නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම	330,000	330,000
ප්‍රතික්ෂේපිත තේ මිලදී ගැනීමේ අවසර පත්‍රය	42,115,069	46,523,615
තේ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම	20,000	475,000
බැංකු ඇපකර නිදහස් කිරීමේ අවසර පත්‍රය	414,000	453,000
තේ සාම්පල රස බැලීමෙන් ලැබෙන ආදායම	815,500	949,960
තේ ඇසුරුම්/වෙනත් සම්භවයක් ඇති තේ ලියාපදිංචි කිරීම	314,500	375,000
තේ කර්මාන්තශාලා ලියාපදිංචිය අලුත් කිරීම	4,550,000	4,300,800
තේ ආනයනකරුවන් අලුත් කිරීම	515,000	110,465
දේශීය ඇසුරුම්කරුවන් ලියාපදිංචිය	401,800	846,930
දේශීය ඇසුරුම්කරුවන් අලුත් කිරීම	785,225	-
GMP සහතික කිරීමේ ගාස්තුව	2,364,500	1,237,500
තේ සාම්පල පරීක්ෂණ ගාස්තු	1,439,864	818,327
	159,546,286	163,952,167

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2022 **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	2022 (රු.)	2021 (රු.)
03. වාණිජ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ ලාභය		
තේ අලෙවිය	16,792,380	6,809,891
අපනයන ඇසුරුම් අළෙවියෙන් ලද කොමිස් මුදල	6,744,081	4,227,002
ඒකාධිකාරී කුලිය	-	108,333
රෙදි බෑග් විකිණීම	91,080	50,504
විනිමය වෙනස	1,097	1,315
විදේශ මුදල් විකිණීමෙන් ලද ආදායම	27,365	-
	23,656,003	11,197,045
තේ සඳහා වියදම	(11,728,029)	(4,460,834)
හිස් පෙට්ටි සඳහා වියදම	-	(557,823)
තේ රැගෙන යන බෑග් සඳහා වියදම	-	(738,942)
කාර්ය මණ්ඩල දිරි දීමනා	(1,004,304)	(185,325)
ක්‍රෙඩිට් කාඩ්වලින් ලද කොමිස් මුදල	(723,505)	(238,992)
වාණිජ ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ ලාභය	**(10,200,165**	**5,015,129**
04. නුවර එළිය විකුණුම් කවුන්ටරය සහ සංචාරක බංගලාව		
විකුණුම් කවුන්ටරය - කුලි ආදායම හා විකිණීමෙන් ලද කොමිස් මුදල	682,954	500,342
සංචාරක බංගලාව	331,000	34,350
	1,013,954	**534,692**
05. වෙනත් ආදායම්		
කාර්යමණ්ඩල ණය සඳහා පොළිය	1,545,236	1,612,404
විවිධ ආදායම	4,993,316	2,391,409
සංඛ්‍යානමය සාරාංශය විකිණීම	117,786	87,350
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	458,000	266,000
පුවත් ලිපිය	108,000	414,000
පෝස්ටර්, නාමාවලි සහ අනෙකුත් දෑ විකිණීම	12,135	7,342
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ ලාභය	1,380,288	-
අපනයනකරුවන්ගේ නාමාවලි/ දැන්වීම් ලියාපදිංචි කිරීම	27,000	-
විශ්ලේෂණ පිරිවැය	14,500	-
විභාග ගාස්තු	-	173,000
	8,656,261	**4,951,505**
06. පරිපාලන වියදම්		
6.1 පුද්ගල පඩිනඩි		
වැටුප	123,334,154	130,404,590
වෙනත් දීමනා (අන්තර්වාර / වෙනත්)	20,820,170	4,156,736
අතිකාල හා නිවාඩු දින දීමනා	7,718,512	8,526,646
දෛනිකව ගෙවන වැටුප	6,287,691	3,953,875
පිටත වියදම් දීමනා	23,533,120	24,361,165
කාර්යාල කටයුතුවලින් පසු වියදම් - අපනයන	-	48,825
සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය	19,331,151	22,960,283
සේවක භාරකාර අරමුදලට දායකත්වය	4,484,233	4,588,831
කාර්ය මණ්ඩල පාරිතෝෂික	12,355,278	957,006
	217,864,309	**199,957,957**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	2022 (රු.)	2021 (රු.)
6.2 වෙනත් පරිපාලන වියදම්		
සාමාජිකත්ව දායකත්වය (වෘත්තීය)	95,663	67,000
සාමාජිකත්ව දායකත්වය (වෘත්තීය)	6,325,000	4,000,000
කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා	40,657,400	31,947,683
වෛද්‍ය ප්‍රතිලාභ / පුද්ගලික අනතුරු වෙනුවෙන් හිමිකම් ඉල්ලීම්	3,239,792	1,718,701
කාර්ය මණ්ඩලයට සපයන දියර තේ	9,019,111	5,653,420
සේවක සුබසාධනය	2,475,150	1,620,946
මරණ පරිත්‍යාගය	750,000	750,000
ක්‍රීඩා / විනෝදාත්මක පහසුකම්	250,000	-
කාර්යමණ්ඩල දේපල රක්ෂණය සඳහා පොළිය	769,106	786,252
කාර්ය මණ්ඩල පුහුණු / සම්මන්ත්‍රණ / වැඩමුළු	640,030	1,099,990
මණ්ඩල / කමිටු සාමාජිකයින්ට ගාස්තු ගෙවීම්	514,500	2,000,500
මණ්ඩල රැස්වීම් වියදම්	161,225	80,835
විශ්ලේෂණ රසායනාගාරය - පරිභෝජන ද්‍රව්‍ය	3,926,390	4,494,140
විභාග ගාස්තු	144,561	525,815
ගනුදෙනුකරුගේ තැන්පතු ආපසු ගෙවීම්	-	5,000
උපදේශන ගාස්තු	356,305	1,395,300
සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු	26,390	68,280
	69,350,623	56,213,862
07. ගමන් වියදම්		
ගමන් වියදම් (දේශීය)	21,002,386	17,400,923
	21,002,386	17,400,923
08. සැපයුම් සහ අවශ්‍යතා		
මුද්‍රණ ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	7,568,552	9,774,702
ඉන්ධන සහ ලිහිසි තෙල්	9,819,488	4,197,406
යාන්ත්‍රික, විදුලි හා සාමාන්‍ය භාණ්ඩ	360,772	217,401
පොත්, චාර සඟරා සහ පුවත්පත්	631,930	785,481
නිල ඇඳුම්	1,829,935	1,593,478
	20,210,677	16,568,468
9. අලුත්වැඩියා , නඩත්තු කිරීම සහ ප්‍රාග්ධන වත්කම්		
වාහන අලුත්වැඩියාව හා නඩත්තුව	3,425,900	1,755,636
පිරියත හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව	4,294,267	371,434
ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තුව	12,933,901	5,515,279
කාර්යාල උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව	15,364,569	7,368,266
ගෘහ භාණ්ඩ හා සවිකුරු අලුත්වැඩියාව හා නඩත්තුව	42,014	363,647
වෙනත් උපයෝජන සේවා	52,151	65,359
සනීපාරක්ෂක සේවය	7,844,314	6,700,061
විද්‍යාගාර ප්‍රතිතනය හා උපකරණ නඩත්තු කිරීම	504,391	402,763
	44,461,507	22,542,445

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2022(රු.)	2021 (රු.)
10. උපයෝගිතා සහ වෙනත් වියදම්		
පුවත්පත් දැන්වීම්	8,941,992	5,909,996
දුරකථන, ෆැක්ස් සහ අන්තර්ජාලය	6,955,944	9,352,273
ෆැපැල් ගාස්තු	1,452,232	958,194
විදුලිය	10,095,444	8,665,618
ගාස්තු සහ බදු	1,535,626	1,476,416
කුලිය	10,283,695	10,141,495
රක්ෂණය - ගොඩනැගිලි, වාහන ආදිය	1,239,478	1,240,675
ආරක්ෂක සේවා	12,568,734	11,826,486
විගණන ගාස්තු	1,228,100	1,000,000
නීති ගාස්තු	945,040	360,957
වෙනත් ගාස්තු	1,457,947	655,843
තේ සාම්පල පරීක්ෂණ ගාස්තු	3,037,012	4,592,792
ජල සැපයුම සහ උණුසුම් කිරීම	1,038,038	811,498
තේ රස බැලීමේ මණ්ඩල ගාස්තු	3,506,532	2,104,380
විවිධ වියදම්	680,111	550,097
ප්‍රවාහන හා කුලි ගාස්තු	-	70,000
වාහන සඳහා බදු කුලි	22,231,371	19,928,976
ඉඩම් සඳහා බදු කුලි	480,000	620,400
බැහැර කිරීමේ පාඩුව	-	931
හදිසි අවස්ථා - කෝවිඩ් -19	1,199,275	15,564,842
නුවර එළිය වියදම්	207,099	29,750
	89,083,669	95,861,619
11. තොග		
11.1 රසායනාගාරය		
රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය	11,797,799	10,947,475
	11,797,799	10,947,475
11.2. පරිභෝජන ද්‍රව්‍ය		
ලිපි ද්‍රව්‍ය	8,279,224	6,723,205
ප්‍රවර්ධන ද්‍රව්‍ය	818,272	2,017,917
	9,097,496	8,741,122
11.3 තේ සහ වෙනත් තොග		
ප්‍රධාන ගබඩා	6,455,499	3,239,036
තේ - විකුණුම් කවුන්ටරය	266,463	228,440
කාර්ය මණ්ඩල සඳහා තේ	711,710	601,140
හිස් පෙට්ටි	4,288,556	6,314,183
තේ රැගෙන යන බැග්	79,994	74,956
ටයි පට්ටි	45,000	33,400
	11,847,221	10,491,154

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන
2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	2022 (රු.)	2021 (රු.)
11.4 සංක්‍රමණ භාණ්ඩ	1,752,461	2,434,872
	1,752,461	2,434,872
	34,494,977	32,614,625
12. ලැබිය යුතු දේ		
NIPM වාහන සඳහා ණය	1,333,333	-
විවිධ ලැබීම්	53,505,130	37,713,740
ණය ගැතියන් - ක්‍රිකට් ටී ෂර්ට්	-	679,123
ණය ගැතියන් පාලනය	811,372	4,200,041
ලැබිය යුතු ආදායම	1,303,359	2,615,679
පැකට් කළ තේ අලෙවිය	328,607	638,597
නිගය	367,790	195,463
	57,649,591	**46,042,643**
12.1 තානාපති කාර්යාල ගිණුම්		
චීනය	84,764	84,764
ජපානය	-	472,024
ප්‍රංශය	-	389,602
පෝලන්තය	-	405,645
ඕස්ට්‍රේලියාව	47,810	28,295
	132,574	1,380,330
12.2 තේ ප්‍රවර්ධන ඒකකය - ජංගම ගිණුම්		
එ.අ.එ. රාජ්‍යය	10,713,769	9,623,369
මොස්කව්	9,330,450	3,971,946
චීනය	3,446,805	1,038,059
	23,491,024	14,633,374
13. ණය සහ අත්තිකාරම්		
තේ නැරවිකරුවන්ට ලබා දුන් මුදල් පහසුකම්	322,043,365	-
ඒකාබද්ධ ණය - තේ කොමසාරිස් අංශය	5,251,360	5,784,906
ඒකාබද්ධ ණය - ප්‍රධාන කාර්යාලය	33,405,543	31,310,803
අත්තිකාරම් - උත්සව	435,650	446,900
කාර්ය මණ්ඩල තේ ප්‍රතිසාධනය	46,110	148,650
කාර්ය මණ්ඩල ණය ගැතියන්	16,500	18,337
අත්තිකාරම් - කුඩා තේ වතු සවර්ධන අධිකාරිය	33,470,665	33,470,666
කලින් කරන ලද වියදම්	619,352	-
ණය සහ අත්තිකාරම් - මොස්කව්	11,459	392,415
	395,300,004	71,572,677

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන
2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	2022(රු)	2021 (රු)
14. තැන්පතු සහ පෙර ගෙවුම්		
තැන්පතු	6,269,386	6,182,536
මුද්දර තැන්පතු	160,000	160,000
පාර්සල් තැපැල් තැන්පතු	44,940	44,940
තැන්පතු සහ පෙරගෙවුම් - එක්සත් අරාබි එමීර් රාජ්‍යය	-	249,130
තැන්පතු සහ පෙරගෙවුම් - මොස්කව්	-	66,510
තැන්පතු සහ පෙරගෙවුම් - චීනය	372,369	691,801
පෙර ගෙවීම්	48,273,744	10,161,541
සජීවිකරණ අත්තිකාරම්	4,547,828	13,054,461
	59,668,267	30,610,919
15. ආයෝජන		
ස්ථාවර තැන්පතුව - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	536,983,997	406,500,000
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	21,285,498	7,691,644
ස්ථාවර තැන්පතුව - ප්‍රවර්ධන හා අළෙවිකරණ බද්ද	9,145,424,351	8,138,139,498
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී - ප්‍රවර්ධන හා අළෙවිකරණ බද්ද	174,524,300	197,367,714
නිවාස ණය තැන්පතු - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	2,978,541	2,888,712
	9,881,196,687	8,752,587,568
16.මුදල් සහ මුදල් හා සමාන දෑ		
16.1 මුදල		
සුළු අක්මුදල් - මුද්දර	10,000	10,000
සුළු අක්මුදල් - පාලන	25,000	25,000
අත ඇති විකුණුම් මත එකතු කිරීම	727,371	609,980
	762,371	644,980
16.2 බැංකු ශේෂ		
ලංකා බැංකුව - කොල්ලුපිටිය 2	144,157,678	62,237,032
ලංකා බැංකුව- ආයතනික (ප්‍රධාන කාර්යාලය)	23,000	385,192
ලංකා බැංකුව - බම්බලපිටිය	28,484,916	639,779
ලංකා බැංකුව - ආයතනික (තේ කොමසාරිස් අංශය)	6,807,022	6,360,656
ලංකා බැංකුව - නිදහස් චතුරශ්‍රය	124,764,637	1,037,195
ලංකා බැංකුව - තේ සහනාධාරය	18,048,224	93,105,339
මහජන බැංකුව	49,777,984	14,250
	372,063,461	163,779,443

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2022 (රු.)	2021 (රු.)
16.3 ලංකා බැංකුව- ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුම්		
ගාල්ල	535,556	524,201
මාතර	166,650	371,819
රත්නපුර	847,887	1,330,979
මතුගම	222,569	492,173
බණ්ඩාරවෙල	547,919	198,679
ගම්පොල	77,475	45,621
නුවරඑළිය	208,766	228,517
	2,606,822	3,191,989
16.4 ලංකා බැංකුව- ප්‍රාදේශීය කාර්යාලයේ එකතු කිරීමේ ගිණුම්		
ගම්පොල	9,466,261	3,293,896
මතුගම	2,078,288	2,529,398
රත්නපුර	-	21,254
නුවරඑළිය	43,498	
මාතර	-	16,940
	11,588,047	5,861,488
16.5 ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුම්		
රත්නපුර	113,400	-
ගාල්ල	-	93,381
ගම්පොල	290,829	112,151
මතුගම	306,502	-
නුවරඑළිය	188,377	108,820
බණ්ඩාරවෙල	147,950	1,142,613
	1,047,058	1,456,965
	388,067,757	174,934,864
17.ණය හිමියන් සහ ප්‍රතිපාදන		
17.1 වෙළඳ ගෙවිය යුතු දෑ		
ගෙවිය යුතු දෑ	7,486,740	16,713,008
ණය හිමි පාලනය	139,325	1,375,920
ණය හිමි තේ ඇණවුම්	24,643	24,642
ණය හිමියන් සහ ප්‍රතිපාදන - චීනය	-	39,530
ණය හිමියන් සහ ප්‍රතිපාදන - මොස්කව්	5,563	508,669
ගෙවිය යුතු හරිත තේ සහනාධාර	-	912,230
	7,656,271	19,573,999

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන
2022 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

	2022 (රු.)	2021 (රු.)
17.2 වෙනත් ගෙවීම්		
සාමාන්‍ය තැන්පතු	220,454,440	220,410,000
රඳවා ගැනීමේ මුදල් තැන්පතු	32,739,613	36,609,795
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිල අසුරුම්කරු	7,985,021	3,321,121
කාර්යමණ්ඩලයේ ණය හිමියන්	6,327,395	4,092,127
හිඟ - හරිත තේ තැන්පතු	92,245,738	8,935,370
Cusdec තැන්පතුව	161,400	161,400
රඳවා ගැනීමේ දිරි දීමනා - විකුණුම් කවුන්ටරය	93,985	18,532
ගෙවිය යුතු වැට් බදු	3,288,923	1,917,595
	363,296,515	275,465,939
17.3 කල් ඇතිව ලැබීම්		
නුවරඑළිය - විකුණුම් මධ්‍යස්ථානය	1,620,000	1,620,000
වෙළඳ ප්‍රදර්ශනය	24,275,448	18,600,000
බලපත්‍ර ගාස්තු	7,920,100	7,697,000
ප්‍රතික්ෂේපිත තේ	887,500	915,000
ගබඩාව අලුත් කිරීම	1,280,000	1,990,000
නිෂ්පාදන තැරැව්කරුවන් සඳහා බලපත්‍ර ගාස්තුව	1,250,000	1,750,000
තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම	225,000	150,000
තේ අපනයනකරුවන් අලුත් කිරීම	32,057,500	36,250,000
තේ ඇසුරුම්කරුවන් අලුත් කිරීම	2,255,000	2,560,000
තේ ගබඩාව ලියාපදිංචි කිරීම	135,000	75,000
අපනයනකරුවන් ලියාපදිංචි කිරීම	250,000	150,000
දේශීය ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම	20,000	70,000
තේ ආනයනකරුවන් අලුත් කිරීම	395,000	440,000
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යමණ්ඩලය සඳහා වෛද්‍ය තැන්පතු	910,600	711,200
කල් ඇතිව ලැබීම් (තේ කර්මාන්තශාලා ලියාපදිංචිය, අලුත් කිරීම)	1,695,000	1,375,000
කල් ඇතිව ලැබීම් (තේ ආනයනකරුවන් ලියාපදිංචිය)	-	10,000
කල් ඇතිව ලැබීම් (දේශීය ඇසුරුම්කරුවන් අලුත් කිරීම)	192,500	211,900
කල් ඇතිව ලැබීම් (ප්‍රවර්ධන සහ අලෙවි බද්ද)	46,694,389	40,553,780
විකුණුම් කවුන්ටරය - කුලී තැන්පතුව	960,000	1,680,000
තැන්පතු - BMF	345,742	345,743
	123,368,778	117,154,623
17.4 උපචිත වියදම්		
උපචිත වියදම්	25,098,260	12,266,405
උපචිත වියදම් - ප්‍රවර්ධන හා අලෙවි බද්ද	610,706,415	44,514,203
	635,804,675	56,780,608

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2022 (රු)	2021 (රු)
17.5 උපචිත වියදම්		
ගමන්	5,643,701	4,284,097
විගණන ගාස්තු	2,228,100	1,894,000
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා මුද්‍රණය කිරීම	1,051,670	139,332
ඉන්ධන සහ ලිහිසි තෙල්	664,385	307,910
වාර සඟරා සහ පුවත්පත්	247,550	21,590
නඩත්තු වියදම්	680,701	114,164
තැපැල් හා සන්නිවේදනය	780,965	607,514
විදුලිය සහ ජලය	1,080,078	755,492
කුලි සහ දේශීය බදු	150,000	55,000
සනීපාරක්ෂක සේවා	644,729	745,152
ආරක්ෂක සේවා	1,075,623	1,055,979
වෛද්‍ය ප්‍රතිලාභ	3,255,588	3,707,880
කොවිඩ් -19 වියදම්	-	2,005,234
අතිකාල සහ දෛනිකව ගෙවන වැටුප්	1,609,328	1,099,563
මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වගාකරුවන් සඳහා විසිරි ජල බිඳු පද්ධතිය	9,031,600	20,310,800
පෙව පොහොර ව්‍යාප්තිය සඳහා සහනාධාර ක්‍රමය	51,300,000	58,700,000
සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපනය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය	-	2,777,142
යාන්ත්‍රිකකරණය සමග නව වගාව සඳහා සහනාධාර ක්‍රමය	26,708,400	38,085,000
පුවත්පත් දැන්වීම් හා වෙළඳ දැන්වීම්	3,223,486	-
ආදර්ශ තේ වගා සහනාධාර යෝජනාක්‍රමය	21,154,461	30,876,857
GMP - නෙතමනය මීටර සහනාධාර යෝජනා ක්‍රමය	2,500,000	500,000
තේ තවාන් සංවර්ධන වියදම් සඳහා සහනාධාර	45,025,000	67,775,000
පොහොර T200 වැඩසටහන	-	2,921,700
අපනයනකරුවන්ගේ යන්ත්‍රෝපකරණ සංරචක සඳහා සහනාධාර යෝජනා ක්‍රමය	395,833	1,747,900
	178,451,198	240,487,306
18.ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා ලබා දී ඇති ණය ශේෂ		
ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා උත්සව ණය		
ඇල්කඩුව වැවිලි සමාගම		8,760,399
		8,760,399

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිඒවල්/ඩි/එස්ටල්වීබී/ 1/2022/07 මෙම අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 29 දින

SRI LANKA TEA BOARD SECRETARIAT

සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තක්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තක්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාංගණනය කළ මතය සඳහා පදනම

(අ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 132,903,015 ක් වූ පරිසනක උපකරණ , අස්පෘශ්‍ය වත්කම් , ජල උපාංග හා විදුලි උපකරණ , පුස්තකාල පොත් , සැරසිලි උපකරණ , රසායනාගාර උපකරණ , කාර්යාල උපකරණ , ලී බඩු හා සවිකිරීම් සහ යන්ත්‍ර හා උපකරණ තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආයෝජන ආදායම් සඳහා බදු වියදම හඳුනාගැනීමේදී රු. 10,493,150 ක පොලී අදායම් , බදු අදායමට ගෙන නොතිබුණු බැවින් බදු වියදම හා ගෙවියයුතු බදු වියදම් රු.2,518,356 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ලංකා බැංකු කොල්ලුපිටිය දෙවැනි ශාඛාවේ ගිණුම් අංක 1633709 දරන ගිණුමෙහි සහ ලංකා බැංකු බම්බලපිටිය ශාඛාවේ අංක 718391 දරන ගිණුමෙහි ගනුදෙනුකරුවන් විසින් සෘජුවම තැන්පත් කරන ලද පිළිවෙලින් රු. 2,602,782 ක හා රු. 4,900,294 ක මුදල් වෙනුවෙන් ආදායම් මූලාශ්‍රය හඳුනාගැනීමට නොහැකිව තිබුණු අතර , පසුගිය වර්ෂයන්හි ආදායම් මූලාශ්‍රය හඳුනා ගත නොහැකි වූ ආදායම් ප්‍රමාණය රු .4,326,882 ක් විය. මෙ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් රු. 11,829,958 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව රසායනාගාර ආදායම රු. 19,802,796 ක් වුවද, රසායනාගාරය විසින් ඉදිරිපත් කළ වාර්තා අනුව එම අගය රු. 38,577,200 ක් වූ බැවින් රු. 18,774,404 ක වෙනසක් නිරීක්ෂණය විය. රසායනාගාරය හා මූල්‍ය අංශය අතර රසායනාගාර ආදායම් සම්බන්ධයෙන් පවතින වෙනස ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වෙක්පත් නිකුත් කළ දිනය, එය වලංගු කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 06 කට වැඩි කාලයක් එනම් 2019 වර්ෂයේ සිට ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ, කොල්ලුපිටිය ලංකා බැංකුවේ අංක 78285018 දරන ජංගම ගිණුම් යටතේ වූ රු.1,078,533 ක වෙක්පත් සම්බන්ධයෙන් මු. රෙ 396 (ඇ) ප්‍රකාර ව කටයුතු කර නොතිබුණි.

(ඊ) 2023 පෙබරවාරි 6 සිට 10 දක්වා රුසියාවේ මොස්කව් නිදී පැවැත්වීමට නියමිත "Prodexpo 2023" ප්‍රදර්ශනයයෙහි වීසා සහ සංවිධාන කටයුතු සඳහා එරට තානාපති කාර්යාලයට ගෙවන ලද රු.10,437,332 ක ඉදිරියට කළ ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) "Prodexpo 2023" ප්‍රදර්ශනයට 2023 වර්ෂයේදී සහභාගී වන අපනයනකරුවන්ගෙන් අයකරගත් සියයට 50 ක වියදම් කොටස වූ රු. 11,771,399 ක් කලින් ලැබීම් ලෙස ගිණුම් නැබීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ගිණුමට බැර කර තිබුණි.

(ඌ) පසුගිය වර්ෂයන්හි ඉඩම් වටිනාකම් යටතේ ප්‍රාග්ධනීත කර තිබුණු රු 8,500,000 ක ගම්පොළ ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි ගිණුමට මාරු කර තිබුණු අතර, එම අගය මූල්‍ය ප්‍රකාශන තුළ වර්ෂයේ ගොඩනැගිලි මිලදී ගැනීම් වශයෙන් සටහන් කර තිබුණි.

(එ) කළුතර ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යනු ලබන රූඩ 1. පර්චස් 20 ක වර්ග ප්‍රමාණයක් වූ ඉඩම 2014 වර්ෂයේ සිට අවුරුදු 30 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් බස්නාහිර පළාත්, පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද අංක 4/10/37833 දරන ලිපියෙන් අමාත්‍ය අනුමැතිය කිමිවී තිබුණු බව දන්වා තිබුණද, මෙතෙක් බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි .

(ඒ) නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන කැලණි වැලි සමාගමෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් මගින් ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණු නමුත් පිරිවැය රු.148,013,695 ක ගොඩනැගිලි මණඩලය විසින් ඉදිකර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2022 සංශෝධිත වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිඛේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ආ) , (ඇ) සහ (ඈ) ඡේදයෙහි දැක්වෙන නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 වගන්තිය	ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නව ගොඩනැගිල්ලේ මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය සැපයීම, සවිකර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ රු.32,182,460 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විස්තරාත්මක ඇස්තමේන්තුවක් පිළියෙළ කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ තේ අලෙවිසැලෙහි ව්‍යාපාරික කටයුතු වසර 6 ක කාලයක් සඳහා රු. 8,162,296 ක බදු මුදලකට 2019 වර්ෂයේදී පුද්ගලික පාර්ශවයකට ගිවිසුමකින් පවරාදී දැනට ව්‍යාපාරික කටයුතු කරගෙන යමින් සිටියද , අදාළ පාර්ශවය සමF ගිවිසුමගත වීමෙදී එම ආයතනයේ ගෙවීමේ හැකියාව පිළිබZ මණ්ඩලය විසින් පරීක්ෂා කර නොතිබුණු බැවින් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නුවරඑළිය තේ අලෙවි සැලෙන් මණ්ඩලයට අයවිය යුතු රු. 986,253 ක බදු මුදල සමාලෝචිත වර්ෂය අවසාන දක්වා අය කරගෙන නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2022 දෙසැම්බර් 31 දිනට තේ කම්හල්හිමියන් විසින් තේ දළු සපයන්නන් වෙත ගෙවීම් සඳහා මණ්ඩලයේ තැන්පත් කර ඇති සහ සමාලෝචිත වර්ෂය අවසානය තෙක් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු තැන්පතු වටිනාකම රු.92,245,738 ක් වූ අතර ඉන් රු. 6,508,027 ක් වසර 10 ක් තරම් පැරණි තැම්පතු වී තිබුණි.

(ආ) තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර තේ අලෙවිකරණ හා ප්‍රචර්ධන අරමුදල වෙතින් රු.220,000,000 ක් 2018 ජූලි 03 වන දින මණ්ඩලය වෙත ලබාගෙන තිබුණද වසර දෙකකට

වැඩි කාලයක් එම මුදල් නිෂ්කාර්යව රඳවා ගෙන 2020 සැප්තැම්බර් 30 දින පුද්ගලික ආයතනයක් සමඟ පද්ධතිය ස්ථාපනය සඳහා ගිවිසුම්ගත වී තිබුණි.ඒ අනුව රු53,964,995 කට සමස්ත පද්ධතියම වසර දෙකයි මාස හයක කාලයකදී පමණ නිමකිරීමට සැලසුම් කළද 2023 අප්‍රේල් 30 දක්වා කාර්යය නිමකර නොතිබුණි.අධි ඇස්තැමේන්තුවක් මත මෙම මුදල් ලබාගැනීම් හේතුවෙන් රු.166,035,005 ක මුදලක් තවදුරටත් නිෂ්කාර්ය පැවතුන අතර එම අගය අනෙකුත් ගෙවියයුතු වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී රු.32,132,088 කට මිලදී ගන්නා ලද පළිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය (Liquid Chromatography Mass Spectrometer) අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණු අතර , මිලදී ගැනීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳ එවකට රසායනාගාරයට අනුයුක්තව සේවය කළ සහකාර අධ්‍යක්ෂකවරයාට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණය අවසන් කර 2022 සැප්තැම්බර් 22 දින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණද ,අධ්‍යක්ෂ මණ්ඩලය විසින් චෝදනා පත්‍රයේ සහ විධිමත් විනය පරීක්ෂණයේ නිගමනයන්ගේ සාධාරණ හා අපක්ෂපාති බව තහවුරු කර ගැනීම සඳහා නැවතත් ස්වාධීන නිලධාරියෙකු පත් කර තිබුණු බැවින් අවශH විනය ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා නොහැකි වී තිබුණද චෝදනා ලත් සහකාර අධH්ෂකවරයා සමාලෝචිත වර්ෂය අවසානයේ විශ්‍රාම ගොස් තිබුණු අතර මණ්ඩලය විසින් රු.1,559,775 ක පරිතෝෂික මුදල ද නිලධාරියා වෙත ගෙවීම් කර තිබුණි.විනය පරීක්ෂණ සඳහා රු. 205,454 ක මුදලක්ද මණ්ඩලය විසින් වියදම් කර තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2003 සැප්තැම්බර් 19 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදුන් රු.25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "Ceylon Tea Museum" හි අයිතිය තේ මණ්ඩලයට පැවරීමට 2012 ජූනි 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව තීරණය වී තිබුණු නමුත්, වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වුවද මේ දක්වා මෙම ක්‍රියාවලිය අවසන් කර Ceylon Tea Museum හි අයිතිය පවරාගෙන නොතිබුණු අතර, ණය මුදල් ආපසු ලබාගැනීමටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2020 පෙබරවාරි 27 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුයායේ කම්කරු වැටුප් ගෙවීම සඳහා තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට නැවතත් රු. 10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු 1,000,000 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඉ) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් දැරූ රු. 317,232 ක් සහ සී /ස කළුබෙව්විටියාන තේ කර්මාන්තශාලා සමාගමේ නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් දැරූ රු.79,200 ක් වර්ෂ 03 සිට වර්ෂ 04 ක කාලයක සිට, ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2017 වර්ෂයේදී ගෝලීය තේ සංග්‍රහය වෙනුවෙන් විදේශ තානාපති කාර්යාල වෙත ලබා දුන් රු. 51,604,457 ක මුදලින් රටවල් 15 කින් ඉතිරි වූ රු. 918,679 ක මුදල සහ චීනය, එක්සත් රාජධානිය, සහ මොස්කව් යන රටවල තානාපති කාර්යාලවලින් ලැබිය යුතු රු.868,578 ක මුදල අදාළ තානාපති කාර්යාලවලින් ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණු නමුත්, විගණන දින වන විටත් එම අමාත්‍යාංශයෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2019 වර්ෂයේදී ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කම්කරුවන්ට දීපාවලී උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා රු. 8,760,400 ක ණය මුදලක් ඇල්කඩුව වැවිලි සමාගම වෙත මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අරමුදලින් ගෙවා තිබුණු අතර මෙම අත්තිකාරම් මුදල ගෙවා වසර 03ක් ඉක්මවා ගියද 2022 දෙසැම්බර් 31 දින දක්වා එම ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඌ) ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (Preferential Tariff Rate Quota) පැවතියද, එහි සැලකිය යුතු උපයෝජනයක් වාර්තා කිරීමට 2022 වර්ෂයේදීද හැකි වී නොතිබුණු අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉන්දියාවට සහ පාකිස්ථානයට සිදුකළ මුළු අපනයන ප්‍රමාණය පසුගිය වර්ෂය හා සැසඳීමේදී පිළිවෙලින් සියයට 32 කින් හා සියයට සියයකින් ද පහළ ගොස් තිබුණි.

(එ) ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනයද අපනයනයද ක්‍රමිකව වර්ධනය නොවීම හේතුවෙන් 2011 වර්ෂයේදි ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සියයට 18 ක් වූවද, සමාලෝචිත වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස සියයට 3.88 ක් දක්වා පහළ ගොස් තිබුණු බව අන්තර්ජාතික තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplementary to International Tea Committee News Bulletin) අනුව නිරීක්ෂණය විය.

(ඒ) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය 335 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 246 ක් විය. ඒ අනුව ඉහළ කළමනාකරණ මට්ටමට අයත් වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු 03 ක් (වර්ෂ 03 සිට

මාස 06 ත් අතර) ඇතුළුව පුරප්පාඩු වූ තනතුරු 89 ක් වූ අතර ඒවා පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඔ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නව ගොඩනැගිල්ලේ මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය සැපයීම, සවිකර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් 2021 සහ 2022 වර්ෂයන්හි පිළිවෙලින් රු.13,462,663ක් සහ රු.10,684,706ක් ගෙවීම් කර තිබුණද එම කාර්යය සඳහා අදාළ වර්ෂයන්හි අයවැය ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු බැවින් විධිමත් අයවැය පාලනයක් සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඕ) තේ මණ්ඩලය විසින් පවත්වා ගෙන යන ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදල මඟින් සිදුකරන ලද ප්‍රේෂණයන් විශ්ලේෂණයේදී මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත මෙම අරමුදල විසින් ලබා දී ඇති රු.1,055,625,000 ක ණය මුදල් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ක) 2022 වාර්ෂික සැලැස්ම අනුව විදේශීය වෙළඳ ප්‍රදර්ශන 34 ක් සඳහා සහභාගී වීමට සැලසුම් කර රු.200,000,000 ක් අයවැය ලේඛනයෙන් වෙන්කර තිබුණු අතර වර්ෂය තුළදී වෙළඳ ප්‍රදර්ශන 25 ක් සඳහා සහභාගී වීම වෙනුවෙන් රු.104,201,553 ක් වියදම් කර තිබුණි. මණ්ඩලය විසින් තෝරාගන්නා ලද අපනයනකරුවන් සඳහා විදේශ වෙළඳ සල්පිල් වලට සහභාගී වීමට අවස්ථාව හා සහනාධාර ලබා දීමෙන් පසුව, එම වෙළඳ ප්‍රදර්ශනයේ ප්‍රගතිය පිළිබඳව පසු විපරමක් සිදු නොවීම හා වෙළඳ ප්‍රදර්ශනයෙන් අනතුරුව අපනයනකරුවන්ගේ ප්‍රගතිය ඇගයීම සඳහා ඇගයීම් පත්‍රිකා (Evaluation Form) ලබාදී, ලැබුණු ඇණවුම් හා එහි වටිනාකම් පිළිබඳ දත්ත ලබා ගත්තද, අදාළ අපනයන කරුවන්ගේ සත්‍ය අපනයන වර්ධනය පිළිබඳව ඇගයීමක් සිදු නොවීම තුළින් අපනයනකරුවන් හට ලබාදුන් සහනාධාර මුදල් ඵලදායී ආකාරයට යෙදවූයේද යන්න පිළිබඳ ප්‍රමාණවත් ඇගයීමක් සිදු වී නිබුණු බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ග) 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස් " නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානය ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කිරීම හා ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මණ්ඩලයට සිදු වූ රු.62,603,006 ක අලාභය කපා හැර තිබුණි. මේ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 06 දිනැති ලිපිය මඟින් අපරීක්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සභාපති වෙත දන්වා තිබුණද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විනය ක්‍රියාමාර්ග ගැනීම නුසුදුසු බව තීරණය කර තිබුණු බැවින් අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන්ට විරුද්ධව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ජ) 1957 අංක 51 දරන තේ පාලන පනත යටතේ තේ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම, තේ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම ඇතුළු නියාමනය කිරීමේ කටයුතු මණ්ඩලයේ පාලනය යටතේ සිදුවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්තශාලා 76 ක් විසින් අනුමත ධාරිතාවයට වඩා තේ කි.ග්‍රෑ 11,630,711 ක් නිෂ්පාදනය කර තිබුණි.

ඩබ්ලිව්.පී .සී . වික්‍රමරත්න

විගණකාධිපති

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
තැ.පෙ. 1750, කොළඹ ශ්‍රී ලංකාව
දුක: 011 2582121 / 011 2583687

ක්ෂණික ඇමතුම්: 011 2587814
ෆැක්ස්: 011 2582122

විද්‍යුත් තැපෑල: teaboard@pureceylonte.com
වෙබ් අඩවිය: www.pureceylontea.com
වෙබ් අඩවියට www.pureceylontea.com

සභාපති

දුක: 011 2587814 / 2590968
ෆැක්ස්: 011 2585701
විද්‍යුත් තැපෑලට chairman@pureceylontea.com

අධ්‍යක්ෂ ජනරාල

දුක: 011 2587814 / 2508991
ෆැක්ස්: 011 2582122
විද්‍යුත් තැපෑල: dgsltb@pureceylontea.com

තේ කොමසාරිස් අංශය

තේ කොමසාරිස්
දුක: 0112580182/2580152 2502485/2584845/2587814 /2587773
ෆැක්ස්: 011 2580161
විද්‍යුත් තැපෑලට tcd@pureceylontea.com

තේ ප්‍රවර්ධන අංශය

අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන)
දුක: 0112583343/2587814/2581418/2580169
ෆැක්ස්: 011 2587341
විද්‍යුත් තැපෑල: promotion@pureceylontea.com

තේ අපනයන අංශය

නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන)
දුක: 011 2502485/2584845/2587814/2504090/2587773
ෆැක්ස්: 011 2584844
විද්‍යුත් තැපෑලට exports@pureceylontea.com

විශ්ලේෂණ රසායනාගාරය

අධ්‍යක්ෂ (රසායනාගාර)
දුක: 011 2587814/2581576
ෆැක්ස්: 011 2581576
විද්‍යුත් තැපෑලට lab@pureceylontea.com

ප්‍රාදේශීය කාර්යාල

බදුරලිය

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
281, වතුරන පාර, බදුරලිය
දුක. / ෆැක්ස් : 034-2247444
විද්‍යුත් තැපෑල: atcmathugama@pureceylontea.com

බණ්ඩාරවෙල

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
විශාඛා මාවත, නව බදුල්ල පාර, බණ්ඩාරවෙල
දුක. / ෆැක්ස් 057-2222812
විද්‍යුත් තැපෑල: atcbandarawela@pureceylontea.com

ගාල්ල

ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
59/A, ඉහල ඩික්සන් පාර, ගාල්ල
දුක. / ෆැක්ස් 091-2232052
විද්‍යුත් තැපෑල : atcgalle@pureceylontea.com

ගම්පොල

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
140, අඹගමුව පාර,ගම්පොල
දුක./ෆැක්ස්: 081-2352279
විද්‍යුත් තැපෑල: atcgampola@pureceylontea.com

මාතර

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
23, අලුත් මාවත
උයන්වත්ත, මාතර
දුක. / ෆැක්ස් : 041-2222636
විද්‍යුත් තැපෑල : atcmatara@pureceylontea.com

නුවර එළිය

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
10 කැඟල්ල නානුඔය පාර නුවර එළිය
දුක./ෆැක්ස්: 0522234658
විද්‍යුත් තැපෑල :atcnuwaraeliya@pureceylonea.com

රත්නපුර

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
611, නව නගරය, රත්නපුර
දුක./ෆැක්ස්: 045-2222136
විද්‍යුත් තැපෑල: atcrathnapura@pureceylontea.com

විදේශීය ශාඛා

රුසියාව

3 වන ලේකම් (ප්‍රවර්ධන නිලධාරී)
සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තානාපති කාර්යාලය
24, ස්වෙප්කින විදිය, මොස්කව් 129090, රුසියාව
දුක: 007 495-688-1620
495-68811651 / 495-688-1463
ෆැක්ස්: 007-495-688-1757
විද්‍යුත් තැපෑල: tea@srilankaembassy.ru

චීනය

3 වන ලේකම් (තේ ප්‍රවර්ධන)
සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා තානාපති කාර්යාලය,
අංක:3, ලාන් හුවා ලු, බීජිං - 100600,
මහජන චීන සමුහාණ්ඩුව
දුක: 00-86-10-65322919
ෆැක්ස්: 00-86-10-65325426
විද්‍යුත් තැපෑල: ceylontea@slemb.com

එක්සත් අරාබි එමීර් රාජ්‍යය

අමාත්‍ය (තේ ප්‍රවර්ධන) - මැද පෙරදිග/ගල්ෆ් /උතුරු ඇමරිකා
සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සාල් ජනරාල් කාර්යාලය
තැ.පෙ: 51528, ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය
දුක. : 00971 4 3987871
දුක. : (සෘජු) : 00971 4 3989349
ෆැක්ස් : 00971 4 3987872
විද්‍යුත් තැපෑල : ctbureau@emirates.net.ae
ceylonteadubai@gmail.com
ceylonte@eim.ae



ශ්‍රී ලංකා තේ මණ්ඩලය
නො. 574, **ගාලු පාර**,
කොළඹ 03,
ශ්‍රී ලංකාව.

දුරකථන අංකය: +94 11 2587814
ෆැක්ස් අංකය: 94 11 2587341
විද්‍යුත් ලිපිනය: teaboard@pureceylontea.com
වෙබ් අඩවිය: www.srilankateaboard.lk